## 2020/07/13 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාවෂ

2020/07/13 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 17. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 18. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 20. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 21. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

### 01. ආගම සිහි කිරීම

2020.07.13 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සියලු දෙනාටම සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරනවා. අද දින සභාවාරයට පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුලු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා පිළිගන්නවා. විශේෂයෙන්ම මේ කොරොනා වෛරසය නිසා අද දිනත් සභාව මෙහෙය වන්න වෙලා තියෙන්නෙ. දුරස්ථ භාවය රැක ගෙන සහ සෞඛ්‍ය නීති රීති පිළිපැදගෙන. මොකද කොරෝනා දෙවෙනි රැල්ලක් මතුවීගෙන එන බව ඔබතුමන්ලා දන්නවා. ඒ නිසා ඒ පිළිබදව අපි බොහොම අවදානයෙන් ඉන්න ඕන. අපේ නියමිත සභාවාරය තියෙන්නෙ 14 වෙනිදට. නමුත් ඊට කලින් අද 13 වෙනිදා යොදා ගන්න සිද්ද වුනේ. හෙට දින පාර්ලිමේන්තු මැතිවරණයේ තැපැල් ඡන්ද විමසන අවස්ථාව. ඒ නිසා එයට ඉඩක් ලබා දීමට අවශ්‍ය නිසා. දවසකට කලින් සභා වාරය පවත්වන්න අපි යෝජනා කර ගත්තා. ඒ අනුව උප සභාපතිතුමා ඇතුලු මේවනවිට පැමිණ සිටින මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ඉතාම ගෞරවයෙන් පිළි ගන්නවා. ඒ වගේම මම ඔබතුමාලගෙන් ඉල්ලා සිටිනවා. අද දිනත් අපට වෙනද වගේ කාලය වැය කරමින් කටයුතු කරන්න සුදුසු වාතාවරණයක් නැති නිසා, ඉක්මනින් අපේ සභාවාරය නිම කරන්නත්, සෞඛ්‍ය නීති රීති පිළිපැදගෙන සභාව මෙහෙය වන්නත්, මට උදවු වෙන්න කියලා, සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා .

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත.

**(අ)02. 2020.06.09 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2020.06.09 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු **මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. නිල සෙවණ කාර්යාලය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් 2020.06.29 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. මාගේ ඉඩම සඳහා සිදු වී ඇති හානිය සම්බන්ධවයි, යනුවෙන් ඩී.එස්. සමන්ත, 30 කොටස, හෝමදොළ , උඩුගම විසින් 2020.06.03 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

03. සිළිංඩර් ලබා ගැනීම සම්බන්ධව 219 ඩී අලුත්වත්ත ග්‍රාම සේවා වසමට අයත් 18 කණුව වීන ගම්මානය අසළ පළමු පටුමගෙහි පදිංචි ප්‍රදේශවාසීන් විසින් යොමු කරන ලද අත්සන් ලේඛනය සහිත ලිපිය සභාගත කරන ලදී.

04. තල්ගස්වල පොදු වෙළඳසැලේ කඩකාමරවල වහල ප්‍රතිසංස්කරණය කර ගැනීමට ඉල්ලීමයි යනුවෙන් තල්ගස්වල පොදු වෙළඳ සැලේ කඩ කාමර බදු හිමියන් විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

05. කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කඩ කාමර කුලී නිදහස් කර ගැනීම සම්බන්ධව තල්ගස්වල පොදු වෙළඳ සැලේ කඩ කාමර බදු හිමියන් විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

06.ස්කවේටරය යොදා නෙළුඇල, මූකලාන මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ලබා ගැනීම සඳහා, විලේගේ චානක සංජීව , උඩුගම, නො.02, හෝමදොල විසින් යොමු කරන ලද ලිපිය සභාගතකරන ලදී.

07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා අසනීප තත්වයෙන් පසුවන බැවින් ජූලි මස මහා සභා රැස්වීමට සහභාගිවීම නොහැකි බව දන්වමින්, නිවාඩු අනුමත කර දෙන මෙන් ඉල්ලා 2020.07.13 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**ගරු මන්ත්‍රී පී ජී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න**

1. පුරං කුඹුරු සම්බන්ධව අදාල අයාලයේ යන ගවයන් සම්බන්ධව කර ඇති යෝජනාවට ගත් ක්‍රියාමාර්ග කුමක්ද ?
   ගව හිමියන් දැනුවත් කිරීම සඳහා පසුගිය දිනවල බල ප්‍රදේශයේ ප්‍රචාරණ කටයුතු සිදු කරන ලද බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
2. එම ගව හිමියන් කැඳවා ඔවුන් දැනුවත් කලාද?
   ගව හිමියන් කැඳවීමක් සිදු නොකල බවත්, ඉදිරියේදී ගව හිමියන් කැඳවා දැනුවත් කිරීමට අදාළ කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

01. නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් බදු දී ඇති කඩ කාමර අදාළ බදුකරුවන්ගේ ඉල්ලීම මත චක්‍රලේඛ අංක දපපා/පපාකො/2010/1 ප්‍රකාරව වෙනත් පාර්ශවකරුවෙකු වෙත බදු අයිතිය පවරා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු උපසභාපතිතුමා කියා සිටියේ, මෙමගින් අදාල දෙපාර්ශවය අතර අයතා ගනුදෙනුවක් සිදුවන බැවින් තමා විරුද්ධ බවත් බදුකරුට කරගෙන යාමට නොහැකිනම්, ගිවිසුම අවලංගු කොට නැවත සභාවට පවරාගෙන වෙනත් අයෙකුට ලබා දීම සුදුසු බවයි. ඒ වගේම පැරණි බදු කරුගෙන් ඔහු ඉවත්වන බවට නීත්‍යානුකූල ලියවිල්ලක් ලබා ගන්නා ලෙසත්, එසේම මෙය අවස්ථාවක් කරගෙන තියෙන ප්‍රශ්න ටික විසඳගන්න හොඳම අවස්ථාව බව පෙන්වා දුන් අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා කියා සිටියේ ද ගිවිසුම අවලංගු කොට දැනට ක්‍රියාත්මක වෙන ආකාරයට වෙනත් අයෙකුට පවරාදීම සුදුසු බවයි. එසේම ඔබගේ ඉල්ලීම සලකා බැලීම සඳහා හිග මුදල් ගෙවා අවසන් කර ඉල්ලීම කරන ලෙස අදාල බදු කරුවන්ට දන්වන ලෙසද කියා සිටියේය.

ගරු සභාපතිතුමා විසින් අදාල යෝජනාව පිළිබඳ පෙන්වා දුන් කරුණු සලකා බලා ඒ අනුව සාකච්ඡා කර කටයුතු කිරීමට තීරණය කරනලදී

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව සභා සම්මත නොවුනු අතර, මේ පිළිබඳව සාකච්ඡා කර තීරණයකට එළඹීමට තීරණය විය.**

02. කොවිඩ් 19 වසංගත තත්වය පාලනය කිරීමට කටයුතු කල කාලයට අදාළව බදු දී ඇති කඩ කාමර සහ සතිපොළවල් වල බදු මුදල් කපා හැර ගිණුම්වලින් අත්හැරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

03. 2020 වර්ෂය වෙනුවෙන් පෙර පාසල් දරුවන් සඳහා ලබා ගත් පෙර පාසල් නිල ඇඳුම් කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පෙර පාසල් වසා දැමීම නිසා බෙදා දීමට නොහැකි විය. එබැවින් එම ඇඳුම් තොගය 2021 වර්ෂය සඳහා පෙර පාසල්වලට ඇතුලත් කරන දරුවන්ට බෙදා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

04. කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් සියළුම පෙර පාසල් වසා දමන ලද අතර අප ආයතනයේ කොන්ත්‍රාත් පදනම මත ගුරුවරුන් සේවය කරන පෙර පාසල් තුනෙහි පාලිකාවන් සඳහා ජුනි, ජූලි සහ අගෝස්තු මස මුල් දින 10 සඳහා ඔවුනට ලබා දෙන රු. 10000.00 ක මාසික දීමනාව පෙර පරිදිම සභා අරමුදලින් ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

05. උඩුගම පුරනැගුම ගොඩනැගිල්ලේ වේදිකා තිරය සවි කිරීමටත්, ඉදිරිපස බිත්තිවල තීන්ත ආලේප කිරීමටත්, සිවිලිම අළුත්වැඩියා කිරීමටත් යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

06. ප්‍රධාන කාර්යාලයේ ළිඳ වටේ අඩි 1 ½ ක පමණ බැම්මක් ඉදිකිරීම සහ ප්‍රධාන කාර්යාලයේ පිටුපස වහලයේ තීන්ත පිළිසකර කිරීම හා තණකොළ කපන මැෂින් අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

07. මාපලගම, නාගොඩ, උඩුගම පුස්තකාල තුනෙහි සහ ආයුර්වේද බෙහෙත් ශාලාවෙහිත්, ප්‍රධාන කාර්යාලයේත් මේස රෙදි නොමැති මේස සඳහා මේස රෙදි ලබාදීමට අවශ්‍ය රෙදි සභා අරමුදලින් මිළදී ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

08. උඩුගම ගමගොඩ කනත්තගොඩ මාර්ගයේ ගිලා බැස ඇති ස්ථානය අළුත්වැඩියා කිරීම සඳහා යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**09.** ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම

අංක **01** සිට **42** දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.

**2020.07.13 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.** ලංකා විදුලිබල මණ්ඩලය

**2020** ජුනි මස විදුලි බිල්පත්

| | | |
|---|---|---|
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 240.00 |
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 240.00 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු.7460.60 |
| 8617046104 | - උඩුගම බහුකාර්‍ය මධ්‍යස්ථානය | - රු. 496.20 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1374.60 |
| 4509082908 | - උක්ඹිවිට පෙර පාසල | - රු. 240.00 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 697.50 |

**2020** මැයි මස විදුලි බිල්පත්

| | | |
|---|---|---|
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 532.80 |
| 4501090200 | - මාපලගම වෙළඳ සංකීර්ණ කොරිඩෝව | - රු. 256.30 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 276.60 |

**02.** ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය

| | | |
|---|---|---|
| 33/53/003/008/11 | - උඩුගම උප කාර්යාලය (2020.05.22 – 2020.06.21) | -රු. 306.90 |
| 33/53/003/009/10 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2020.05.22- 2020.06.21) | -රු. 674.78 |

**03.** ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සි

දුරකථන බිල්පත් ගෙවීම (2020.05.01 - 2020.05.31)

| | | | |
|---|---|---|---|
| i. | 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු. 4465.30 |
| ii. | 0912231201 | - සභාපතිතුමාගේ නිවස | - රු. 3186.87 |
| iii. | 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 422.98 |

ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සි

දුරකථන බිල්පත් ගෙවීම (2020.06.01 - 2020.06.31)

| | | | |
|---|---|---|---|
| i. | 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු. 5136.19 |
| ii. | 0912296537 | - සභාපති නිල කාමරයේ දුරකථන බිල්පත පියවීම | - රු. 3227.58 |

iii. 0912296577 - මාපලගම උප කාර්යාලය - රු. 422.98
iv. 0912231201 - සභාපතිතුමාගේ නිවස - රු. 4390.42

**04. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**
උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම 091-5701722
(2020.05.16- 2020.06.15) - රු. 613.01

**05. මොබිටෙල් පුද්ගලික සමාගම**
පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2020.06.25) - රු. 61.30

**06 .2020 ජුනි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 4730.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**07. 2020 ජූලි මස ගමන් වියදම්**
**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| එන්.එච්.ඩී. නිරෝෂනී | - කළමනාකරණ සහකාර | - රු. 876.00 |

**2020 ජුනි මස ගමන් වියදම්**
**ආයතනයේ රාජකාරි ගමන්වල නියැලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු. 2000.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | - රු. 940.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 2100.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 950.00 |
| යූ.වී මධුර ප්‍රභාත් මයා | - කා.කා.ස. | - රු. 480.00 |

**08. අතිකාල දීමනා ගෙවීම්**
**2020 ජුනි මස**

| | | |
|---|---|---|
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 9046.40 |
| බී.ජී.පියතිලක මයා | - රියදුරු | - රු. 3698.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 7756.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 7366.44 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 5657.68 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 5956.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 4862.44 |
| එම්.ඩබ්.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 1052.00 |

ඩී සමන් ප්‍රදීප් මයා - සෞඛ්‍ය කම්කරු - රු. 1249.50
චමිත් නිශාන්ත මයා - වැඩ/ක්ෂේත්‍ර කම්කරු - රු. 1210.00

**09. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2020 ජුනි මස ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු. 78000.00
ii. කොවිඩ් 19 වසංගත තත්වය යටතේ ජනතාවට සහන ලබාදීමට ලබා ගත් ලක්ෂ 05ක මුදල පියවීම - රු.500000.00

**10. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2020 ජුනි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 571ක් - රු. 59384.00
252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 220 ක් - රු. 22880.00
LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 65 ක් - රු. 6760.00
RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 160 ක් - රු. 16640.00
DS 40 Oil ලීටර් 03 - රු. 1620.00

**එකතුව** **- <u>රු.107284.00</u>**

**11. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සංස්ථාව, මහරගම**

මාපලගම ආයුර්වේදයට බෙහෙත් ලබා ගැනීමේ බිල්පත - රු. 11890.00

**12.නීතිඥ හේමන්ත පී.ඩබ්.විතාරණ මයා, ගාල්ල**

2020.05.15 දින පැවති එල් 16242දරණ නඩුව වෙනුවෙන් නීතිඥ හා පෙනී සිටීමේ ගාස්තු- රු. 3000.00
2020.05.13 දින පැවති පී 15977 දරණ නඩුව වෙනුවෙන් නීතිඥ හා පෙනී සිටීමේ ගාස්තු- රු. 3000.00
2020.01.17 දින පැවති එම්.343 දරණ නඩුව වෙනුවෙන් නීතිඥ, අධි නීතිඥ, පෙනී සිටීමේ ගාස්තු, ලේඛන සකස් කිරීමේ ගාස්තු - රු. 24000.00

**13. කුමාර ඉලෙක්ට්‍රිකල්ස් ඇන්ඩ් සවුන්ඩ්, නාගොඩ**

පෙර පාසල් ගුරුවරුන් සඳහා පවත්වන ලද යෝග පුහුණු වැඩසටහන සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර ලබා ගැනීමේ බිල්පත - රු. 1000.00

**14. කේ.ටී.ආර්.ජී. උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ**

i. PF 7360 කැබ් රථය අළුත්වැඩියා කිරීමේ ගාස්තු - රු. 4110.00
ii. LL 7650 කෘ කැබ් රථය අළුත්වැඩියා කිරීමේ වියදම් - රු. 3625.00

**15. ආසිරි ටයර් ට්‍රේඩර්ස්, මාපලගම**

RA 8569 ට්‍රැක්ටරය සඳහා ජියර් ඔයිල් මිලදී ගැනීමේ බිල්පත - රු. 5058.00

**16. රෙජිස්ට්‍රාර් ජනරාල්, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය, තංගල්ල**

මුද්දර ගාස්තු ගෙවීම - රු. 100.00

**17. උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම**

i. 252-6478 කැබ් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 4800.00
ii. RA 8569 ට්‍රේලරයේ වැසියේ දිරාගිය කොටස් අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 5800.00
iii. RA 8569 ට්‍රැක්ටරයේ අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 4950.00

**18. ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 ජුනි - රු. 5030.00

**19. ඒ.ඩී.කරුණාරත්න මයා, නාගොඩ**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 ජුනි - රු. 5840.00

**20. බී.ජේ.කරුණාරත්න මයා, මාපලගම**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 මාර්තු - රු. 3430.00

**21. එම්.ඒ.සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 දෙසැම්බර් - රු. 2670.00
2020 ජනවාරි - රු. 2580.00
2020 පෙබරවාරි - රු. 2360.00
2020 මාර්තු - රු. 1340.00

**22.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 ජූලි මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු27500.00
ii. 2020 ජුනි මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2625.00

**23. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා ජූලි මස මාසික කුලීය ගෙවීම - රු. 5000.00

**24. ජයසුන්දර හාඩ්වෙයාර්,උඩුගම**

උඩුගම මහජන පුස්තකාලයේ නව පරිගණකය සවිකිරීම සඳහා අවශ්‍ය උපාංග මිළදී ගැනීමේ බිල්පත - රු. 990.00

**25. විගණකාධිපති, විගණන කාර්යාලය**

හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10008.00

**26. එම්.ජේ.ජනිත් ඉරේෂ් කුමාරගේ, වදුරඹ**

ප්‍රාදේශීය සභාවේ 2020.06.09 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත- රු. 5800.00

**27.** **චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල**

ප්‍රධාන කාර්යාලයේ රියදුරු විවේකාගාරය සකස් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම - රු. 2880.00

ප්‍රධාන කාර්යාලයේ රියදුරු විවේකාගාරය සකස් කිරීමේදී ග්‍රයින්ඩින් තලයක් ලබා ගැනීම-රු. 475.00

**28.** **සී/ස බද්දේගම බටහිර ප්‍රාදේශීය සංවර්ධන සමිතිය, බද්දේගම**

උඩුගම නැගෙනහිර ජනසවිය ගම්මානයේ ප්‍රවිශ්ඨ මාර්ගය සඳහා හියුම් පයිප්ප ලබා ගැනීමේ බිල්පත - රු.11700.00

**29.** **දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**

i. ගබඩාවේ ඇති තණකොල කපන යන්ත්‍ර සඳහා භාන්ඩ මිළදී ගැනීමේ බිල්පත - රු. 1025.00

ii. අඩුගම මහජන පුස්තකාලයේ ඉදිරිපස දොරෙහි යතුරු තහඩුව අලුතින් දැමීමේ බිල්පත - රු. 680.00

**30.** **එස්.බී.ප්‍රින්ටර්ස්, මීගමුව**

නාගොඩ , මාපලගම, උඩුගම මහජන පුස්තකාල තුන සඳහා ලිපිද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත - රු. 5300.00

**31.** **යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2020 ජුනි) - රු.13000.00

**32.** **ලංකා ටෙක්නොලජී ඇප්ලියන්ස් ප්‍රයිවට් ලිමිටඩ්, ගාල්ල**

ප්‍රධාන කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රය සඳහා ටෝනර් මිළදී ගැනීමේ බිල්පත - රු.25963.20

**33.** **නානායක්කාර හාඩ් වෙයාර්, නාගොඩ**

ප්‍රධාන කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත - රු. 2560.00

**34.** **එම්.එච්.සන්ධ්‍යා මිය, ඌරල**

පෙර පාසල් ගුරුවරුන් සඳහා පවත්වන ලද යෝග පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූ අය සඳහා කොළ කැඳ ලබා දීම වෙනුවෙන් මුදල් ගෙවීම් - රු. 1000.00

**35.** **ගෙස්ටේට්නර් සිලෝන් ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ**

ඡායා පිටපත් යන්ත්‍රෙය් ටෝනර් මිළට ගැනීමේ බිල්පත පියවීම - රු.15768.00

**36.** **ආර්.පී.කේ.අබේසිංහ මයා, යටලමත්ත**

රියදුරු විවෙක කාමරය සැකසීමේදී නිල්මිය දෙදරුම් යන්ත්‍රයට කුලී ගෙවීම - රු. 500.00

**37.දසමස් වැටුප් අත්තිකාරම්**

i. අනුර දිසානායක මයා රු.250000.00

ii. ශ්‍රියානි කිරින්දගේ මිය රු.249650.00

**38.** **විජයසිරි ගිෆ්ට් සෙන්ටර්, යටලමත්ත**

විදුලි කේතලය මිළදී ගැනීමේ බිල්පත - රු. 2090.00

**39. කේ.බී.අමල් ප්‍රසාද් මයා, තල්ගස්වල**
2018 වර්ෂය සඳහා තල්ගස්වල බදාදා සති පොළ ටෙන්ඩර් කිරීමට අදාළ තැන්පතු මුදල, 2017 වර්ෂයේ තල්ගස්වල සති පොළෙහි හිඟ බදු මුදල සඳහා හිලව් කිරීම - රු.15000.00

**40. යූ.ජී.ශ්‍රීමාල් සුරංග මයා,උඩලමත්ත**
ස්කැවේටර් යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.4000.00
(ගවයෙකු වල දැමීම සඳහා )

**41. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**
තාක්ෂණ කමිටු නිළධාරීන් සඳහා දීමනා ගෙවිම - රු.3500.00

**42. විලේගේ චානක සංජීව,**
ස්කවේටරය යොදා ගෙන නෙළුඇල මූකලාන මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 12400.00

ඉදිරි ගෙවීම් වාර්තාවේ 09 (ii) යටතේ සඳහන් කොරෝනා අවස්ථාවේ. ජනතාවට බඩු බෙදාදීමේ විධිමත් භාවය සහ ක්‍රමවේදය පිළිබඳව අපට පැහැදිලි නැහැ. පැහැදිලි කිරීමක් කරන්න. නැත්නම් අපි විරුද්දයි. යනුවෙන් ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ප්‍රකාශ කරන ලදී.

ඉදිරි ගෙවීම් වාර්තාවේ 09 (ii) යටතේ සඳහන් කොරෝනා අවස්ථාවේ. ජනතාවට බඩු බෙදාදීම සම්බන්ධව අනුගමනය කරන ලද ක්‍රමවේදයේ වරදක් හා විනිවිධ භාවයකින් තොරව කටයුතු කර ඇති බැවින් තමන්ද විරුද්ධ වන බව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාද ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා, ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා, උද්ගතවූ තත්වය හා ජනතාවට සහන සැලසීම සම්බන්දව දීර්ඝ ලෙස කරුණු පැහැදිලි කරන ලදී.

පෙ.ව. 11.35 ට විනාඩි පහක කාලයක් සඳහා සභාව කල් තබන ලදී.

පෙ.ව. 11.40 ට නැවතත් සභාව ආරම්භ කරන ලදී.

නැවත සභාව ආරම්භ වීමෙන් පසු ගරු සභාපතිතුමා විසින් ඔබතුමා විරෝධය දක්වන්නෙ. මේ ව්‍යසන අවස්ථාවේ ජනතාවට සහන සැලසීමේ ක්‍රමවේදයේ වරදක් නිසාද? නැතිනම් මුදල් පියවීමේ වරදක් නිසාද? යනුවෙන් ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතාගෙන් විමසන ලදී.

විනිවිධ භාවයකින් තොර බැවින් හා ඒ සහනය අඩුම ගණනේ එක් අයෙකුටවත් නොලැබිච්ච කොට්ඨාස තියෙන නිසාත්. උඩුගම ප්‍රදේශයේ අපේ ගම්වලට ඒ සහනය නොලැබුන නිසාත්. තමන් විරුද්ධ බව ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ප්‍රකාශ කළේය.

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීවරුනි, ඉදිරි ගෙවීම් වාර්තාවේ 09 (ii) යටතේ සඳහන් කරුණ ලබන සභා වාරයට සාකච්ඡාවට බඳුන් කර ගන්නා බැවින් එය හැර ඉදිරි ගෙවීම් වාර්තාව ස්ථිර කරන්න. යනුවෙන් සභාවට යෝජනා කරන ලදී.

**09 (ii) ගෙවීම ලබන මස පැවැත්වීමට නියමිත මහා සභා රැස්වීමේදී සාකච්ඡාවට ඉදිරිපත් කර, 09 (ii) ගෙවීම හැර ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් ඉතිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**01. ගරු මන්ත්‍රී පී ජී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

1. 215/B අලුත් පහල බටහිර කුඹුරුහේන මාර්ගයේ වංගුවක් සහිත පාලමක් ඇත එය ඉතා අනතුරු දායක ප්‍රදේශයකි. එම නිසා එම මාර්ගයට වීදි ලාම්පුවක් සවිකර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.
2. 37 නාවින්න මාර්ගයේ කිරි ගෙදර නිවස අසල කන්ද මාර්ගය ජේ සී බී යන්ත්‍රයක් යොදා පිළිසකර කර දෙන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පී ජී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතික සහා සම්මත විය.**

**<u>(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම</u>**

| | | |
|---|---|---|
| i. | වරගහකන්ද මාර්ගය කොරිපස් යොදා සංවර්ධනය කිරීම | රු. 25000.00 |
| ii. | ඌරල කටඹුරාව උනන්විටිය පාර හා සම්බන්ධ වන සමෘද්ධි බැංකුව අසළ ඇති කොන්ක්‍රීට් පාලමට ආරක්ෂක වැටක් සවි කිරීම | රු. 90000.00 |
| iii. | ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුව | රු. 26136.00 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත ඇස්තමේන්තු තුන සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

නාගොඩ ප්‍රාදේශීය සභාව

පරිගණක මේස, පුටු සහ පුස්තකාලයට අවශ්‍ය පොත් රාක්ක සඳහා මිල ගණන් කැඳවීම -2020

| | විස්තරය | දම්රෝ ඩී.ආර් ඉන්ඩස්ට්‍රීස් උඩුගම | හසාරෝ එන්ටර්ප්‍රයිසස්, ගාල්ල | සිංහගිරි ෆර්නිචර්, උඩුගම |
|---|---|---|---|---|
| | | (රු.) | (රු.) | (රු.) |
| 1 | පරිගණක මේස - ලොකු | 22,747.50<br>120x55x79 | 11,350.00<br>120x58x76.5 | 10,790.00<br>120x58x76.5 |
| | | 10,057.50<br>120.4x40x77.3 | 7,150.00<br>120x40x77.5 | 6,640.00<br>120x40x77.5 |
| 2 | පරිගණක මේස - පොඩි | 5,917.50<br>60x40x77 | 4,950.00<br>59x36x72 | 4,490.00<br>59x36x72 |
| | | 8,437.50<br>80x40x73 | | 5,900.00<br>77x45x78.5 |
| 3 | පරිගණක පුටු | 6817.5 | 5,890.00 | 5,550.00 |
| 4 | පුස්තකාල පොත් රාක්ක | 14,377.50<br>78x37x197 | 9,750.00<br>80x37x182 | 10,200.00 |
| | | | 10,200.00<br>80x36x183 | |
| | | වගකීම් කාලය වසර 02 | වගකීම් කාලය වසර 02 | වගකීම් කාලය වසර 02 |

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද පරිගණක මේස, පුටු සහ පුස්තකාලයට අවශ්‍ය පොත් රාක්ක මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අතරින් දම්රෝ ඩී.ආර් ඉන්ඩස්ට්‍රීස් උඩුගම වෙතින් ලැබී තිබූ මිළ ගණන් තරමක් වැඩි වුවද, එම භාණ්ඩ තත්වයෙන් හා ගුණාත්මක බවින් ඉහළ බැවින් දම්රෝ ඩී.ආර් ඉන්ඩස්ට්‍රීස් උඩුගම වෙතින් පරිගණක මේස, පුටු සහ පුස්තකාලයට අවශ්‍ය පොත් රාක්ක මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## නාගොඩ ප්‍රාදේශීය සභාව

## ටෝනර් ලබා ගැනීම සදහා මිල ගණන් කැඳවීම -2020

| විස්තරය | ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම | ප්‍රිවිචි කම්පියුටර් ටෙක්නොලජී, වදුරඹ | රුචිර කම්පියුටර්, නාගොඩ |
|---|---|---|---|
| HP 35 A ටෝනර් | 10250.00 | 10500.00 | 10450.00 |
| HP 78 A ටෝනර් | 10500.00 | 10750.00 | 10850.00 |
| HP 85 A ටෝනර් | 10500.00 | 10750.00 | 10750.00 |
| Canon 325 ටෝනර් | 15550.00 | 15450.00 | 15650.00 |

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් අනුව ටෝනර් මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අතරින් හොදම මිළ ගණන් ඉදිරිපත් කරන ලද ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම වෙතින් ටෝනර් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

## නාගොඩ ප්‍රාදේශීය සභාව

## ආකෘති පත්‍ර මුද්‍රණය සදහා මිල ගණන් කැඳවීම -2020

| විස්තරය | ජේ.පී.කමියුනිකේෂන්, නාගොඩ | එස්.එන්.කොමියුනිකේෂන්, මාපලගම පාර, නාගොඩ | ප්‍රදීප් ප්‍රින්ටර්ස්, වදුරඹ |
|---|---|---|---|
| ගෙවීම් වවුචර්පත් සහ පොදු ආකෘති පත්‍ර එකක් මුද්‍රණය සඳහා | රු. 1.90.00 | රු. 2.00 | රු. 2.15 |

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් අනුව ආකෘති පත්‍ර මුද්‍රණය සඳහා ලැබී තිබූ මිළ ගණන් අතරින් හොදම මිළ ගණන් ඉදිරිපත් කරන ලද ජේ.පී.කමියුනිකේෂන්, නාගොඩ වෙතින් ආකෘති පත්‍ර මුද්‍රණය කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- ❖ 2020 මැයි මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය සළකා බැලීම සඳහා ජූලි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2020 ජුනි මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා ජූලි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2020 අප්‍රේල් මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරාංශය සළකා බැලීම සඳහා ජූලි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2020 මැයි මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරාංශය සළකා බැලීම සඳහා ජූලි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2020 ජුනි මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරාංශය සළකා බැලීම සඳහා ජූලි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම වෙනදට වඩා කලින්ම නැගී සිටියේ, අපට අද උදැසන මුදල් ගෙවීම් පිළිබඳ යම් කාරණයක් කතා කරන්න සිදු වුනා. අවුරුදු දෙකයි මාස ගණනක් මේ සභාව නියෝජනය කරලා. ඔබතුමා සභාපතිත්වය දරන කාලවකවානුවෙදි එවැනි යෝජනාවක් කරලා ගෙවීමකට විරුද්ධ වෙන්න සිදුවීම ගැන අපි ඉතාමත් කණගාටුවට පත්වෙනවා. විපක්ෂ කණ්ඩායමේ මන්ත්‍රීවරයෙක් විදියට අපි ගරු සභාපතිතුමාගෙන් නැවතත්  ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඉදිරියේදිවත්, පොදු කටයුතු කරනවානම්, සද්භාවයෙන් කරන කටයුතුවලට ඔබතුමා පක්ෂ විපක්ෂ බේදයකින් තොරව සියලුම කණ්ඩායම් දැනුවත් කරලා, ඒ කටයුතු කරනවානම්, අපට මේ සභාවේ අනවශ්‍ය කාලය ගත කිරීමක්වත්, ඔබතුමාගේ යෝජනාවලට විරුද්ධවීමක්වත් වෙන්න සිදු වෙන්නෙ නැහැ. විශේෂයෙන්ම ලේකම්තුමියත් මෙවට සම්බන්ධ වෙනවානම්, ඔබතුමියට තමයි නිලධාරීන් වශයෙන් මේ ප්‍රශ්නවලට අවසාන වශයෙන් ඉහළින්ම මුහුණ දෙන්න සිදු වෙන්නෙ. ඒ නිසා එවැනි ගෙවීම් සභාවට දාන්න කලින් ඔබතුමියන්ලා සභාවට කලින් ඒ ගැන අධ්‍යනය කරල දාන්න. මොකද ඒ කටයුතු ඒ ආකාරයෙන් ඉදිරියෙදි වෙන්න ඉඩතියන්න එපා. මොකද එහෙම වුනොත් නිලධාරියෙක් වශයෙන් ඔබතුමියටත් විශ්‍රාම ගියත්, අනාගතයෙදි මේවට උත්තර දෙන්න වෙයි. ඒ නිසා මේක අක්‍රමිකතාවක් වුනාය කියල අපි කොතනකවත් කියන්න යන්නෙ නැහැ. නමුත් ඒ ක්‍රමවේදෙ වැරදිනම් එතනින් පස්සෙ කරන සියල්ල වැරදියි. ඒ නිසා තමයි අපට මේව කතා කරන්න වුනේ. අවුරුදු දෙකයි මාස තුනක් විතර අපි ඔබතුමාගෙ මේ සභාවට සහභාගි වුනා. නමුත් අපට කවදාවත් සිදු නොවුන කාරණා දැන් සිදු වෙනවානම් ඒකෙ වැරදි ඔබතුමන්ලද? අපිද? කියල අපි දන්නෙ නැහැ. ඒක මීට වඩා ඔය කියන වචනවලට තේරුමක් ඇති වෙන්න ඒ කටයුත්ත ඒ ආකාරයෙන් සිදු වෙනවානම් ඉදිරියෙදි කිසිම ගැටුමකින් තොරව මේ සභාව මෙපමන කල් ආපු ක්‍රමයට ඉදිරියටත් ගෙනයන්න හැකිවේවි.

මම ගිය සභාවාරෙදි යම් යම් අදහස් කිහිපයක් දැක්වුවා. විශේෂයෙන්ම සභාපතිතුමනි, කෝවිඩ් වසංගතය අපේ රටෙන් තුරන්වේගෙන යද්දි, අවසානම අවස්ථාවට ඇවිල්ලා නැවතත් ඒක ව්‍යාප්ත වෙලා. මේ සතිය වෙනකොට සතියක් පාසලුත් නිවාඩු දීලා. මෙම වසංගතය උග්‍ර අතට පත්වෙමින් යනවා. අද ඉදලා මේ තැපැල් ඡන්ද තියෙන නිසා නිවාඩු නොදුන්නත් රටේ තියෙන වාතාවරණය එච්චර හොඳ නැහැ. මම මේ ගරු සභාවෙන් ගිය සභා වාරෙදි මගේ අදහස් ප්‍රකාශ කිරීමෙදි ඉල්ලා සිටියා. අපේ ගම් ප්‍රදේශවල තියෙන ප්‍රධාන ව්‍යාපාරික ස්ථානවලට අඩුම ගණනෙ අත සෝදන්නවත් ක්‍රමයක් සකස් කරන්න කියලා දැනුවත්

කරමු කියලා. අපි මේ සභාවෙන් මෙච්චර වියදම් කරනවා. ලක්ෂ දෙකයි, තුනයි ගණන් කියල බිල් දානවා. සනීපාරක්ෂක කටයුතු සඳහා එහෙම කරනවා. නමුත් එහෙම කළාට රජයේ පාසල්වලට, රෝහලට, බැංකුවලට විතරයි ඒව ක්‍රියාත්මක වෙන්නෙ. මම අදහසක් විදිහට ඔබතුමන්ලට කිව්වා. අපි ඒ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානවලට අඩු ගනනෙ අත සෝදන්නවත් ඒ වගේ දෙයක් කරන්න දැනුවත් කිරීමක් හරි කරමු කියලා. නමුත් අපි ඒ දක්වපු අදහස් මේ සභාවෙ ඔබතුමන්ලට එච්චර වැදගත් නැති ගානට තමයි සලකන්නෙ. නමුත් අද වෙනකොට වාතාවරණය හොඳ නැති වෙලා. නැවතත් අර කලින් තිබුනටත් වඩා ඒ වසංගතය උච්චතම අවස්ථාවට එමින් පවතිනවා. දැන් අපි ගාල්ලෙ කඩයකට ගියහම කඩයට ඇතුල්වෙන වෙලාව ලියන්න ඕන. අපිට දෙනව ටෝගන් එකක්. මම ගියා පුද්ගලික වෙළඳ සැලකට අපි උදේ 11.00 ඇතුලු වුනානම් 11.45 පිට වුනානම් අපි ඇතුල්වෙන තැන නම ටෙලිෆෝන් නම්බර් එක ලියලා ඇතුල්වෙලා එලියට එනකොට අපට දීපු ටෝගන් එක දීල එන්න ඕන. එතකොට ඒ අය බලන්නෙ මෙතනදි හදිසි අවශ්‍යතාවයක් වුනොත් ඒ වගේ වෙලාවක් ඇතුලත කවුරු හරි ලෙඩෙක් අහුවුනාය කියල දැනගත්තොත් එයා ඒ කඩේට ඒ වෙලාව ඇතුලත ඇවිල්ල තියෙනවද? ඒ වෙලාව ඇතුලත හිටපු සියල්ල දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් එතන ක්‍රියාත්මක වෙන්නෙ. අපි සමහර වෙලාවට මේ කඩෙන් එහා කඩේට එතනින් අනිත් කඩේටත් යනවා. ඒ හැම තැනකදිම අත සෝදන්න ඕන. නැත්නම් සිකියුරිටි එකෙන් ඇතුල් වෙන්න දෙන්නෙ නැහැ. ඇතුල් වෙන්න කලින් උන බලනවා. ඒ වගේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක වෙනවා. තවම මේ වසංගතය තුරන්වෙලා නැහැ. ඒ නිසා අපේ ගම් ප්‍රදේශයන් ආරක්ෂා කරන්න අපි මහජන මුදල් වියදම් කරනවා වගේම ඒ සඳහා දැනුවත් කිරීම් කරල යම් නීතියක් පනවල මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් හරහා අවශ්‍ය උපදෙස් දෙන්න කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා. මොකද ඒකෙ බලධාරියා වෙන්නෙ ප්‍රාදේශීය සභාව. අපේ බල ප්‍රදේශයේ එවැනි අවස්ථාවක් උදාවුනොත් මේ වගේ ක්‍රමවේද අනුගමනය කරල තියෙනකොට ඒක අවම කරගන්න හැකියාව ලැබෙයි. අද දවසෙ මම මීට වැඩිය කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ.

ගරු සභාපතිතුමනි, මම මුලින්ම කිව්ව වගේ මේ අවුරුදු දෙකක් වගේ කාලයක් ඉතාමත් සහයොගෙන් කටයුතු කළා සේම මේ ඉන්න සහෝදර මන්ත්‍රීවරුන් ඉස්සරහ අපි ඇත්ත කතා කරනවා විතරයි. ඔබතුමන්ලා ඒක මොනවගේ මට්ටමකට බාරගනීද දන්නෙ නැහැ. අපි හැමදාම කතා කළේ සත්‍ය විතරයි. මම කලින් කිව්ව වගේ ඒ නිලධාරිත් එක්ක කතා කරලා. මුදල් කමිටුවෙදි ප්‍රශ්නයක් වුන නිසා තමයි එදා විරුද්ධ වුනේ. ඒ වගේම තමයි අද ඔබතුමන්ලගෙ පැහැදිලි කිරීමට අපට එකග වෙන්න බැරි මට්ටමක් තමයි දැනටත් තියෙන්නෙ. ඒ නිසා එවැනි තත්වයකට පත්වීම ගැන අපේ කණගාටුව ප්‍රකාශ කරමින්, නැවත වතාවක් අනාගතයට මෙවැනි දේවල් සිදු නොවෙන්න මේ සභාවට ආපු විදිහට අපට යන්න හැකියාව ලැබෙන්න කටයුතු කරන්න. ඔබතුමාගෙ කාලෙ කරගෙන ආපු කටයුත්ත ඒ ආකාරයෙන් කරගෙන යන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා බොහොමත්ම ස්තුතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මේ වෙලාවෙ අපට මතු වුන කාරණාව තමයි. මේ කෝවිඩ් - 19 සම්බන්ධව මේ සභාවෙන් ඉටුවිය යුතු දේ කුමක්ද කියන එක. එතනදි අපට පැහැදිලියි ඇත්තටම මේ ග්‍රාම සේවා වසම් 53 ම අපි සියලු දෙනා නියෝජනය කරනවා. ඒ වගේම ඔබතුමන්ලගෙ මන්ත්‍රීවරු 15 ක් ඉන්නවා. එතුමන්ලටවත් හරියට ඔබතුමන්ලා කරන ක්‍රියා කලාපය ගැන කිසිම අවබෝධයක් නොතිබූ බව තමයි මට නම් පේන්නෙ. ඒ පිළිබඳ අපි මේ මොහොතේ කණගාටුව ප්‍රකාශ කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි වැඩි මුදලක් දීලා වීපී ලාම්පු ගෙනාවා. දැන් තල්ගස්වල නව නගරෙ පොලට ඇතුලු වෙන මාර්ගයේ වීපී ලාම්පුවක් සවිකරල තියෙනවා. හොඳ අලුත් ලාම්පුවක් සවිකරල තියෙන්නෙ. ඒ ලාම්පුව රැට ඩිම් එකේ තියෙන්නෙ එළියක් නැහැ. ඒක නිසා මම හිතන්නෙ ඒකට යම් කිසි

ගැරන්ටි කාලයක් ඇති. ඒ ගැන සලකා බලන්න කියල ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මීට සතියකට කලිනුත් ගිහින් වීථි ලාම්පු සවි කරලා ඇවිල්ලා තියෙනවා. වීථි ලාම්පු සවිකරලා ගියා නමුත් කිසිම එළියක් නැහැ කියලා ත්‍රීවිල් පාක් එකේ අය අපිත් එක්ක පැවසුවා. ඒ නිසා ඒ ලාම්පුවල ගැරන්ටිය පොඩ්ඩක් බලන්න.

ඒ වගේම ගරු සභාපතිතුමනි, පුරන් කුඹුරු සම්බන්ධව මේ සභාවෙන් ගිය ප්‍රචාරයට මේ අවස්ථාවෙ ඔබතුමාට මම ස්තූතිය පුද කරන්න ඕන. ප්‍රචාරය ගියාට පස්සෙ ගව හිමියන් විසින් ගවයන් බැඳ තැබීම කරලා තියෙනවා. තරමක් දුරට හානිවීම අඩු වෙලා තියෙනවා. නමුත් තවමත් අපේ ප්‍රදේශයේ වැඩ කරන ජනතාව ඉතා මහන්සියෙන් වැඩ කරලා ඇවිල්ල රෑට නිදා ගන්න බැරි තත්වයක් තමයි තියෙන්නෙ. මමත් එහෙමයි. මමත් රෑ 8.00 ට විතර කුඹුරට ගිහිල්ලා දෙක තුන වෙනකම් නිදි වරාගෙන ඉන්නවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාට හැකියාවක් තියෙනවානම්, ඒ ගව හිමියන් කැඳවලා මොකක් හෝ ක්‍රියා මාර්ගයක් ගන්න. ඒ අයට නිවේදනයක් දෙන්න. මෙන්න මේ ක්‍රමය කරමු කියලා. එහෙම ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි විශබීජහරණය ගැන කතා කළොත්, මේ සභාව තුල බලන්න. මේ පුස්තකාල ගොඩනැගිල්ලට දවසට කීදෙනෙක් ගොඩ වෙනවද? එතන සින්ක් එකක් තිබේද? දැන් ප්‍රියන්තා මන්ත්‍රීතුමිය ගෙනාපු සින්ක් එක සභාවට ඇතුලු වෙන තැන තියෙනවා. ඇත්තටම ඒක අපේ කුස්සියක තියෙන ඩස්ට් බින් එකක් වගේ. ගිහින් බලන්න. පරිප්පු ඇට ටික බත් ඇට ටික ඇත්තටම එතන අත සෝදන්න බැහැ. කවුරු හරි උගත් මනුස්සයෙක් ඇවිත් ඔතන අත සේදුවොත් අපටත් ලැජ්ජයි. මම ගිහින් බැලුවා ඇත්තටම අපට අත සෝදගන්න බැරි වුනා. දැන් ගිහින් බලන්න සින්ක් එකේ තත්වෙ. කිසිම පිරිසිදු කමක් නැහැ. ඒ වගේම තමයි අනිත් පුස්තකාල දෙකම. ඒ දෙකට ගරු සභාපතිතුමනි මම කියන්නෙ සින්ක් එකක් සවි කරන්න. මෙතනට මම දැනුවත්ව හික්කඩුවෙන් පවා ජනතාව ඇවිල්ලා පොත් පත්තර බලනවා. කියවනවා. ඒක නිසා ඒ දේ කරන්න. මුලින් අපි හදා ගන්න ඕන. අපි හදා ගත්තොත් තමයි අපට අනිත් අයට උපදෙසක් දෙන්න පුලුවන්. ඔබතුමා යම් යම් දේවල් කළාය කියලා කිව්වා. ඔබතුමා කළ සේවය අගය කරනවා. නමුත් ගරු සභාපතිතුමනි, මාස්ක් එකක්වත් මේ සභාවෙන් ලැබුනෙ නැහැ කියල අපට චෝදනා ආවා. නමුත් මම පුද්ගලිකව අපේ පැත්තෙ ගාමන්ට් එකක් තියෙනවා. ඒ ගාමන්ට් එකට දීල මාස්ක් මස්සවලා ග්‍රාමීය රෝහල නාගොඩට, එම් ඕ එච් එකට, ගල්ලිද ඉස්පිරිතාලෙට, නාගොඩ පොලීසියට ලබා දුන්නා. මම මහන්සිවෙලා නාගොඩ සතොසට සින්ක් එකක් සවිකළා. අන්න ඒ වගේ ගරු සභාපතිතුමනි අපෙන් වෙන්න ඕන දේ කරමු.

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් කුඹුරුහේන ප්‍රදේශයට වීථි ලාම්පුවක් ඉල්ලා සිටියා. අශෝක මහත්මාගේ කඩය අසල වංගුවක් තියෙනවා. ඒ වංගුව අනතුරුදායකයි. අනතුරු බහුල ප්‍රදේශයක් පියල් මන්ත්‍රීතුමත් දන්නවා. එතනට වීථි ලාම්පුවක් සවිකරල දෙන්න කියල ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මෑතකදි ඔබතුමාට සිරසෙනුත් කතා කළා. කුඹුස්ස ලග සිට කුඹුරුහේන මාර්ගය තල්ගස්වල දක්වා කාපට් දාල දෙනවයි කියලා ඔබතුමා පොරොන්දු වෙලා තියෙනවා. දැනට කරගෙන යන වැඩ පිළිවෙලත් එක්ක ඒ පොරොන්දුවත් ඉටුවේවි කියලා මම බලාපොරොත්තු වෙනවා. ඒ ගැන ඔබතුමාට ස්තූතිය පුද කරනවා. ගරු සභාපතිතුමනි, මීට වඩා හොඳ ක්‍රමවේදයක් තියාගන්න. අපි පක්ෂ, විපක්ෂ සියලුම දෙනා මේකට වග කියන්න ඕන. ඔබතුමා ගන්න සෑම ක්‍රියාමාර්ගයකටම අපිත් එකතු කර ගන්න. කෝවිඩ් - 19 වසංගත තත්වයෙදී ඔබතුමා මුලින් මුලින් අපට කියල රැස්කර ගත්තා. නමුත් ඇත්තටම ඔය එලවලු බෙදනවයි කියනවා. එක එක ඒව කියනවා. ඇත්තටම අපි ඒව දන්නෙ නැහැ. මේ කතාබහට වැඩිම කාලයක් ගතවුනේ ඒක නිසා. ගරු සභාපතිතුමනි, අපේ මේ කාලය රන් හා වටිනවයි කියන්නෙ ඒකයි. ඒක නිසා ඔබතුමා මීට වඩා ගොඩක් හිතල බලල කටයුතු කරන්න කියල ඉල්ලමින්,ඉදිරි දිනවලදි පාර්ලිමේන්තු මැතිවරණය තියෙනවා. ඒකට මේ තිත්ත වූ දේශපාලනය නැති වෙලා තිත්ත නැති වෙන්න කටයුතු කරන්න කියල ඔබතුමාගෙන් ඉල්ලනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපට සියලු

දෙනාගෙන්ම සහයොගය ලැබෙනවා. මේ තිත්ත ඇත්තෙන්ම තමයි යන්නෙ. එම නිසා ඔබතුමාලා ඒ ගැනත් හොදට හිතාගෙන කටයුතු කරල අපේ රටට වැඩදායී පුද්ගලයන් බිහිවෙනව වගේම ඒ සියලුම බලවේගයන් ඒකරාශී කරගෙන අපි මෙවර මාලිමාව යටතේ තරග වදින්නෙ. ඒකට ගොඩක් ප්‍රතිචාර හම්බ වෙනවා. ඒ ගැනත් මතක් කරමින් ඔබ සියලු දෙනාටම සියලු දෙවියන්ගේ රැකවරණය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මා නිහඩ වෙනවා.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, පහුගිය කාලය තුලදි කැප්පිටියාගොඩ ප්‍රදේශයේ ජල ව්‍යාපෘතියක් ආරම්භ කළා. එහිදී මුදල් ප්‍රශ්නයක් ඉස්මතුවෙලා, ඒ ජල ව්‍යාපෘතිය නැවත වතාවක් අඩපන වෙලා තියෙනවා. මේ දිනවල ජනතාවගේ සහයෝගයත් ඇතිව නැවත වැඩ ආරම්භ කිරීම සිදු කරලා තියෙනවා. ගරු සභාපතිතුමනි, තව වැඩ කොටසක් කරගෙන යාම සඳහා මුදල්වල පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ඇත්තටම මුදල්වලින් බලාපොරොත්තු නොවුනත් ශ්‍රම දායකත්වයෙන් හරි අපේ සභාවට අයත් කොට්ඨාසයක් නිසා ඒ අඩුපාඩුව ගැන ඔබතුමාගෙ අවදානය යොමු කරමින්, ස්කැවේටර් යන්ත්‍රයක් හරි යොදවල කරව්ව කන්ද ප්‍රදේශයේ තියෙන කානු පද්ධතියට සහයෝගයක් ලබා දෙන්න කියල ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ නාගොඩ වත්ත පාරට රුපියල් ලක්ෂ 10 ක මුදලක් පසුගිය කාලයේ අනුමත වෙලා තිබුනා. ඒ සඳහා ලිපි ලේඛන සභාව වෙතත් යොමු කරලා තියෙනවා. මේ වනවිට ඒ පිළිබඳව ප්‍රමාදයක් වෙලා තියෙනවා. ඒ පිළිබඳව ඔබතුමාගෙ අවදානය යොමු කරමින්, ඒ සඳහා භාරව සිටින අපේ ආණ්ඩුකාරතුමා වෙත ඒ පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කරලා. ඉතා ඉක්මනින් ජනතාවට සහනයක් ලබාදීමේ කටයුතු සම්පාදනය කරන්න කියලා ඉල්ලීමක් කරමින්, සැමට තෙරුවන් සරණයි කියල නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. අපේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමා කිව්වා වගේ නිදැල්ලේ යන ගවයන් නිසා කුඹුරුවලට විශාල හානියක් වෙන්න ඉඩ තියෙනවා. ඒ නිසා මේ ගව හානිය පිළිබඳව පොලිස් ස්ථානාධිපතිතුමා ඇතුලු අදාල නිලධාරීන් දැනුවත් කරලා, ගව හිමියන් ගෙන්වලා දැනුවත් කිරීමක් කරන්න ඕන. ඒ වගේම මාපලගම කොටස අස්වද්දල තියෙනවා. ඉතා සරුසාරවත් කුඹුරු යායක් තියෙනවා. ඒ වගේම එම අවස්ථාවෙදි රංජිත් ජයවීර මැතිතුමා ඇතුලු තවත් පළාත් සභා මන්ත්‍රීවරු විසින් වප්මගුල් උත්සවයක් පැවැත්වුවා. පොහොර ලබා දීම පිළිබඳව හා සීසෑම පිළිබඳව එතුමා මෙම සභාවෙ ඉතාම වගකීමෙන් ප්‍රකාශ කරල තියෙනවා. එතුමන්ලගෙ දේශපාලන පක්ෂය විසින් ඒ කුඹුරු යාය අස්වැද්දීම සඳහා එක්තරා කොටසකට සහයෝගය ලබා දුන්න බව. ඒ වුනාට මට ආරංචි විදිහට දැන් දැන් ගොවි සංවිධාන මගින් මුදල් ලැබීමේ තත්වයක් පවතිනවා. දැනට කීප වරක්ම චෙක්පත් මගින් මුදල් ලැබිලා තියෙනවා. ඒ වගේම වෙනත් ආධාරත් ලැබිල තියෙනවා. මට එතුමාගෙන් ඒ පිළිබඳව පොඩ්ඩක් දැනගන්නත් ඕන. ඒ වගේම මේ නාගොඩ ක්‍රියාත්මක වෙන සියලු ගොවි සංවිධානවල සභාපතිවරුන්ගේ සංගමයේ සභාපතිතුමා ඉන්නවා. අපේ ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා. මම එතුමගෙනුත් මේ ප්‍රශ්නය ඇහුවා. ඒ පිළිබඳ තොරතුරු සපයා දීමට එතුමත් කැමැත්ත ප්‍රකාශ කරල තියෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතතුමනි, ගරු පියල් මන්ත්‍රීතුමාගෙ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න ඕන. අපේ නලින් හේවගේ මන්ත්‍රීතුමා අපට බෙහෙත් ටැංකි තුනක් ලබා දුන්නා. අපි තරුණ ගොවි සමිතියක් අලුතින් පිහිටුවලා කුඹුරු අක්කර 43 ක් අස්වැද්දුවා. අපි 25 කින් තමයි පටන් ගත්තෙ. ඒ වගේම අපට ගරු ආණ්ඩුකාරතුමාගෙන්, රජයෙන් තමයි අපට මුදල් ලැබුනෙ. හාන්න සහ රොටරි කරන්න ගිය මුදල තමයි අපට ලබා දුන්නෙ.

වෙනත් ආධාරනම් අපට ලැබුනෙ නැහැ. ඒ සම්බන්ධ සියලු ලිපි ලේඛන අපේ ලග තියෙනවා. අපි තරුණ ගොවි සමාජයක් හැදුවා. හදල අපි අලුතෙන් වැඩක් පටන් ගත්තා. අපේ කුඹුරු යාය අවුරුදු 15 කිනුත් අවුරුදු 8 කිනුත් තමයි එලි කරල තිබුනෙ නැත්තෙ. අපි දැන් ඉදිරියටත් ගෙවතු වගාවන් කරනවා. ඒ වගේ අපි ප්‍රමුඛතාවය අරගෙන වැඩ කටයුතු කරනවා. එතුමා ඒ පිළිබඳව සොයා බැලීම සම්බන්ධව එතුමාට මම බෙහෙවින්ම ස්තූතිය පුද කරනවා. ඔබතුමාලගෙන් කෙරෙන්න ඕන යුතුකම අපි ඉටු කළා. අපි නොමිලෙ කරල දුන්නෙ. වැඩ කරපුවට සල්ලි දෙන්න ඕන. අපි තමයි ප්‍රමුඛතාවය ගත්තෙ. ඔබතුමාගෙ කොට්ඨාසෙ ඔබතුමා ඕන එහෙනම් තරුණයොත් එක්ක වැඩ කරල පෙන්නන්න. අපි උපදෙස් දීල අපි නායකත්වය දුන්නා. අන්න එහෙමයි වැඩක් කරන්න ඕන. ඒකට ඔබතුමා අකමැතිනම් අපට කරන්න දෙයක් නැහැ. අපට බෙහෙත් ටැංකි ටික නොමිලෙ දුන්නා. අපි මිනිස්සුන්ට නොමිලෙ වැඩ කරල දුන්නා. සල්ලි ලැබුනෙ ගොවි සංවිධානෙට. ඒ සල්ලි වැඩ කරපු මිනිස්සුන්ට බෙදා දීල තියෙන්නෙ. ගරු සභාපතිතුමනි, මෙන්න මෙහෙමයි වෙලා තියෙන්නෙ. අපි ටැක්ටර් තුනක් ගෙනැල්ලා රොටරි කළා. ඒ රොටරි කරන්න ගිය මුදල අපට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලැබුනා. ඒක අපි රොටරි කරපු ටැක්ටර් අයිති කරුවන්ට ලබා දුන්නා. එහෙම නැතුව අපි ගත්තෙ නැහැ. අපි සහනයක් අර මිනිස්සුන්ට ලබා දුන්නෙ. අත්තමක් රු.1500.00 ක් වන නිසා, කරන්න බැරි නිසා ඒ මිනිස්සු වැඩ කරන් නැතුව හිටියෙ අන්න එච්චරයි අපි කළේ. නැතුව ඒ මුදල් ටික අපි ගත්තෙවත් එහෙම එකක් කළේ නැහැ. ඔබතුමාලට මොකක්හරි ප්‍රශ්නයක් තියෙනවනම් කියන්න. අපි ලග සියලු ලිපි ලේඛන තියෙනවා. අපි ඉදිරිපත් කරන්නම්. අපේ ගොවි සංගමේ ගරු සභාපතිතුමා ධර්මසිරි මන්ත්‍රීතුමා ඉන්නවා. මම හිතන්නෙ එතුමා පැහැදිලි කරාවි. අපි ප්‍රතිසංස්කරණයක් කළේ. දැන් ඔබතුමාට ප්‍රශ්නයක් කණගාටුවක් තියෙනවනම්, ඒක කියන්න. ඒකට කමක් නැහැ. ඔබතුමාල මේ ගැන සතුටු වෙන්න ඕන. ඔබතුමන්ලා කරන්නෙ නැති දෙයක් කොට්ඨාසෙට අපි කළා. ඇත්තටම ගරු සභාපතිතුමනි සතුටු වෙන්න කියන්න.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි මගෙන් ප්‍රශ්නයක් අහපු නිසා ඒකත් එක්කම ඉස්සෙල්ලම කතා කරන්න ඕන. ගරු සභාපතිතුමනි, මම දන්න විදිහට අපි ගොවි සංවිධානය ලියාපදිංචි කරලා තියෙනවා. එතකොට ජයවීර මන්ත්‍රීතුමන්ලා, ගොවි සංවිධානයක් ක්ෂණිකව පිහිටුවා ගන්නවා. ඒ ගොවි සංවිධානය හරහා උත්සවය කරනවා. මෙතනදි ඔබතුමා විතරක් නෙවෙයි. වගකිවයුතු නිලධාරිත් ඉන්නවා මේ කටයුත්තට හවුල්වෙලා. එතකොට ඒ අයි මිස් ඉන්නවා. ඒ ප්‍රදේශය භාර කෘපනිස නිලධාරි වරයා ඉන්නවා. එතකොට ගරු සභාපතිතුමනි මෙතනදි රජයෙන් ලැබෙන මුදල්, දැන් එතුමාම ප්‍රකාශ කළා. දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් හරි ආණ්ඩුකාරතුමා විසින් හරි ලබා දීපු මුදලක් තමයි මේ ගොවි සංවිධානයට ඇවිල්ල තියෙන්නෙ. තව මුදලක් ඉදිරියට එන්නත් තියෙනවයි කියල තමයි මම දන්න විදිහට තොරතුරු තියෙන්නෙ. දැන් මෙතනදි තමයි ඔය තොරතුරු ගත්තෙ. ගොවි සංවිධාන තුල මට කතා කරන්න වුනේ නැහැ. අදාල ගොවි සංවිධානයට නම් චෙක්පත ආවෙ එම මුදල් වියදම් කිරීමේ දී ඒ අදාල ගොවි සංවිධානයේ නිලධාරීන් තමයි ඒ පිළිබඳව වග කියන්න ඕන. එම චෙක්පත වියදම් කිරීම තුල ඔබ කියනවා. කුඹුරේ සීසෑම පිළිබඳව තමයි ඒ මුදල් වියදම් කළේ කියලා. එතකොට යම් කුඹුරු හිමියන්ගේ ලේඛනයක් ඔබ ලග තියෙනවද? මෙන්න මේ අසවලාට මෙච්චර ප්‍රමාණයක් අපි නොමිලේ සීසාල දුන්නා. නොමිලේ නෙවෙයි මුදල ලබා ගැනීමේ පදනමින් රජයෙන් තමයි වියදම දරන්නෙ. ගොවියාට සහනයක්. ඒ පදනම මත ඔබ ලග දැන් ලේඛනයක් තියෙනවා. එහෙමනම් සභාපතිතුමනි, මෙතනදි ඒ පිළිබඳව ඔබතුමාගෙ අවස්ථාව වෙන්නෙ. දැන් මේක මෙතනදි අහපු ප්‍රශ්නයක් නිසා මේකෙ පරීක්ෂණ කයුත්ත ආරම්භ කිරීමට ඔබතුමන්ට වගකීම දැරීමේ හැකියාව කොතනද කියල මම දන්නෙ නැහැ. අදාල තැනට යොමු කරන්න. එහෙම නැත්නම් මම එතනින් එහාට ඒ ටික ගොවි සංවිධාන තුලින් මට කරන්න පුලුවන් දේ බලන්න ඕන. ඒක ලබුදුව ගොවිජන සේවා මධ්‍යස්ථානයට දැනුම් දීල ඒ කටයුත්ත කරන්න ඕන. මොකද මා දන්නා විදිහට මේ මුදල් වියදම් කිරීමේ දී ඒ අදාල සභාපතිවරයා ඒ මුදල් ලබා දීපු සභාපතිවරයා වග කියන්න ඕන.

එතකොට ඒ ලේඛන ඒ ගොවි සංවිධානය තුල තියෙන්න ඕන. එතකොට ඒක අන්සතු කෙනෙක් ගාව තියා ගන්න බැහැ. එහෙමනම් තරුණ ගොවි සංවිධානය විසින් පවත්වා ගත්තනම්, ඒ කටයුතු සියල්ල කළා නම්, දැන් බෙහෙත් ටැංකි ටික කොහේද තියෙන්නෙ. ඔබතුමා ගාව තියාගන්න බැහැ. ඔබතුමා ගාව තියාගන්න පුලුවන්නම් අර මුදලත් ඔබතුමාට මාරු කරන්න පුලුවන් වෙන්න ඕන. එහෙමනම් එහෙම බැරි වුනානම්, ගරු සභාපතිතුමනි, මෙතනදි යම් මුදල් අක්‍රමිකතාවක් වෙලා කියලා මට පේන්නෙ. මෙතන මුදල් අක්‍රමිකතාවක් වෙලා කියලා මම දකිනවා. මොකද හේතුව ඒ මුදල වියදම් කිරීමේදී ඒ අදාල සංවිධානයේ භාණ්ඩාගාරිකතුමාත් දැනුවත් නැත්නම් අදාල ලේකම්තුමා දන්නෙ නැත්නම් සභාපතිවරයා සහ භාණ්ඩාගාරික ගිහිල්ලා ඒ චෙක්පත මාරු කරලා ඒ මුදල වෙනත් ගොවි සංවිධානයක් පිහිටුවාගෙන යනවයි කියන එකට දීලා ඒ කටයුත්ත මම හිතන්නෙ වැරදි ක්‍රියා කලාපයක් වෙලා තියෙනවා. රජයේ මුදල් අන්සතු වීමක් එතකොට එතනදි මම ඒක දකින්නෙ නැහැ නිවැරදි වියදම් කිරීමක් තුල ඒක වුනා කියලා. ඒක නිසා මම ඒක අක්‍රමිකතාවක් කියල කිව්වෙ ඒකයි. එතකොට එතනට තව මුදල් එන්න තියෙන නිසා ඒ පිළිබඳ අපි හොයල බලන්න ඕන. මොකද ඒ වගේම එතුමාගෙන් සහ ගොවි සංවිධාන එතන වගකීම දරන ගොවි නිලධාරීන්ගෙන් අපි මේ ලේඛන ඉල්ලලා මේ පිළිබඳව මේ සභාවටම ඉදිරිපත් කිරීමට මම වගකීම භාර ගන්නවා. මොකද එහෙම දෙයක් වෙලානම්, ඒක නිකන් පැත්තකට යවන්න බැහැ. ඒක මොකද මේ සභාවක් තුල කතාබහට ලක්වෙලා සභාපතිතුමනි ඊලගට ජයවීර මන්ත්‍රීතුමාගෙන් අහල තමයි මේක දැනගන්න වෙන්නෙ. නොමිලෙ උදලුතල හම්බ වුනාද? උදලුතල හම්බ වුනේ නැත්නම් ඒක ප්‍රශ්නයක් නැහැ.

ඊලගට දැන් ඔබතුමාගෙන් අහන ප්‍රශ්න මම අහල ඉවරයි. හැබැයි සභාපතිතුමනි, මම කණගාටුවට පත්වෙන්නෙ. මෙන්න මේ උත්සවයට මටත් ආරාධනාවක් ලැබුනා. ඒ ආරාධනාව ලැබුනෙ මේ සභාවෙ ජයවීර මන්ත්‍රීතුමා විවෘත ආරාධනාවක් කළා. එක සතුටින් පිළිගත්තා. මොකද ප්‍රදේශයේ යම් කෘෂි කර්මාන්තයක නියැලෙන මන්ත්‍රීවරයෙක් හැටියට, ඒ කටයුතු සද්භාවයෙන් කරන පුද්ගලයෙක් හැටියට මා දැක්ක නිසා තමයි මම එතනට එදා දවසෙ ගියේ. නමුත් මේ වෙන කොට ඒක කිසිම සද්භාවයක් දකින්න නැහැ වගේ පේනවා. මොකද එතන උත්සවයට ගිහිල්ල ඒ උත්සවයේ මම කතාව අහගෙන හිටියා. සභාපතිතුමත් හිටියා. ඒ පොහොර පිළිබඳව, ලබා දීපු සහන පිළිබඳව, නොමිලේ ලබා දීපු බිත්තර වී පිළිබඳව සියල්ලම එතුමන්ලගෙ පක්ෂයෙන් දීපු විදිහට තමයි කතා කළේ. අදට ගමට ගිහින් බැලුවත් ඒ ගමේ ජනතාව මේ පියල් මන්ත්‍රීතුමාගෙන් අහන්නෙ මේක දුන්නෙ ජනතා විමුක්ති පෙරමුණද? නමුත් හැබැයි මේ සියල්ලම ලබා දෙන්නෙ වර්ථමාන රජය විසින්. හැබැයි ඒක කියන්නෙ නැතුව තමන්ට ලැබෙන සහනය අරගෙන ඒකට ස්තුති කරන්න. අපට මෙච්චර කල් බිත්තර වී නොමිලෙ දුන්නෙ නැහැ. මෙච්චර දවස් පොහොර ටික නොමිලෙ දුන්නෙ නැහැ. මේ පොහොර ටික නොමිලෙ දීපු බිත්තර වී ටික නොමිලෙ දීපු එක අරගෙන ගිහිල්ලා සංවිධාන ගත වෙද්දි ඔබ කියන්න, මම තමයි මේකෙ නායකත්වය ගත්තෙ. ඒකෙ ප්‍රශ්නයක් නැහැ. හැබැයි මේව ලැබෙන්නෙ මෙන්න මේ ආයතන වලින් ඒක කියල ඒක පැහැදිලි කරළා ඒ ජනතාව දැනුවත් කරන්න ඕන. ඒ ජනතාව අපෙන් අහනවා ඔබතුමන්ලා නෙවෙයි මේක දුන්නෙ. අපිට හම්බ වුනේ මේ ගොල්ලන්ගෙන්. එතකොට ඒ වැරදි ආකල්පය සමාජ ගත වෙලා තියෙනවා. ඒක නිවැරදි වෙන්න ඕන. අනිත් එක තමයි. මම ගිය සභාවෙත් කිව්වෙ ඒ ආපු මන්ත්‍රීවරයා ටීවී වැඩසටහනකට ඉදිරිපත්වෙලා කියනවා. පළාතක පොහොර නැතිලු හැබැයි දැන් රංජිත් ජයවීර මන්ත්‍රීතුමාට තව චෝදනාවක් තියෙනවා ඒ තමයි ලියාපදිංචි අංකයක් නැති ලියාපදිංචි නැති සමිතියකින් අත්සන් කරල පොහොර ගත්ත එකට. එතකොට පොහොර ලබා දීපු නිලධාරීන්ටත් මේකෙ චෝදනාව තියෙනවා. එහෙම ගන්න බැහැ. ඒ මුදල් ගන්න බැරිනම් ලියාපදිංචි සමිතියකින් නම් මුදල් ගත්තෙ ඔබ පොහොර ලබා ගත්තෙ කොහොමද කියලා මම හොයන කොට එතනත් ඔබ කරල තියෙන්නෙ වංචාවක්. එතකොට තිත්ත ඇත්ත දේශපාලනය තුල ඔබ කතා කරපු, මට හරිම අප්‍රියතම වචනයක් බවට පත්වෙනවා මෙතනදි. ඒක නිසා ඒ තිත්ත ඇත්ත කියන එක ඔබගේ දේශපාලන ගමන බොරු කාරයෙක් බවට පත්වෙලා ඉවරයි මෙතනදිම. මම ඒක සැබැවින්ම දැක්කා. ඒක නිසා මීට පස්සෙ ඔබතුමන්ලා කතාබහ කරද්දි ඒ අවංක භාවය ගේන්න.

ඒක තමයි මම සතුටට පත්වෙන්නෙ. මොකද මම ඔබතුමා ගැන ලොකු පැහැදීමකින් හිටියා. නමුත් මෙතනදි මේ වියදම් කිරීම පිළිබඳව මේ කටයුතු සියල්ල පිළිබඳව මා දකින්නෙ නැහැ ඔබගේ නිවැරදි ගමනක් ඒක නිසා ඒ පිළිබඳව එතනින් මම නවත්වනවා.

ඊළගට සභාපතිතුමනි, අද දවසේ කතා වුන ලොකුම මාතෘකාව තමයි මේ එළවලු ගෙනැල්ලයි ඒ ප්‍රශ්නෙ. එක ප්‍රශ්නයක් තමයි සභාපතිතුමනි, දැන් අපේ සහෝදර හිටපු සභාපතිතුමෙක් ඒ වගේම වර්ථමානයේ විපක්ෂයේ මන්ත්‍රීතුමා එක වෙලාවකදි සදහන් කළා. පෞද්ගලිකව ගෙනාවත් ඒව බෙදන්න බැරිය කියලා. මම අහන්නෙ සභාපතිතුමා ඔබතුමා මේ බල ප්‍රදේශයේ ප්‍රධාන පුරවැසියා හැටියට, මහ ලොකුවට නෙවෙයි. යම් පවුල් කීපයක් දකිනවා. කන්න නැතුව ඉන්නවා. සභාපතිතුමාට දුක හිතිලා එතුමා ගිහිල්ලා. තමන්ගෙ පෞද්ගලික මුදලින් බඩු ටිකක් ගන්නවා. හැබැයි සභාවෙ කැබ් එකෙන් තමයි එතනට යවන්නෙ. එතකොට ඒක වැරදිද? සභාවෙ කැබ් එක එතකොට පාවිච්චි කරන්න පුලුවන් නේද? හැබැයි එහෙමනම් ඒ බඩු ගැනීමේ මුදල් එතුමාගේ පෞද්ගලික මුදල් වෙන්න ඇති. හැබැයි මේක බෙදා හැරීමේදී හරිද වැරදිද කියලා මම දන්නෙ නැහැ. හරියට තවත් කතාවලදි ඕක දැන ගන්න පුලුවන් වේවි. මම හිතනවා හැබැයි සභාපතිවරයාට ඒ බඩු බෙදාදීම එතුමාගේ පෞද්ගලික කාරණයක් නෙවෙයි. බෙදා දීම කළ හැකියි කියලා තමයි මම හිතන්නෙ. ඒක නිසා සභාපතිතුමා විසින් ඒ එළවලු ගෙනැල්ල බෙදා දීමේ දී මන්ත්‍රීවරුන් දැනුවත් නොකිරීම පිළිබඳව ප්‍රශ්නයක් තමයි මෙතනට ආවෙ. හැබැයි මුලින් මන්ත්‍රීවරුන් සියලු දෙනාම කැඳවලා කටයුතු කළා. හැබැයි සභාපතිතුමා දැනුවත් වුනේ නැහැ මේක ක්ෂණිකව කරන්න ඕන දෙයක් කියලා. එළවලු කියන්නෙ මේ හාඩ්වෙයාර් එකක බඩු ගෙනැල්ල බෙදනව වගේ නෙවෙයි අනිත් එක සිල්ලර බඩු වියලි සලාකයක් වගේ තමයි මේ එළවලු කියන එක අද ගෙනාවනම් හෙට වෙනකොට මේ සියල්ලම පාරිභෝගික ජනතාවට ලබා දෙන්න ඕන. අන්න ඒ පිළිබඳව දැනුවත් වුනේ නැද්දෝ මම දන්නෙ නැහැ. ඒ ගෙනැල්ල ක්ෂණිකවම ඒ කටයුතු සිදු කරන්න වුනා අන්න එතනදි තමයි මේ අකර තැබ්බයට මුහුණපාන්න සිදු වුනේ ඒක නිසා එක ප්‍රදේශයක් තෝරගන්න බැරි වුනා. ලක්රුවන් මන්ත්‍රීතුමා මම දන්නවා ඉදිරිපත් වෙලා එතුමාට එහේ අරන් යන්න ඕන කම නෙවෙයි හිතවතුන්ට හරි මේක විකුණලා මේ මුදල මෙතනට ලබා ගන්න ඕනෙයි කියන මතයක් එතුමට එවලෙ තිබුනා මම දන්නවා. ඒ වගේම මමත් බඩු පාර්සල් කීපයක් අරගෙන එක එක්කෙනාට දුන්නා. හැබැයි මම ඒ කටයුත්තට ලොකුවට සම්බන්ධ නොවුනට එතනදි වුනේ සහභාගි වුන මන්ත්‍රීවරුන් හා සහභාගි වුන නිලධාරීන් ශබ්ද විකාශන යන්ත්‍ර යොදාගෙන පුලුවන් ඉක්මනට මේක විකුන ගන්න ඕන. වර්ෂාවට අහුවුනා අන්න ඒක තුල තමයි මේ ක්‍රියා කලාපය සිදු වුනේ. එතනදි අපේ තරංග මන්ත්‍රීතුමාගෙ ප්‍රදේශයට ඒ වගේ ප්‍රදේශවලට සමහර විට දුර ප්‍රදේශ නිසා ඒවට යන්න නැතුව ඇති. හගරංවල පැත්තට එහෙම යන්න නැතුව ඇති. හැබැයි සමස්ථ වශයෙන් බෙදන්න පුලුවන් එළවලු ප්‍රමාණයක් එතන ආවෙත් නැහැ. ඒක අර ක්‍රියාව ඉක්මනින් සිදු විය යුතු නිසා දුර දිග බලන්න අමතක වෙන්න ඇති කියල තමයි මම හිතන්නෙ. එතනදි මම දකින්නෙ මෙහෙම කටයුතු කරද්දි අඩුපාඩුකම් තියෙනවා.

ඒ පාර අපේ චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා. එළවලු වඳ බීජ ඇට මොකක්ද එකක් කිව්වා. හැබැයි මෙහෙමයි ඒ එළවලු බීජ ලබා දීමේදී මම දකින්නෙ මම ඒ බීජ ඇට පැකට් බෙදල දුන්නා. එතකොට ඒ බීජය සිටවන ක්‍රමවේදය දන්න අයට තමයි බීජය පැල වෙන්නෙ. නැති කෙනෙකුට බීජ ඇටය දුන්නට සාමාන්‍යයෙන් බීජ ඇටයක ගණකමින් දෙකහමාරක් යටට තමයි අපි බීජ ඇටයක් දාන්න ඕන. එතකොට ඒ දැනුවත් කිරීමේ පත්‍රිකාවක් තිබුනෙ නැති නිසා සමහර විට එහෙම වෙන්න ඇති. ඔබතුමා කිව්වට මේ හොඳ බීජ ආවෙ. අද වෙනකොට එල දරලා තියෙනවා. අපේ නිවෙස්වල තියෙනවා ඒකෙ එල දරපුවා. ඒක නිසා එක ඇටයක් දෙකක් විතරක් වඳ වෙන්න බැහැ එක්කෙනෙකුට දෙන්නෙකුට ගිහිපුවයි කියලා. ඉතිං ඒක පුලුවන් විදිහට ඒ ඇට බෙදා දීම පිළිබඳව නම් ගැටලුවක් නැහැ. මම හිතන්නෙ මේ ලක්ෂ 10 ක කතාවක් තිබුනට ඒකෙන් පහක් අරගෙන ඒකෙනුත් දෙකක් වගේ වියදම් කරල තමයි මේ විශාල වශයෙන් මේ මාස තුනක කාලයක් මේ වෙල තියෙන්නෙ හැබැයි මම මුලින් ඕකට විරුද්ධව හිටියෙ. මොකද මම දන්නෙ

නැහැ මේ මොහොත වෙනකම්ම පැහැදිලි වුනේ නැහැ. ඒ පැහැදිලි නොකිරීම පිළිබඳව අපට ලොකු ගැටලුවක් තිබුනා. ඒක පැහැදිලි කරල තිබුන නම් එහෙම නම් අපි කවදාවත් ඔය පිළිබඳව කතා කරන්න වෙන්නෙම නැහැ. ඒක නිසා අඩුපාඩුවක් තිබුන කියන එක මේව කරගෙන මින් ඉදිරියට අපි සියලු දෙනාම එකතුවෙලා මේ වැඩ කටයුතු කරමු. මොකද අපි සමාජ සේවකයො වශයෙන් ඇවිල්ලා විවිධ මත ඉදිරිපත් කරනවා. ඒ මත ඉදිරිපත් කිරීම හොඳයි. නැත්නම් අපට වැරදි අඩුපාඩු හදාගන්න බැරි වෙනවා. ඒ පිළිබඳවත් සිහිපත් කරමින් සියලු දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. දීර්ඝ කාලයකට පසු කොට්ඨාසය පිළිබඳව ගැටලු තිබෙන නිසා කතා කරන්න අදහස් කළා. ඒ නිසා මම පළමු කොටම කතා කරන්න අදහස් කළේ උඩුගම පෙරපාසල හා උප කාර්යාලය සම්බන්ධව. ගරු සභාපතිතුමනි ඒක මේ සභාවට ආපු දින සිට කතා කරපු මාතෘකාවක්. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මේ වන විට පෙරපාසල අවට තියෙන පහසුකම් එක්ක කරගෙන යාමට නොහැකි වෙලා තියෙනවා. ගිය අවුරුද්දෙත් උපමාන පාදක, පළාත් පාලන ආයතනයෙන් ලක්ෂ තුනක් ඇවිල්ලා. ආයිත් හැරිලා ගිහිල්ලා ආයෙ නැවත කැරකිලා. කොහොම හරි ලක්ෂ තුනේ මුදල සභාවට ඇවිල්ලා තියෙනවා. සභාපතිතුමනි, මෙම ලක්ෂ තුනේ මුදල උප කාර්යාලය සදහාද යොදවන්නෙ? පරන පෙරපාසල සදහාද? කියන එක මට ඔබතුමාගෙන් දැන් දැනගන්න අවශ්‍ය වෙනවා. ගරු සභාපතිතුමනි, අභියාචනා කරන්න කරුණු සාධක ඕන තරම් තියෙනවා. හේතුව තමයි දැනට තියෙන පෙරපාසලට වඩා උඩ තියෙන කාර්යාලය ඉතාමත් පහසුකම් සහිතයි. මොකද ගිය අවුරුද්දට කලින් අවුරුද්දෙ ලක්ෂ 15 ක මුදලින් වැසිකිලි පද්ධතියක් කරලා තවමත් නිකන් තියෙනවා. එතකොට ඒ පංති කාමර දෙක පටන් ගන්න පුලුවන් ඉඩකඩ පහසුකම් තියෙනවා. නිරෝධායන නීතිරීති අනුව පෙරපාසලේ කටයුතු කරගන්න පුලුවන් වාතාවරණයක් එතන තියෙනවා. මම හිතනවා මේක සංශෝධනය කරලා මේ පිළිබද කරුණු පළාත්පාලන ආයතනය වෙත දක්වලා , ගිය අවුරුද්දෙ වගේ මේ ලක්ෂ තුන අහක යන්න දෙන්නෙ නැතුව, උපකාර්යාලයේ වහල හරි සංවර්ධනය කරන්න කටයුතු කරන්න කියල ඉල්ලමින්, ඒ වගේම තමයි දැනට පවතින පෙරපාසලට මේ රජයේ මුදලින් රුපියලක්වත් ඉදිරියට වියදම් කරන්න එපා. මොකද හේතුව එම ස්ථානයේ වටිනා කියන ඉඩමක් බව මම මේ සභාවට ආපු පළවෙනි දවසෙම මතක් කර සිටියා. අද උඩුගම තියෙන ඉඩම්වල ගණන් ඇහුවම ගරු සභාපතිතුමනි, ඒ වගේ ගණන්වලට ගන්න ඉඩම් ගාල්ලෙත් නැහැ. ඒ නිසා ඒ වටිනා කියන භූමි භාගය ඉදිරියෙදී අපට මේ සභාවේ ආදායම උත්පාදනය කරගැනීමේ ස්ථානයක් බවට පත්වෙනවා. මම හිතනවා අදට අපට සල්ලි නැතත් ඉදිරියෙදි අපේ සභාවට ලොකු ආදායමක් උත්පාදනය කර ගැනීමේ හැකියාවක් ඔය භූමිය තුල අපට තියෙනවා. ඒ නිසා ඉදිරියෙදි සංවර්ධන කටයුතු කිරීමෙදි පරණ පෙරපාසලට කිසිදු රජයේ මුදලක් නොයොදවන ලෙස මා ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමනි, ආපු දවසෙ ඉදල කතා කරන පොල ගැන මතක් කරන්න කැමතියි. ඇත්තටම මේ සභාවට දන්වන්න කැමතියි. ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට ප්‍රකාරව සපිරි ගමක් වැඩ සටහන යටතේ 218 උඩුගම බටහිර ග්‍රාම නිලධාරී වසමට ආපු ලක්ෂ 20 න් 10 ක් මම උඩුගම පොල සංවර්ධනයට දාලා මේ වන විට සංවර්ධන කටයුතු කරමින් පවතිනවා. සභාපතිතුමනි, මීට කලින් රුපියල් ලක්ෂයක විමධ්‍යගත මුදල් අරගෙන මම කඩකාමර පහක් හැදුවා. ඔබතුමා වහල ගහනවයි කියලා පොරොන්දුක් මත. මම කිව්වෙ සභාපතිතුමා ලක්ෂයයි හම්බ වුනේ. ඔබතුමා දන්නවා හොදටම මේ පොල හදන්න වුවමනාව තියෙනවයි කියලා. සභාපතිතුමා විමධ්‍යගත අරමුදල් ලක්ෂයක් දාල තමයි ඔය කඩකාමර පහ කනු දාල ස්ථිරවම හරියට ගැහුවෙ. එතකොට ශීට් ටිකත් මම දැක්කා අර උපකාර්යාලය ලග හැමදාමත් තියෙනවා. ලී ටිකත් අපි ලග තියෙනවනම්, ඔබතුමා ඒකට උනන්දු වෙලා

අඩුම ගණනෙ වහල ගහල දාන්න. දැන් මෙතන ලක්‍ෂ 10 න් කඩකාමර 27 ක් හැදෙනවා. සම්පූර්ණම වහල ගහලා, වැඩ නිමකරලා පීලිදාලා, ඔක්කොම කරලා. එතකොට අර විමධ්‍යගත සල්ලි ලක්ෂෙන් කරපු වහල නැතුව ඒ වැඩේ ඉවරයක් වෙන්නෙ නැති නිසා මම කියනවා සභාපතිතුමනි, ඔබතුමා ඒකට උනන්දු වෙලා වැඩකටයුතු කරන්න කියලා. මොකද හැමදාමත් ඔහොම තියාගෙන ඉන්න බැහැ. ඔය බිල්ඩින් එක හදලා අවුරුදු හයකට කිට්ටු වෙන්න එනවා. තවම බැරිවුනා අපට ඒ පැත්තට ගාල් වෙන්න. ඒක නිසා සභාපතිතුමනි, ඔබතුමාගෙ ධුරකාලය තුල මේ මහජන මුදලින් හදපු දේවල්වලට සාධාරණයක් කරන්න ඔබතුමා මේ පිළිබඳ උනන්දු වෙන්න කියලා ගෞරවයෙන් ඉල්ලනවා.

ඒ වගේම තමයි අනතුරු දායක ගස් ඉවත් කිරීම සම්බන්ධව මේ සභාවේ භූමිකාව කොහොමද කියලා අපි දන්නෙ නැහැ. හැමදාමත් ප්‍රශ්න ගොඩකට මැදි වෙච්ච සභාවක් විදිහට තමයි මම දකින්නෙ. මොකද මගේ කොට්ඨාසෙ මේ ලඟදිත් ප්‍රශ්නයක් වෙලා. තවමත් ඒ ප්‍රශ්නෙ ඉවර වුනේ නැහැ. 1987 අංක 107(1) අනතුරුදායක ගස් ඉවත් කිරීම ඔබතුමාට පැවරී ඇති බලතල අනුව මම අහනවා. මේ අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධව ඔබතුමා ගත්තු ක්‍රියාමාර්ග මොනවද කියලා. මොකද හේතුව හැමදාමත් මේ සභාවට 500 යි 1000 යි කියලා මුදල් ගෙවනවා. නමුත් තීන්දුවක් තීරණයක් නැහැ. ඒ මිනිස්සු අන්තිමට මෙහේටත් ඇවිල්ලා පොලීසියට යනවා. ඒ නිසා සභාපතිවරයාගේ බලතල මේ පනතෙ අනුව තියෙනවද? එතකොට ඒව කරන්න බැරි ඇයි. ඔබතුමාට මේකෙ සාධාරණයක් තියෙනවනම් ඒ පැත්තටයි මේ පැත්තටයි හා හා කිය කිය ඉන්නෙ නැතුව. හරි තීන්දුවක් අරගෙන ඒ ගහ ඉවත් කරන්න බලය යොදවන්නෙ නැත්තෙ ඇයි සභාපතිතුමනි. සභාපතිතුමා හොඳටම දන්නවා. සභාපතිතුමාට වදයක්ම වෙච්ච ප්‍රශ්නයක් මේක. දැන් ඔය දූරියන් ගහත් ප්‍රශ්නයක්. දැන් මේ කිතුල් ගස් දෙකක්. ඔබතුමාට පැවරී ඇති බලතල අනුව පාවිච්චි කරන්න බැරි ඇයි? පනතෙ විධිවිධාන තියෙනවා. ඔබතුමාට බලය පාවිච්චි කරන්න. ඔබතුමා ඔය පුටුවෙ වාඩි කරල තියෙන්නෙ ඒකට. නැත්නම් මේ අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධව පනතේ විධිවිධාන නැත්නම් අපි මේ සභාවක් හැටියට තීන්දු තීරණ ගන්න ඕන. මේවැයිදි අපි මොනවද මේ වගේ ප්‍රශ්නයක් ආවම කරන්නෙ කියලා. නැත්නම් පළාත් පාලණ ආයතනයෙන් විමසන්න. මෙන්න මෙතනදි අපි අතරමං වෙනවා. අපි අසරණයි. මේ ප්‍රශ්නෙදි අපි මොකක්ද කරන්න ඕන කියලා. ඒකට හැමදාම කල් මර මර ප්‍රශ්න වැලට යන්න නොදී ඊලග සභාවාරෙදිවත් මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි මෙන්න මේ හිඩැස් තියෙන තැන්වලට උත්තර දෙන්න ඔබතුමා කටයුතු කරන්න. මේ ගරු සභාවෙ යෝජනාවක් ගේන්න මේ ප්‍රශ්නවලට උත්තර දෙන්නෙ කොහොමද කියලා. ඒ නිසා සභාපතිතුමනි, ඒ පිළිබඳවත් මේ සභාවත් ඔබතුමාවත් දැනුවත් කරමින්,

අංක 218 ගමගොඩ පාර සම්බන්ධයෙන් ඔබතුමා ස්ථානීය පරික්‍ෂණයක් සඳහා මා රැගෙන ගියා. ඒක අත්‍යාවශ්‍ය කරුණක් සේ සලකා කරන්න කියලා මම යෝජනා කරනවා. මොකද ඒ පැත්ත එම ස්ථානයේ සිට කිලෝමීටර් තුනක් දක්වා පාර දිවෙනවා. ගෙවල් 29 ක් තියෙනවා. ඒ පැත්තෙ සම්පූර්ණයෙන්ම කෘෂි කාර්මික පැත්තෙන් ජීවත්වෙන පරිසරයක් තියෙන ගමක්. තේ ආදායම පාරට ගේන්න විදිහක් නැහැ. ටැක්ටරයකට ලොරියකට යන්න විදිහක් නැහැ. මිනිසුන්ගේ පොදු අවශ්‍යතා සපුරා ගන්න විදිහක් නැහැ. දැන් සති දෙකක් වෙනවා. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ බෝක්කුව හදල මිනිසුන්ට ගමන් බිමන් යන්න හැකි වෙන පරිදි තාවකාලික හෝ ස්ථිරව මේ මාර්ගය පිළිසකර කර දෙන ලෙසට.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මේක ඉතාමත්ම වැදගත් කරුණක් මම තරංග මන්ත්‍රීතුමා කතා කරපු නිරෝධායන නීති රීති උල්ලංඝනය කිරීම සම්බන්ධව ඌන පූර්ණයක් ගේන්නයි මේ සූදානම. මොකද හේතුව මම මේක උඩුගම පොලිස් ස්ථානාධිපතිතුමත් එක්කත් පුද්ගලිකව සාකච්ඡා කළා. දැන් මේ රටේ කොවිඩ් - 19 දෙවනි රැල්ලක් ආරම්භ වෙමින් පවතින මොහොතක අපි ප්‍රාදේශීය සභාවක් හැටියට නිරෝධායන නීති රීති පිළිබඳ වඩාත් සැලකිලිමත් වෙන ප්‍රාදේශීය සභාවක් වශයෙන් කටයුතු කරනවානම්, අපේ දැක්ම සහ මෙහෙවර තියෙන්නෙ ජනතාව ආරක්ෂා කිරීම නම්, ජනතාවගේ පොදු පහසුකම් සහ ඒ සියලු අත්‍යාවශ්‍ය සේවාවන් ඉටුකිරීම නම් මම හිතනවා මේ වෙලාවෙ අපි අපේ ප්‍රාදේශීය සභාවට අයිති

සියලුම මහජනතාවගේ සුරක්ෂිත භාවය පිළිබඳව වගකීමක්, වගවීමක් අනිවාර්යයෙන්ම කළ යුතුයි කියන කාරණාව පිළිබඳ විශ්වාසයෙන් ඉන්නවා. ඒක නිසා මම ජීවත් වෙන උඩුගම පුරවරයේ ලොකු ගැටලු රාශියක් තියෙනවා. පළවෙනි කාරණය තමයි දැන් පහුගිය දවස්වල සියලු බැංකුවල මුල් කාලය පුරාවට අත සෝදන්න ඔක්කොම දේවල් තිබුනා. අන්තිමට දැන් මේ ඊයෙ පෙරේද වෙනකොට ඒ සියලු දේවල් අකර්මන්‍ය වෙලා. ගානකට ගන්නෙ නැහැ. මැනේජර් ඉටි කොළයක් දාගෙන ඉන්නවා. ඕන විදිහට ගිහිල්ල ඒ වැඩටික කරනවා. ඒ පහසුකම් සපයන්න බැඳී සිටිනවා. ඒ වගේම තමයි උඩුගම ලොකු ව්‍යාපාරිකයො ඉන්නවා. ඔය සල්ලි ගෝනි ගණන් හවසට හම්බ කරන ව්‍යාපාරිකයො අත සෝදන්න සින්ක් එකක් දාන්නෙ නැහැ. උන බලන්න අවශ්‍ය වෙන උපකරණය රුපියල් දොලොස් දහස් ගණනයි වෙන්නෙ. අඩුම ගණනෙ මේ ලොකු ව්‍යාපාරිකයො ලග ඒ උපකරණයක්වත් නැහැ. සල්ලි හම්බ කරන්න විතරද අයිතිවාසිකම තියෙන්නෙ. මිනිසුන්ට ඇඳිරිනීතිය නැති වෙලාවට කඩේට ගිහිල්ල බඩු ටික අරගෙන එන්න තියෙන්න ඕන. නමුත් ඒ ව්‍යාපාරිකය දැනගන්න ඕන. මේ රටේ තියෙන නිරෝධායන නීති රීති උල්ලංගනය කරමින් තමන්ගෙ මඩිය තරකර ගන්න එක නෙවෙයි යුතුකම. මහජනතාව පිළිබඳ වගකීමක් තියෙන්න ඕන. ඒක නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ පිළිබඳ උඩුගම පොලීසිය දැනුවත් කරලා ලිපියක් යවන්න කියලා. ඔබතුමා යවන ලිපියෙ පිටපතක් මටත් ලැබෙන්න සලස්වන්න කියලා. සභාපතිතුමනි, මේ පිළිබඳව වගකීමෙන් කටයුතු කරන්න කියලා. අපි කතා කරන එක යවන්න ඕන ආයතනයක් ඇති. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ නිරෝධායන නීති රීති කඩන ව්‍යාපාරිකයො මහජනතව අසීරුතාවයට පත් කරන ව්‍යාපාරිකයො පිළිබඳව ඔබතුමාගෙ බලතල ප්‍රකාරව, වගකීමෙන් කටයුතු කරන්න කියලා නියෝගයක් දෙන්න. ඒකෙ පිටපතක් මාහට ලැබෙන්න සලස්වන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ වගේම සභාපතිතුමනි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, රාජ්‍ය නිලධාරීන්, සෞඛ්‍ය නිලධාරීන් සමග ඒ කරන මෙහෙයට මම හිතනවා අපි ප්‍රාදේශීය සභාවක් හැටියට අපට චක්‍රලේඛ එනකන් ඉන්න ඕන නැහැ. ක්‍රියාත්මක වෙන්න. ඔබතුමාට ඕනතරම් බලතල තියෙනවා. සභාපතිතුමනි, අද ඉඳල හරි මේ නීතිරීති ක්‍රියාත්මක කළොත් හොඳයි.

ඒ වගේම තමයි ඊට සමගාමී වූ ප්‍රශ්නයක් තමයි. උඩුගම පාරෙ දැන් අද ඊයෙ වෙච්ච ප්‍රශ්නයක් නෙවෙයි.උඩුගම පාසල ලග සිංහගිරි කියල ආයතනයක් තියෙනවා. එම ස්ථානයේ ඉස්කොලෙ ලග ඉඳලම බස් හෝල්ට් එක දක්වා තියෙන්නෙ කහ ඉරක්. මම ඕ අයි සී මහත්තයත් එක්ක කතා කළාම කිව්වා. මේක සභාවෙන් බෝඩ් ගහල  කරන්න ඕනෙයි කිව්වා. මම දන්නෙ නැහැ කාටද අයිති කියලා. මගේ යුතුකම විදියට මහජන පීඩාව අයින් කිරීම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු සතු භූමිකාවක් කියලා මම හිතන්නෙ. මේකට නිසි පිළිතුරක් දෙන්න ඕන. මාර්ග නීති සම්බන්ධව උඩුගම මහා විද්‍යාලය ලග ඉඳල කහ ඉරක් තියෙන්නෙ බස් හෝල්ට් එක ලගට වෙනකම්. එතන බස් හෝල්ට් එකෙයි කියල කනුවකුත් ගහල තියෙනවා. කහ ඉරකුත් තියෙනවා. කහ ඉරක් ලග වාහන නතර කරන්න බැහැ. දැන් ඔය මම කිව්ව ප්‍රධාන පෙලේ ව්‍යාපාරිකයා එම ස්ථානයේ සම්පූර්ණම ඉස්කෝලෙ ලග ඉඳල වාහන ගාල් කරනවා. බස් එකක් ආවට පස්සෙ හෝල්ට් එකේ ඉන්න මිනිහට බස් එකට නගින්න විදිහක් නැහැ. පොලීසියට කිව්වම පොලීසිය කියනවා. සභාවට කියන්න කියලා. සභාවෙන් බෝඩ් දාන්න කියලා. මේකෙ අයිතිය සභාපතිවරයාටද, පොලිස්ථානයටද, කාටද තියෙන්නෙ කියලා මම දන්නෙ නැහැ. මේ පිළිබඳව උඩුගම මාර්ගය පිළිබඳව ලොකු ගැටලු රාශියක් තියෙනවා. ඒක නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ මහජන පීඩාව අයින් කරල දෙන්න. මේ මිනිස්සුන්ට පාරෙ ඉඳල බස් එකට ගොඩ වෙන්න පුලුවන් වාතාවරණයක් හදන්න. බස් එක නවත්තන්නෙ පාරෙ හෝල්ට් එකට තියෙන ස්ථානයේ නෙවෙයි. මොකද අර කහ ඉර ගහපු ටිකේ ඔක්කොම වාහන නවත්තලා. මේ රටේ නීතිය එක එක්කෙනාට ඕන විදිහට, ව්‍යාපාරිකයන්ට ඕන විදිහට, රටේ නීතිය නවන්න බැහැ. සභාපතිතුමනි, මාර්ග නීති කියන එක හැමෝටම පොදු වෙන්න ඕන.

ඒ වගේම ඔබතුමා මතක් කළා මම පාරක් සංවර්ධනය කරීමේදී, අපේ සමන් මන්ත්‍රීතුමාලගෙ ගෙවල් හරියෙ ඉන්න සමන්ත මහත්තයගෙ ඉඩමට අසාධාරණයක් වුනයි කියලා. ඒ සම්බන්ධව මම අර්ථ නිරූපනයක් කරන්න ඕන. සභාපතිතුමනි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙ සෞභාග්‍යයේ දැක්ම යටතේ සපිරිගමක් යටතේ ගමගොඩ හන්දියේ සිට කාබිල් වත්ත මාර්ගයේ කොටසක් දක්වා සංවර්ධනය කරන්න දැම්මෙ. එතනදි අපට අඩි 26 ක් ඉතුරු වුනා. ඒ අඩි 26 එතනට යාබදවම තියෙන අඩි අටේ පාරකට අපි දැම්මා. දාන කොට සමන්ත මහත්තයගෙ ඉඩමක් තියෙනවා. වැල් වැව්ලා, කැලෑව වැවිලා පාරට හෝදගෙන ඇවිල්ලා. නමුත් අපි ජේ සී බී කරනකොට ඒක අපි අඩි අටේ පාරට තමයි ජේ සී බී කරගෙන ගියේ. ඒක මේ සභාවෙත් ඒ පාර තියෙනවා. ඒක නිසා අපි එතුමගෙ ඉඩමට හානියක් කළේ නැහැ. හානියක් වෙලා තියෙනවනම්, එතුමට කියන්න එතුමගෙ සින්නක්කර ඉඩම් නම්, ඉඩම මැනගෙන නීතිය අනුව වැඩ කරන්න කියලා. නමුත් මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා. ඒ පාර මිනිස්සු භාවිතා කරන අඩි අටේ පාරක්. එතනින් පස්සෙ ඒ මනුස්සය වැට ගහන කොට ගමේ මිනිස්සුත් එක්ක ප්‍රශ්න හදා ගන්න එකට අපට කරන්න දෙයක් නැහැ. ඒක නිසා එතනදි මම නිවැරදිව කටයුතු කළා. තාක්ෂණ නිලධාරීන් නිවැරදිව කටයුතු කරල තියෙනවා. එතුමගෙ ඉඩම කෙලින්ම කොන්ක්‍රීට් වෙලත් නැහැ. නමුත් ජේ සී බී එකේ කුල්ල ගහගෙන ගිහිපු එකේ පාර විතරයි තියෙන්නෙ. අපි බැදී නැහැ එක එක ඉඩම්වලට තාප්ප දාල දෙන්න. ඒක නිසා මම ඒ කාරණාව ප්‍රතික්ෂේප කරනවා. එයාට ඕනනම් ඉඩම මැනගෙන තමන්ගෙ භුක්තිය තියෙන විදිහට කොටු කර ගන්න කියන්න.

ඒ වගේම තමයි සභාපතිතුමනි, අදාහනාගාරයක් කියන බලාපොරොත්තුව. අපි ආපු දවසෙ ඉදල මහා බලාපොරොත්තු කන්දක් පොදි බැදගෙන අපි සියලු දෙනාම බලාගෙන හිටිය තවමත් නැහැ. මම දන්නෙ නැහැ ඒකෙ දැනට තියෙන වර්ථමාන තත්වය පිළිබදව. කොහොම වුනත් ආදාහනාගාරයට මිනිස්සුන්ට ගේනන වෙන්නත් පුලුවන් බැරි වෙන්නත් පුලුවන්. නමුත් අපේ ප්‍රදේශයේ සියලු දෙනාටම පර්චස් 30 ක් 20 ක් 10 ක් වගේ පොඩි බිම් කැබලි තියෙන්නෙ. ඒක නිසා අද උඩුගම ප්‍රදේශය ගත්තම සියලු දෙනාටම මැරුණට පස්සෙ මිහිදන් කරන්න තැනක් නැතිවෙන තත්වයක් දැන් උදා වෙලා තියෙන්නෙ. උඩුගම කුරුන්ද මගේ ගෙවල් ලග තියෙන සුසාන භූමිය ගත්තොත් පෙර කාලෙ ඉදලම දැන් තේ වතු වවලා, ගෙවල් හදලා, ප්‍රජා ශාලාව අවට මරණයක් වලලාන්න පර්චස් පහක්වත් නැහැ. එක මරණයක් වෙලා වලක් හාරනකොට තව දෙකක් අහුවුනා. මම හිතනවා සභාපතිතුමනි, අපේ දැක්ම සහ මෙහෙවර යටතේ තියෙන්නෙ උපතේ සිට මරණය දක්වා පහසුකම් සැපයීම නම් මරණයේදීවත් අපට වලලා දාන්නවත් තැනක් අපේ ජනතාවට දෙන්න බැරිනම් අපේ දැක්ම සහ මෙහෙවර කියන එකට අර්ථකථනයක් දෙන්නෙ කොහොමද? උපතේ සිට මරණය දක්වා පහසුකම් සලසනවා කියලා. ඒක නිසා මම හිතනවා මේ ප්‍රශ්නෙ අනිත් කොට්ඨාසවලටත් ඇති. ඒ නිසා අපිට මේකට ඇප්තොප් වත්තෙන් ඉඩම් කැබැල්ලක් ගන්න පුලුවන්. අපට පවරා ගැනීම් කටයුතු කරන්න පුලුවන්. එතකොට වටවල වැව්ලි සමාගමෙන් අපට ඉඩමක් ගන්න පුලුවන්. ඒ නිසා ඔබතුමා මේ සම්බන්ධවත් කටයුතු කළයි කියලා විශ්වාසයෙන් ඔබ සියලු දෙනාටම සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම ධනංජය මන්ත්‍රීතුමා අසනීපයෙන් ඉන්නෙ එතුමට නිවාඩු අනුමත කරල දෙන්න කියලා ඉල්ලා සිටිමිනුත්, වනිගරත්ත මන්ත්‍රීතුමාටත් නිවාඩු අනුමත කරල දෙන්න කියල ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා බොහොමත්ම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමනි, මගේ කතාව වෙලාවෙ මට පොඩි අඩුපාඩුවක් කියන්න බැරි වුනා. අපේ කැප්පිටියාගොඩ ප්‍රදේශය තුල ගල් කොරියක් තිබුනා. පසුගිය කාලය තුල නායයාමත් සමගම ඒ ගල් කොරියෙ වැඩ ජනතාවගේ දැඩි විරෝදතාවයන් මත නතර කරීම සිදු කළා. ගරුසභාපතිතුමනි, ආයි නැවත මේ දිනවල එම ගල් කොරියේ වැඩ පටන් ගැනීමේ කටයුත්ත ආරම්භ කිරීමක් සිදු කරල කියල තමයි

ආරංචිය තියෙන්නෙ. මේ වන විටත් ඒ සම්බන්ධව ජනතාවගේ දැඩි විරෝදයක් පළ කරල තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, සභාවෙන් ගත හැකි ක්‍රියාදාමයක් තියෙනවනම්, ඒ වෙනුවෙන් සියලු ක්‍රියාදාමයන් ගන්න ලෙස ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගෙන් ලේකම්තුමිය ප්‍රධාන සභාවේ කාර්යය මණ්ඩලයෙන් අවසරයි. මම අද දවසේ මුලින්ම සඳහන් කරන්න ඕන. පසුගිය කාලයේ මුලු ලෝකය පුරා පැතිරී ගිය මේ කොවිඩ් වසංගතය. ලෝකය පුරා සීග්‍රයෙන් පැතරී යන කාල වකවානුවක මම ගිය සභාවෙ කතා කළා වගේ යම් මට්ටමකට පාලනය කරන්න. අපේ රටේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ සෞඛ්‍ය අංශ සියලු දෙනාගේ සහ පවතින රජයේත් දැඩි කැපවීම මත හැකියාව ලැබුනා. හැබැයි අද වෙන කොට අපි දකිනවා නැවත වාරයක් මේ කොවිඩ් - 19 වසංගතය අපේ රට තුල ඉතාමත් සීග්‍රයෙන් පැතිර යන්න අවස්ථාවක් යෙදිල තියෙනවා. හැබැයි සභාපතිතුමනි, මේකෙ වගකීම වත්මන් රජය තනිකරම භාර ගන්න ඕන. සෞඛ්‍ය නීති රීති වලට පටහැනිව මේ හදිසි මැතිවරණයකට ගමන් කරන්න ගිහිල්ලා. ඒ වගේම විදේශ රටවල ඉන්න අපේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් මුල් අවදියෙ පරීක්‍ෂාවකින් තොරව ලංකාවට ගෙනැල්ලා, මේ කරන ලද ක්‍රියාදාමයන් නිසා පහුගිය කාලෙ අපි බලාපොරොත්තුව හිටියා. මේ වසංගතයට අපේ ලංකාවෙ මිනිස්සුන්ට මුහුණ දෙන්න හැකියි කියලා. මොකද ශක්තිමත් මිනිස්සු හැටියට ලංකාවෙ තියෙන දේශගුණයත් එක්ක අපි හිතුවා ලංකාවේ අපේ මිනිස්සුන්ට මේක පැතිරෙන එකක් නැත කියලා. හැබැයි අද මේ හදිසි රජය ගනිපු තීන්දු තීරණත් එක්ක අපි දකිනව අද අපේ ප්‍රදේශවලටත් මේ අහල පහලට මේ රෝගය පැතිරෙමින් පවතිනවා. මම හිතනවා මේ සභාවෙ කිහිප දෙනෙක් කතා කළා වගේ සභාව හැටියට අපි දැඩි අවදානයෙන් සිටිය යුතුයි. අපි අපේ පළාත බේර ගන්න. ඒකෙ යුතුකම තියෙන්නෙ ප්‍රදේශයේ ප්‍රධාන පුරවැසිය හැටියට සභාපතිතුමා ඇතුලු සභාවට. ඔබතුමා සඳහන් කළා. ගරු ආණ්ඩුකාරතුමා විසින් මේ කොවිඩ් වසංගතය නිසා ව්‍යසනයට පත්වෙච්ච ජනතාවට සහන දෙන්න ලක්‍ෂ 10 ක මුදලක් ලැබිලයි කියලා. ඒකෙන් මුදල් වියදම් කරපු ආකාරය මේවන විට කතා බහකටත් ලක් වුනා. හැබැයි මම හිතනවා සභාපතිතුමනි, මේ ලැබිච්ච මුදලින් සභාවෙ පරිපාලනයට මේ මුදල් යොදා ගන්නෙ නැතුව. ඒ මුදල දීපු අදහසට ඒ වගේම මේ ජනතාවට සහන දෙන්න ඒ සඳහා අපි පසුගිය කාලෙ ගත්ත ක්‍රියාමාර්ගවලට එහා ගිහිල්ලා, ඒ වගේම මේ රෝගයට අපේ ප්‍රදේශයේ ජනතාව ගොදුරු නොවන්නට යම් වැඩපිළිවෙලක් යොදවන්න, මේ මුදල් යොදා ගන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද මේ වෙලාවෙ හැටියට අපට වැටහෙනවා මුල් අවදියෙදි වගේ නෙවෙයි. අද අපේ පළාත්වල ජනතාව මේ කොවිඩ් සෞඛ්‍ය නීති රීති යම් මට්ටමකට අමතක කරල තියෙනවා. ඒ පිළිබඳ තැකීමක් නැහැ. ඒක නිසා මේ වෙලාවෙ මේ භයානක තත්වය සීග්‍රයෙන් පැතිර යන්න අවකාශය තිබෙනවයි කියල සිහිපත් කරනවා. ඒ පිළිබඳ මම එපමණයි කතා කරන්නෙ.

ගරු සභාපතිතුමනි, මම පහුගිය කාලෙත් කිව්වා. මුලන වාඩියකන්ද පාරේ එක් ස්ථානයක කොන්ක්‍රීට් පාර පුපුරලා බෝක්කුවකුත් එක්ක ඒ වේල්ල කැඩීයාමට ලක්වෙලා තියෙනවයි කියලා. දැන් අවුරුද්දකට ආසන්න කාලයක් මම මේ පිළිබඳව ඔබතුමාට සිහිපත් කළා. නමුත් ඒ පිළිබඳ ක්‍රියාමාර්ගයක් ගත්තෙ නැහැ. මම අහගෙන හිටියා මේ අනිත් අපේ මන්ත්‍රීතුමන්ලගෙ, මන්ත්‍රීතුමියන්ලගෙ ප්‍රදේශවල එවන් අවස්ථාවන් ඉෂ්ඨ සිද්ද කරල දෙනවා. හැබැයි මේක ඔබතුමාගේ බල ප්‍රදේශයට අල්ලපු බල ප්‍රදේශයේ තියෙන කටයුත්තක් මේ පිළිබඳව අවදානය යොමු කරන්න. ඒ වගේම මුලන වාඩියකන්ද මාර්ගයේ, අන්නාසිගලහේන මුලන මාර්ගයේ වාඩිය කන්ද මාර්ගයට හැරෙන ස්ථානයේම එතන පාර සම්බන්ධවෙන මුල්ම ස්ථානයේ බෝක්කුවක් තියෙනවා. ඒ බෝක්කුව කැඩිලා තියෙනවා. ඔබතුමා දැනුවත් කරල ඔබතුමාට ලිපියකිනුත් ඒ ස්ථානයේ අය දැනුවත් කරල තියෙනවා. ඒ පිළිබඳ ඉක්මන් තීරණයක් ගන්න. මොකද වහින කාලෙට පාර උඩින් තමයි වතුර පාර යන්නෙ. බෝක්කුව ඇහිරිල තියෙන්නෙ. මේ පිළිබඳ ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමනි, මේ සභාවෙ තියෙන ඡායා පිටත් යන්ත්‍ර පිළිබඳ මම මේ සභාවෙ වාර්තාවල් හැම එකකම බැලුවා. හැම මාසෙකම තියෙනවා. මේ ටෝනර් යන්ත්‍ර මිල දී ගැනීම්. මම අහන්න කැමතියි සභාපතිතුමනි, මේ ටෝනර් එකක් මාසෙද පාවිච්චි කරන්න පුලුවන් කියලා. මොකද නිතරම දැන් මේ අදත් තියෙනවා. රුපියල් 15000 හෙ එකකුයි 25000 ක්ද කොහෙද දාල තියෙනවා. මේ ටෝනර් යන්ත්‍ර මිලදී ගන්න බිල් දාපුවා. මේ පිළිබඳව මොකද අපිට මේ සභාවෙන් ලබාදෙන වාර්තාවෙ පිටපතත් පිටින් තමයි ගහන්නෙ. හැබැයි සභාවට අවශ්‍ය මේ මැෂින්වලට සියලු අවශ්‍ය උපාංග ලබාගෙන තියෙනවා. එතකොට මේවයින් මොනවද කරන්නෙ සභාවට අයත් ලිය කියවිලි ගහනවද නැත්නම් මේවට මෙච්චර වියදමක් යන්නෙ මොකද අපට ලැබෙන වාර්තාවත් පිටින් ගහන කොට මෙච්චර කාලයක් තුල මෙච්චර ඉක්මනට මේවා අබලන් වෙනවද කියලා. ඒ පිළිබඳ ඔබතුමාගෙ අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමනි, මම මේ වෙලාවෙ සිහිපත් කරන්න ඕන. ඔබතුමත් යම් ස්ථානයක මළ ගෙදරක කතාවක් වෙන කොට ඔබතුමත් හිටියා එතන. මොකද අපේ පළාත්වල දැන් සීග්‍රයෙන් පැතිර යනවා. ක්ෂණික කෝපය මත සිය දිවි හානි කර ගැනීම්. හැබැයි මේක දැන් අපි බලන් හිටියා ටික කාලයක් තුල එකම වයසේ ජීවිතක්ෂයට පත් වුනා. මුලන වාඩිය කන්දෙ ඊයෙ පෙරේද ඔබතුමා සම්බන්ධ වුන අර ගයාන් මල්ලි ඊට එහා කපල්විලේ මේ වගේ ගමේ කඩේ පුස්කුඩු නැමති රසායණික ද්‍රව්‍යය ගමේ අද හාල් සීනි විකුණන්න වගේ හැම කඩේකම විකුණන්න තියෙනවා. හැබැයි මේක පිළිබඳ බලධාරීන්වත් රජයවත් දැනුවත් වෙන්නෙ නැහැ. මෙන්න මේ ක්‍රියාදාමය නිසා මේ අපේ ගමේ ඉන්න තරුණ තරුණියන් ක්ෂණිකව තමන්ට හිතට නැගෙන කේන්තිය ක්ෂණිකව විසදා ගන්න තැනක් වෙල තියෙනවා මේ පුස් කුඩු බීලා වටිනා ජීවිත ඒ වගේම වටිනා දරු පවුල් පහුගිය දවස්වල මැරුණා. ඒ දරුවගෙ පුංචි ළමයි දෙන්නෙක් ඉන්නවා. මේ ක්ෂණිකම තමන්ට ව්‍යාපාරික ස්ථානයෙන් ලබා ගන්න පුලුවන් වුනාම ක්ෂණිකව පාවිච්චි කරන දේවල් ඒක හින්ද මම යෝජනාවක් හැටියට සභාවෙ ගේනවා. නගරෙ තියෙන ප්‍රධාන කඩවල්වල මේව විකුණන්න තිබුනට කමක් නැහැ. ග්‍රාමීය මට්ටමේ තියෙන කුඩා කඩවල්වල තියෙන ව්‍යාපාරික ස්ථානවලින් මේවා විකිණීමට නොසුදුසු දෙයක් හැටියට හැගෙන යම් වැඩ පිළිවෙලක් යොදන්න කියලා. මොකද මේ ජනතාව අපට ඉතාමත් වටිනවා. අපිට මේ පළාතෙ ඉන්න මිනිස්සු තමයි වටින්නෙ. මේ මනුස්ස ජීවිතයක් ලබා ගන්න කොච්චර අපහසු වුනත් ඒ ජීවිතය නැති කර ගන්න සුළු වේලාවකින් අපේ ජනතාව පෙළඹෙනව ඒක නිසා මේ පිළිබඳ ඔබතුමන්ගේ අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

මේ වෙලාවෙ මැතිවරණ කාලයක් තියෙන්නෙ. ඉදිරි මහ මැතිවරණය හැබැයි අද දකිනවා මේ මැතිවරණ නීති රීති උල්ලංගනය කරමින් මැතිවරණ නීති රීතිවලට පටහැනිව අද ග්‍රාමීය මංමාවත් පාරවල් ඇස්තමේන්තු ගත කරනවා. සමහරක් ඒව වැඩ කරනවා. හැබැයි මම දකිනවා පහුගිය මැතිවරණ කාලවලදි මේවා මැතිවරණ නීති උල්ලංගනය කරන ඒව හැටියට තමයි සඳහන් වුනේ. හැබැයි අද මේ වත්මන් රජය යටතේ මාර්ග ඇස්තමේන්තු කිරීම් ඒ වගේම නිලධාරි යොදවල මැනුම් කටයුතු කරලා, ජනතාව නොමග යවන ආකාරයට කටයුතු කරනවා. හැබැයි මම හිතනවා මේ රටේ මැතිවරණ කොමිශන් තියෙනවා. ඒ වගේම ඒවට වග කියන ප්‍රාදේශීය මට්ටමේ නිලධාරි ඉන්නවා. මේ පිළිබඳ ඒ අය දැනුවත් වුනත් එ අය ඒ පිළිබඳ ක්‍රියාමාර්ග ගන්නෙ නැහැ. සමහර විට රජයේ බලපෑම් මතද කියලා අපට හිතාගන්න බැහැ. ඒ වගේම සභාපතිතුමනි, කීප දෙනෙක් කතා කළා වගේ අද කුඹුරු වගාවටත්, තේ වගාවටත් අවශ්‍ය පොහොර නැහැ. මම දැක්ක පහුගිය දවස්වල කුඹුරුවලට කුඹුරු පොහොර නැතුව සමහර අය තේ වලට ගහන යූ 709 හොයාගෙන තමයි කුඹුරට ගැහුවෙ. මොකද කුඹුරුවලට තේ වලට වගේ නෙවෙයි අවශ්‍ය වෙලාවට අවභ්‍ය පොහොර ලබා දෙන්න ඕන. ඒ පහසුකම් නොමැතිව මේ සෞභාග්‍යයේ දැක්ම කියලා රජය මොන මොන ආකාරයෙන් කටයුතු කළත් වැඩක් නැහැ. මුලින් කුඹුරු වගා කරන්න උනන්දු කළත්, කුඹුරුවලට අවශ්‍ය පොහොර ඒ අවශ්‍ය ප්‍රමාණයට ලබා ගන්න අද ජනතාවට බැරි වෙලා තියෙනවා. සමහර කුඹුරු පොහොර නැතුව අවශ්‍ය ආකාරයට අස්වද්දන්න බැරුව තියෙනවා. අපි දැකල තියෙනවා. මම හිතනවා මේ වෙලාවෙ මම දීර්ඝව කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මේ වෙලාවෙ මම මුලින් සඳහන් කළා වගේ

ඉදිරියෙදි මේ රට පුරා නැවත වාරයක් පැතිරයන කොවිඩ් වසංගතය පාලනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ගත හකි උපරිම ක්‍රියාමාර්ග අරගෙන අපේ පළාතේ ජනතාවගේ රැක වරණය අපි ලබා දෙන්න කටයුතු කරමුයි කියලා ඉල්ලා සිටිමින්, ඔබ සියලු දෙනාට තෙරුවන් සරණ පතමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

මූලාසනයේ ගරු සභාපතිතුමනි, නාගොඩ මංසන්දියේ සිට උඩවැලිවිටිය රැකඩහේන දක්වා ගමන් කරන මාර්ගය ඊයෙ පෙරේදා ආර් ඩී ඒ එකෙන් මැන්නා. ඒ නිසා එම මාර්ගය ප්‍රාදේශීය සභාව සතු පාරක් බැවින් එම මාර්ගය පුළුල් කර සංවර්ධනය කරල දෙන්න කියල ප්‍රාදේශිය ලේකම් තුමියගෙන් ඉල්ලීමක් කරන්න කියලා මේ වෙලාවේ ඔබතුමාගෙන් මම පළමුවෙන්ම ඉල්ලා සිටිනවා. ඒ වගේම ප්‍රියන්ති මන්ත්‍රීතුමිය කියපු ගල් කොරිය සම්බන්ධයෙන් පොඩි ගැටලුවක් තියෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගෙ විශේෂ අවදානයක් යොමු කරන්න කියන ඉල්ලීමත් මේ වෙලාවෙ සිදු කරනවා.

ඒ වගේම පසුගිය වකවානුව තුල කොරෝනා වෛරසයෙන් සියලු දෙනා අවතැන් වුන වෙලාවෙ සභාවක් හැටියට මේ වෙලාවෙ ඉස්සරවෙලා කතා බහ වුන දෙයක් නැවත මතක් කිරීමක් නෙවෙයි කරන්නෙ. ඒ නිසා අපේ සභාවේ ඒ කාලය තුල ඔබ මෙහි රැඳී සිටියා නම් එසේත් නැතිනම් ඔබ මේ ප්‍රදේශය තුල විශේෂයෙන් ප්‍රාදේශීය සභාව විතරක් නෙවෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුල, මේ කටයුතු සිදුවෙන අවස්ථාවල මේ පිළිබඳ අවදානයෙන් සිටියා නම්, අද මේ වගේ කතා කරන එකත් ලැජ්ජා සහගතයි කියලා මම හිතනවා. මොකද අපි සම්බන්ධ වුනාට සභාපතිතුමනි හැම වෙලාවෙම සද්භාවයෙන් මේ කටයුතු සිදු කළේ. ඒ නිසා මේ කටයුතු විනිවිධ භාවයකින් සිදු කළා. මේ ගාල්ල දිස්ත්‍රික්කය තුල, මේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කිරීම නොකිරීම පිළිබඳව නෙවෙයි මම කියන්නෙ. මේ කරපු වැඩපිළිවෙල පිළිබඳව. ඉතාම අඩු වියදමකින් විශාල වැඩ කොටසක් කළා. මොකද පියල් මන්ත්‍රීතුමා ඒ දවස් ටිකේ වතුර බවුසරෙන් බැස්සෙ නැහැ. මාපලගම නිතරම වතුර බවුසරේ හැම තැනම එහෙමයි. උඩුගම පැත්තෙ හැම තැනම වතුර ලබා දෙන්න මේ ප්‍රාදේශීය සභාවේ සුලු සේවකයින් එදා ඒ වෙලාවෙ පුදුම කැපකිරීමක් කළා. ඒ වගේම අනිත් සේවකයන්ට මෙහේට එන්න ඉඩකඩ ලැබුනෙ නැහැ. ඒ නිසා සමහර වෙලාවට එතනදි ලොකු අර්ථකතනයක් වුනා නිලධාරීන් මේව දන්නෙ නැහැ කියලා. ඒ වගේ ලොකු චෝදනා ගොඩක් නැගුනා. චෝදනාවලට පිළිතුරක් ලබා දීමත් අපේ යුතුකමක් වෙනවා. ඒ නිසා ඒ වෙලාවෙ දැඩි පීඩනයකට ලක්වුනා. දෙන්නෙක් දෙපැත්තෙන් ඉඳගෙන මට කතා කරන්න දුන්නෙම නැහැ. කොහෙම වුනත් මම සඳහන් කරන්න ඕන. ඒ වෙලාවෙ සමහර වෙලාවට අපි බඩගින්නෙ හිටපු අවස්ථාවනුත් තිබුනා. එක දවසක් ප්‍රියන්ති මන්ත්‍රීතුමිය රෑ 12.00 ටත් කෑම ගෙනත් දුන්නා. ඒ වගේම මේක මම හිතන්නෙ කතා කළ යුතු දෙයක් නොවුනත් ඒ වෙලාවෙ ආණ්ඩුකාරවරයා චක්‍රලේඛයක් එවල තිබුනා. චක්‍රලේඛයට අනුව කටයුතු සිදුකළා. හැබැයි මමත් පිළිගන්නවා. අපි එලවලු ටික ගේනවයි කියලා. උප සභාපතිතුමා සුභාෂි මන්ත්‍රීතුමියට කතා කරලා කිව්වා. දැන් මෙන්න මෙහෙම එකක් කරනවා. කට්ටිය ඔක්කොම දැනුවත් කරන්න. අඩුතරමින් අපේ මන්ත්‍රීවරු ටික හරි දැනුවත් කරන්න කියලා. එක කෝල් එකයි දුන්නෙ. ෆේස් බුක් එකේ දැම්මා ඔන්න ඒ පාර එක එක්කෙනා අපිත් එකඟයි අපිත් එකඟයි කියලා දැම්මා. එකඟනම් එකඟම වෙන්න කියලා අතහැරල දාලා ඒ වැඩේ ඉතරු ටික කළා. එහෙම එකක් එතන සිදු වුනා. ඒ නිසා මේව කතා කළ යුතු දේවලුත් නෙවෙයි. හිරිකිත ලැජ්ජ හිතෙන වැඩ. මොකද මහජන නියෝජිතයො වුනහම, අපි කාටවත් දොස් කියන්නෙ නැහැ. මොන පක්ෂෙ වුනත් අපි 27 දෙනාම එකයි. මොකද මන්ත්‍රීවරු හැටියට මේ ප්‍රදේශයේ ජනතාව පත්කරල එවල තියෙන්නෙ. ඒ නිසා මේකෙ කතා දෙකක් නැහැ. අපි 27 දෙනාම ජනතාව වෙනුවෙන් පෙනී ඉන්න ඕන. ඒ නිසා කවුරු හරි කියනවනම් අපේ ගමට එලවලු මල්ලක් වත් මොකක්වත් හම්බ වුනේ නැහැ කියලා. ඊලග එක තමයි හොඳම කතාව මම මේ වෙලාවෙ කියන්න ඕන. එලවලු ටික ගෙනැල්ල අපි මුදලාලිලගෙ බඩට ගැහුවෙ නැහැ. ඒ වෙලාව වෙනකොට එලවලු 500 ක් රුපියල් 120 යි. හැමතැනම කොරෝනා වෛරසය නිසා මිනිස්සුන්ට සල්ලි ඇත්තෙත් නැහැ. මිනිස්සු ගෙවල්වලට කොටු වෙලා ඉන්නවා. එහෙම මාෆියාවක් මේ හැම තැනම තිබුනා. ඊට පස්සෙ අපි

එලවලු ගෙනැල්ලා බිස්නස් එකක් කළේ නැහැ. ඒ ගෙනාපු එලවලු සහනදායී පදනමෙන්ම ඒ මිනිස්සුන්ට ලබා දුන්නම, අන්න අර බැරි මිනිස්සුත් සියලුම දෙනා ඒ හා සමාන ගණන්වලට එලවලු දීලා සෑහෙන සහනයක් මේ ප්‍රදේශයේ සිදු වුනා. ඒ අනුව තමයි පළාත් පාලන ආයතනයේ නැත්නම් අපේ වගකීම වෙන්නෙ. කාටවත් බඩට ගැසීමක් නෙවෙයි. ඒ වගේම නාගොඩට බඩු මලු ටික අරගෙන ගියාම ඔය හැම සෙන්ටර් එකකම පෝලිම්වල සිටිය සියලුම මිනිස්සු ඇවිල්ලා අර බඩු මලු ටික ගත්තා. එතකොට මේ හැම කොට්ඨාසෙකම මිනිස්සු මේ නාගොඩ හන්දියට ඇවිල්ල හිටියා ඔය වෙලාවෙ. මාපලගමත් උනන්විටියෙත් යටලමත්තෙත් වැලිවිටියෙත් එහෙමයි. හැම තැනම මේ ගෙනියන බඩුටික ඉක්මනින්ම මිනිස්සු ගත්තා. ඇත්තටම ලවුඩ්ස් ස්පීකරයක් දාල සමහර සේවකයො කෑවෙ නැතුව සේවය කළා.

ඒ වගේම බීජ ඇට අපි මෙහෙට ගෙනැල්ලා පැකට් කරද්දි ඇත්තටම සමහර මන්ත්‍රීවරු මේකට එබිල බලල යන්න යනවා. මම මේ වෙලාවෙ මතක් කරනවා. ස්තූති වන්ත වෙනවා. ප්‍රදේශයේ පෙරපාසල් ගුරුවරු ඇවිල්ලා ඒ සඳහා සහය දැක්වුවා. මට ඕනකම තිබුනෙ මොනව හරි සේවාවක් මිනිස්සුන්ට කරන්න. ඒ නිසා මෙතනදි සභාවේ මන්ත්‍රීවරු අතරත් නිලධාරි අතරත් අප්‍රසාධයට පත්වුනේ මම තමයි මේ වැඩකටයුතු වලදි. මොකද ඒ මම අපේ සභාපතිතුමාගෙන් විශේෂ වරප්‍රසාදයක් බලාපොරොත්තුවෙන්වත් එහෙම නෙවෙයි. මේකෙ මොනව හරි කරන්න අපිට වුවමනාව තිබුනා. ඒ නිසා අපි ප්‍රාදේශීය සභාවක් විදිහට අපිට සමාජ මාධ්‍ය ජාලාවලවත් උදවු කරන්න කෙනෙක් හිටියෙ නැහැ. පටන් ගත්ත වෙලාවෙ ඉදල ගහන්න තමයි පටන් ගත්තෙ. ඒ නිසා මම මේ වෙලාවෙ පැහැදිලිව කියනවා. ගාල්ල දිස්ත්‍රික්කෙ පළාත් පාලන ආයතන ගත්තොත් අපි ලොකු සේවාවක් කළා. මොකද අපි හැම දේම බඩුමලු දීලා, මාස්ක් දීලා ඒ වගේම පී එච් අයි මහත්වරු කියන කියන තැන්වලට බෙහෙත් ගහලා, ඊලගට වතුර විශාල ප්‍රමාණයක් දීලා රුපියල් ලක්ෂ දෙකයි. බැලුවම මම අද ලොකුම කළකිරීමකට ලක් වුනා. අපි හැමෝම මේ මොන දේ කළත් ඉතාම කෙටි කාලයක් තුල අපි මැරෙනවා. ඒ නිසා මම මේ වෙලාවෙ කියනවා. අපි කොයි වෙලාවකවත් වරදාන, වරප්‍රසාද හමුවේ මේ සභාවෙ කිසි දෙයක් කෙරුවෙ නැහැ. ඒ නිසා සද්භාවයෙන් මගේ හදවතට එකගව අපි සේවයක් කළා. ඒ නිසා මම අහල බලපුවම මේ නිලධාරි කිසි කෙනෙක් අපි දන්නෙ නැහැ, අපි සම්බන්ධ නැහැ කියලා, කියල නැහැ. මේ සභාවට ඇවිල්ල ඒ නිලධාරින්ට කෑගහල කියන්න බැහැ මේ කතාව මොකක්ද කියලා. තව එකක් තියෙනවා මේ මන්ත්‍රීවරු සහ නිලධාරි අතරෙ මීට වැඩිය සුහදත්වයක් තියෙන්න ඕන. ඒක මම එදත් කිව්වා. මේකෙ වැඩසටහනක් හරි කරලා මේ අන්නෝන්‍ය සුහදත්වය වර්ධනය කරන්න ඕන. ඊලගට විශේෂයෙන්ම ඔබතුමා නායකත්වය දෙන මමත් ඉන්න අපේ මේ කණ්ඩායම පිළිබඳව සැලකිලිමත් වෙලා කටයුතු කරන්න. මේ අය පිළිබඳව මම උප සභාපතිතුමත් එක්ක මීට පෙරත් කතා කළා. මොකද අපි දන්නවා. මොන ප්‍රශ්න තිබුනත් අපි එදා 13 දෙනෙක් සභාවෙ ඉන්න කොට, ආණ්ඩු පක්ෂෙ අපි නව දෙනයි සිටියෙ. අපි නවදෙනා මොනදේ තිබුනත්, එළියෙ මොන දේ කතා කළත්, අපි යම් කතිකාවකට ඇවිල්ලා, එකගතාවයකට ඇවිල්ලා, ඒ වෙලාවෙ ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙනවා. මම කියන්නෙ මෙතන කිසිම වංචාවක් දූෂණයක් සිදු වුනේ නැහැ. මම කවදාවත් වංචාව දූෂණය සිදුවෙන තැනකට, මමත් රාජ්‍ය සේවකයෙක් හැටියට කැමති නැහැ. ඒ නිසා අපි කවදාවත් එහෙම කරන්නෙත් නැහැ. මේකෙ විශේෂයෙන් සභාපතිතුමා නායකත්වය අරගෙන කටයුතු කළා. අපේ උප සභාපතිතුමා ඊට නොදෙවනිව මේ කටයුතුවලට දායකත්වය ලබා දුන්නා. මම සද්භාවයෙන් මේ මුලු සභාව වෙනුවෙන් යම් සේවාවක් කළේ. අපි ඔය වැඩකටයුත්ත කරන්න සභාපතිතුමාට උදවුවක් දුන්නා. මම හිතනවා ඒ කටයුත්ත 100% ක්ම සාර්ථකයි. ඒ වැය පක්ෂය බැලුවත් ඔබට පේනවා. මොකක්ද අපි කරල තියෙන්නෙ කියලා. ඒ නිසා අපිනම් ශත පහකවත්, හුනු විඩකවත් දෙයක් මේකෙන් අනිසි විදිහට පරිහරණය කරලා, පාවිච්චි කරන්න අරගෙනත් නැහැ. ගත්තෙත් නැහැ. ඒ වගේම ඕනම වෙලාවක අපි සූදානම් ඔය බිල් ඉදිරිපත් කරල තියෙනවා. ඕනම පරීක්ෂණයකට ඒව ඉදිරිපත් කරල විශේෂයෙන්ම පළාත් පාලන කොමසාරිස්තුමා එවන ලද චකුලේඛ අනුව තමයි සියලු කටයුතු සිදු කරල තියෙන්නෙ. ඊලගට සමහරු ඇහුවා. ඔහොම දුන්නනම් කාටද දුන්නෙ කියලා. අපි නිකන් බඩු දුන්නනම් විතරයි ලැයිස්තුවක් ගන්න ඕන. සමහර වෙලාවට අපි අපේ අතින් බඩු ගෙනිහින් දුන්නා. සභාපතිතුමත් කීප තැනකට බඩු

ගෙනිහින් දුන්නා. මම දැක්කා සුභාෂි මන්ත්‍රීතුමියත් කීප තැනකට තමන්ගෙ අතින් ගෙනිහිල්ලා බඩු මලු දුන්නා. අපේ අනිත් මන්ත්‍රීවරුත් හැමෝම එහෙමයි ඊට අමතරව මේ සභාවෙන් කරන ලද සේවය අරයද මෙයාද කියල කියන්න බැහැ. නාගොඩ හන්දියට බඩුටික ගෙනිච්චම සමහර වෙලාවට එතනදි බඩුටික ඉවරයි. ඊට පස්සෙ තව එකක් කියන්න ඕන. අපි සතොසෙන් බඩුමලු ප්‍රමාණයක් ගත්තා. ඒ බඩු ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම්තුමියගේ අධීක්ෂණය යටතේ ඒ කටයුතු සිදු කළේ. ඒ බඩු මෙහෙම බෙදල ඉවර වෙලා සමහර වෙලාවට අපිට කෝල් ඇවිල්ලා සභාපතිතුමාට කතා කරලා, සමහර තැන්වලින් අපිට එලියට බහින්න බැහැ. අපේ පැත්තට බඩු වාහනයක් එන්නෙ නැහැ කියලා කිව්වා. ඒව හැමෝගෙම දුරකතනවලට ආවෙ නැහැ. නමුත් සභාපතිතුමා, මොනවත් කරගන්න විදිහක් නැහැ. අපට මොනව හරි එවන්න කියලා සභාපතිතුමාට අනන්තවත් මම ඉන්න අවස්ථාවලදි දුරකතනෙට ඇමතුම් ආවා. ඒ දවස්වල තත්වය දන්නවා නේද? ඒ අවස්ථාවෙදි තමයි ඔය පිට ආයතනයකින් බඩු අරගෙන එහෙම තැන්වලට යැව්වෙ. එහෙම කතා කරපු තැන්වලට යැව්වා. මේ වෙලාවෙදි මේක අමුතු අත්දැකීමක්. අපි හැමෝම ඒ අත්දැකීම වින්දා.

ඒ වගේම දැන් අපේ මන්ත්‍රීතුමාලා, මන්ත්‍රීතුමියන්ලා පොහොර පිළිබඳව සඳහන් කළා. තේරුම් ගන්න ඕන එකමදේ තවම මුලු ලෝකයම යථා තත්වයට පත්වෙලා නැහැ. මේක දේශපාලනයක් නෙවෙයි. මුලු ලෝකයම තවම මේ පිළිබඳව මේ අමුතු අත්දැකීමෙන් අතරමං වෙලා ඉන්නෙ. ඒ නිසා ඔය පොඩි පොහොර සහනාධාරයක් පිළිබඳව, පොහොර සල්ලිවලටත් නැතිලු. නිකනුත් නැතිලු. එතන මොනවහරි පොඩි ගැටලුවක් තියෙනවා. ඒ ගැටලුව හැම රටකටම ප්‍රායෝගිකව අත්විදින්න වෙන දෙයක්. ඒ වගේම තමයි දැන් මේ කොයි ආණ්ඩුව තිබුනත් මේ වෛරසය නවත්වන්න පුලුවන් කමක් නැහැ. ඇමරිකාව ඉන්දියාව වගේ රටවල් අද අසරණ වෙලා. අපි මෙහෙම හරි බේරිලා ඉන්න එක ගැන සතුටු වෙනවා. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්වරයා, පොදු සමාජයට කරුණු කාරණා කීපයක් ඉදිරිපත් කරල තියෙනවා. අනිවාර්යයෙන්ම ඒ පොදු කරුණු කාරණා ටික පිළි නොපැද්දොත් අපි ඔක්කොම අමාරුවෙ. ඒ නිසා පක්ෂ පාට බේදයෙන් තොරව, රජයන් පිළිබඳව නෙවෙයි තම තමන් තමන්ගෙ සෞඛ්‍ය පිළිබඳව අවදානය යොමු කරලා කටයුතු කළ යුතුයි. ඒ නිසා මන්ත්‍රීවරුනි, මේ වෙලාවෙ අපි මොන ප්‍රශ්න තිබුනත්, රටේ ජාතියක් හැටියට මේ ව්‍යසනයට මුහුන දෙන්න ඕන. අපි ශ්‍රී ලංකාය තව එක්කෙනෙක් තව පක්ෂෙකය එහෙම කියල මේ වෛරසය හැඳුනොත් නොමැරි ඉන්නෙ නැහැ. ඒ නිසා අපි සියලුම දෙනා මේ අභියෝගයට මුහුන දෙන්න තියෙනවා. ඒ නිසා අපි ඔබට මේ වෙලාවෙ සිහිපත් කරනවා. කවුරු මොන මන්ත්‍රීවරය මොන දේ කිව්වත් විනිවිධ භාවයකින් යුතුව අපි කටයුතු කළා. ගරු සභාපතිතුමාගෙ නායකත්වයෙන් මේ කරපු ක්‍රමවේදය අපි දැක්කා. ඒ චක්‍ර ලේඛයට අදාලව කරන්න ඕන වැඩකටයුතු ටික ඒ වෙලාවෙ නීත්‍යානුකූල විදිහට සිදු කළයි කියලා මම මේ සභාවෙ කියනවා. මේ වෙලාවෙ මම දීර්ඝ වශයෙන් කතා කරන්නෙ නැහැ.

ඊලඟට සභාපතිතුමනි, මම මුළින් සඳහන් කල පාර සම්බන්ධයෙන් විශේෂ අවදානය යොමු කරන්න. ප්‍රාදේශීය ලේකම්තුමියට ලිපියක් මගින් දන්වලා, ඒ මාර්ගය දෙපස පැහැදිලි කරල දෙන්න. ඒකෙ කාපට් එකක් යන්න. ඔබතුමා තමයි ඒකෙ විශේෂ මැදිහත්කරු. ඒ පිළිබඳ ඔබතුමාටත් ස්තූතිවන්ත වෙමින්, ඒ වගේම මේ වෙලාවෙ සභාපතිතුමනි, උඩවැලිවිටිය අර ඉනෝකා මන්ත්‍රීතුමිය කිව්ව වගේ, ඒ පාරෙ දැන් යන්න බැහැ. කරන්න දෙයක් නැහැ. මම නඩු යනවා. ඒ ගැන කවුරුත් කතා කරන්නෙ නැහැ. දැන් මඩ ගැවෙනකොට කතා කරනවා. ඒ නිසා ඒකෙ කොරිපස් ටිකක් හරි දාලා හදාගන්න ඔබතුමාගෙ කාරුණික අවදානය යොමු කරන්න කියන සිහිපත් කිරීමත් මේ වෙලාවෙ කරමින්, හැම දෙනාටම සුබ දහවල් කාලයක් පතමින්, මම නිහඬ වෙනවා.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, සියලු දෙනගෙන් අවසරයි. අපි මේ සභා වාරයෙදි වෙනත් කරුණු යටතේ කතා කරද්දි මේ පැය කීපයක කාලය තුල මේ සභාවෙ පැන නැගුන ප්‍රශ්න ගැටලු පිළිබඳව කතා කරන්න ඒව ගොඩනැනැගුන ඒ වගේම ඒව මාතෘකා වෙච්ච මන්ත්‍රීවරු මේ සභාවෙ නැතිවීම පිළිබඳව අපි කණගාටු වෙනවා. විශේෂයෙන්ම තරංග සුදර්ශන මන්ත්‍රීතුමා, ඒ වගේම සහබන්දු මන්ත්‍රීතුමා, අපේ ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර මන්ත්‍රීතුමා, සභාවෙ හිටියනම් මම හිතන්නෙ වෙනත් කරුණු යටතේ අනිකුත් මන්ත්‍රීවරුන්ගෙ අදහස් හා යෝජනා පිළිබඳව දැනුවත් කිරීමක් සිදු වෙන්න තිබුනා. ඒ වගේම ඒව පිළිබඳව කතා කරන්න තිබුනා. අපේ තරංග සුදර්ශන මන්ත්‍රීතුමා නැගූ ප්‍රශ්නය පිළිබඳව සරලවම නෙවෙයි අපි ටිකක් කල්පනා කරලා බලනවනම්, එතුමාගේ ගැටලුව මීට වඩා පැහැදිලිව නිරාකරණය කර ගන්නට තිබුනා. අපේ සභාපතිතුමා, ඒ අවස්ථාවෙදි තරංග මන්ත්‍රීතුමා කිව්වෙ අවසානය වෙන විට එතුමගෙ යෝජනාව වුනේ, ඒ බෙදපු දේවල්වල අවිධිමත් භාවය සහ ඒවා ක්‍රමාණුකූලව සිදු නොවුන එක පිළිබඳව තමයි එතුමගෙ කණගාටුව ප්‍රකාශ වුනේ. නමුත් අපට විවිධ අවස්ථාවල අර්ථ නිරූපනය වුනා. ඒකෙ මුදල් ගනුදෙනුවල වංචාවක් වෙලා තියෙනවා. එහෙම ප්‍රශ්නත් මුලින්ම සාකච්ඡා වුනා. පස්සෙ අපි හොයල බැලුවම අපේ වාර්තාවෙ තියෙන ගැටලුවක්. ඒකෙ ඉතාම සරලව, ඒ යෝජනාව ඒ කරුණ පැත්තකට කරලා අනිත් ටික යෝජනා ස්ථිර කිරීමෙන් ඒ කටයුත්ත නිරාකරණය වෙලා තියෙනවා. ඉදිරි සභාවෙදි අපි හිතනවා ඒ පිළිබඳව ඕනනම් විධිමත්ව සාකච්ඡාවක් දාන්න පුලුවන්. තරංග මන්ත්‍රීතුමාගෙ යෝජනාවක් වශයෙන් න්‍යාය පත්‍රයට ඇතුලත් කළාම විධිමත් සාකච්ඡාවකට යන්න පුලුවන්. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කරුණු පැහැදිලි කිරීම පිළිබඳ මම නැවත වරක් කතාබහ කරන්න යන්නෙ නැහැ. මේ කටයුත්තට 100% ක් නොවුනට විශාල දායකත්වයක් මමත් ලබා දුන්නා. මොකද මුලු රටේම ප්‍රවනතාවයක් තිබුනා. අසරණ වුන අයට උදවු කරන්න ඕන කියලා. අපේ ගම්වල එදිනෙදා කුලී වැඩ කරන මිනිස්සුන්ට කර කියා ගන්න දෙයක් නොමැතිව කොස් ගෙඩිය දෙල් ගෙඩිය කාලා එදා වේල ළමයි ළපටින්ට දෙන්න ඕන ආහාර ටික හොයා ගන්න බැරුව මේ කොවිඩ් -19 වසංගත තත්වය නිසා ඉතා අසරණ තත්වයට පත්වෙලා තිබුනා. ඒ අවස්ථාවෙදි සමස්ථ රටේම විවිධ ආයතන, විවිධ සංවිධාන නොයෙකුත් ආකාරයේ උදවු උපකාර කරල තමයි මේ රටේ ජනතාවට නැගී සිටින්න රජයත් එක්ක සම්බන්ද වෙලා කටයුතු කළේ. එතනදි අපි ප්‍රාදේශීය සභාවක් වශයෙන් යම් කාර්යයක් ඉටු කරන්න කටයුතු කළා. සභාපතිවරයාගෙ වෙච්ච මුල්ම අඩුපාඩුව මම දකින්නෙ. මම කිව්වට අමනාප වෙන්න එපා. ඔබතුමාට ලක්ෂ 10 ක් වෙන් කළා කියන කතාව පිළිබඳව හරි අර්ථ නිරූපනයක් අපි කාටවත් ලබා ගන්න හැකියාවක් ලැබුනෙ නැහැ. අපි හිතුවෙ මේ ලක්ෂ 10 සභාවෙ බඩු බෙදන්න වෙන් කළයි කියලා තමයි ඔබතුමා මූලික සාකච්ඡාවක්, බේදයකින් තොරව කැදෙව්වෙ. එතනදි ඔබතුමා දැනුවත් වෙලා තිබුනෙ නැහැ. මේ ලක්ෂ 10 ප්‍රතිපූර්ණය කරන්න ඕන. ඒක දෙන්නෙ ප්‍රතිපූරණය කරන්න. මේක වියදම් කරලා ආපහු ගන්න පුලුවන් ක්‍රමයක් තියෙනවා. ඒවගේම සම්පූර්ණයෙන්ම දුගී දුප්පත් අයට, අඩු ආදායම් අයට නොමිලෙ දෙන්න ක්‍රමයකුත් මේකෙ තියෙනවා. ඒක තෝරා ගැනීමෙදි අපේ ගම්වල නම් හරි ප්‍රශ්නයක් වෙනවා. දුගී දුප්පත් අය තෝරන්න ගියානම් විශාල ගැටලුවකට පත්වෙනවා. ඒ අයගෙන් අය කර ගැනීමක් අවශ්‍ය නැහැ. නමුත් සාමාන්‍ය අයට යම් සහනයක් දෙනව නම්, යම් අය කර ගැනීමක් කරන්න කියලා ඔය ලිපිවල තියෙනවා. ඔබතුමා ආරම්භයෙදිම පටන් ගත්තෙ ඒ සාකච්ඡාවෙදි මේ ලක්ෂ 10 සියල්ල අපට ඕන විදිහට බඩුමුට්ටු පාර්සල් දෙන්න පුලුවන් කියලා සාකච්ඡා කරලා තීන්දු තීරණ අරගෙන තමයි මෙතනින් එලියට බැස්සෙ. ඒක අපි හරියට අර්ථ නිරූපනය කර ගත්තෙ නැති නිසා. එහෙම තීරනය කරලා ප්‍රශ්න පැන නැගුනෙ ඕකෙන්. ගම්වලට ගිහිල්ලා අපේ මන්ත්‍රීවරු කිව්වා. අන්න අපට බඩුමලු දෙනවා ප්‍රාදේශීය සභාවෙන් නම් ලැයිස්තු හැදුවා අපේ මන්ත්‍රීවරුන්ට වුනේ ඒකයි. ධනංජය මන්ත්‍රීතුමාට වුනේ ඒකයි. එතුමා සාකච්ඡා තියලා නම් ලැයිස්තු හැදුවා. ඒ ගැටලුව අපටත් වුනා මම නම් ඒවට ගියේ නැහැ. මම නම් දන්නවා මේකෙ හුගක් තේරුම් බේරුම් අරගෙන තමයි වැඩ කරන්නෙ. ටික කාලයක් යන්න දීල තමයි වැඩ කරන්නෙ. ටික කාලයක් ගියාට පස්සෙ තමයි ඕක හරියට අවබෝධ වෙන්නෙ. එහෙම ප්‍රශ්නවලදි අසරණ වුනා. ගමේ ප්‍රසිද්ධ වුනා ප්‍රාදේශීය සභාවෙන්

බඩුමලු දෙනවයි කියලා. ඒක කරන්න බැරි වුනා. ඒ ලක්‍ෂ 10 යෙන් ඒක කරන්න පුලුවන් හැකියාවක් තිබුනෙ නැහැ. ඒ ප්‍රශ්න එහෙම ගිහිල්ල කිසි කෙනෙකුට මෙතන එලියට බහින්න විදිහක් නැහැ. නිලධාරි ටික ගෙන්න ගන්න විදිහක් නැහැ. අන්තිමට සභාපතිතුමා අපේ කම්කරුවො රියදුරු මහත්වරු මේකෙ 80% ම බර කරට ගත්තෙ. වගකිව යුතු නිලධාරි මහත්වරු දෙතුන් දෙනෙක් ගෙන්න ගත්තා. ගෙන්න ගෙන ඒ කට්ටිය බලෙන් ගෙන්න ගත්තෙ. ඇවිල්ල වැඩ කරහන් මේව කරහන් මේ වාහනේ එලවහන් මේ ටික කරහන් කියලා සියලු දේවල් අපේ කම්කරුවො හා රියදුරු මහත්වරු කළා. බඩු ටිකත් දුන්නෙ එයාලට විකුණන්න. මේක තියාගෙන ඉන්න බැහැ කුනු වෙනවා නරක් වෙනවා. කොහේ හරි ගිහිල්ල විකුණ ගන්න කියලා මමත් ආවා. මම කිව්වා කොහේ හරි යන්න ඔය පාරෙ යන කොට ඉඩ තියෙන තැනක් අල්ලල නවත්තල විකුණ ගෙන එන්න අපි මේකෙ මුදල් ආපහු ගන්න ඕන. ඒ ප්‍රශ්න පැන නැගුනා බඩු දෙන්න ආයතන තිබුනෙ නැහැ. සැමන් පරිප්පු නැත්නම් ඒ බඩුමල්ලෙන් වැඩක් නැහැ. මිනිස්සු ඒ බඩුමල්ල ගත්තෙ සැමන් පරිප්පු බලාපොරොත්තුවෙන්. ඒකත් හොයා ගන්න අමාරු වුනා. සමූපකාරෙන් ඉල්ලුවම, සමූපකාරෙන් කිව්වා දෙන්න විදිහක් නැහැ කියලා. අපිත් ඕඩර් කළා අපටත් හොයා ගන්න විදිහක් නැහැ ලංකාවෙ කොහෙවත් නැහැ. ඔය ප්‍රශ්න ගොඩක් වෙලා තමයි යන්තම් යන්තම් යමක් කළේ. මම හිතනවා ඒ කළ කාර්යයයේ අඩුපාඩු තිබුනට බෙදා හැරීමේදී හා සමානාත්ම තාවය පිළිබඳ ගැටලුවක් තියෙනවා. නමුත් යම් කාර්යයක් කළා ඒක කොටසකට සීමා වුනා. උනන්දුව ඕනකම තියෙන අය ඒක මැදිහත් වෙලා කළා. දැන් ගරු සභාපතිතුමා ඒක පැහැදිලි කළේ නැහැ. එතුමා එලවලු ලොරි දෙකක් ඕඩර් කළා. ජනාධිපති කාර්ය සාධක බලකායට කතා කරලා. එලවලු ලොරි දෙක ආවනම් මේ කොට්ඨාසෙම බෙදා ගන්න මෙතන වාහනත් ගෙනත් තියලා, තරාදිත් ගෙනාවා. මමත් හිටියා උදේ 8.00 එනවයි කියපු ලොරිය 1.30 වෙනකනුත් ආවෙ නැහැ. පස්සෙ හොයල බලපුවම අපේ එලවලු ලොරි දෙක වෙන තැනකට දීලා. කතා කරන්න අපේ සභාවෙ සභාපතිතුමාගෙ දුරකතන අංකය එයාලට හොයා ගන්න බැරුව එලවලු ලොරි දෙක ගිහිල්ල ඒ පාර කතා කරලා ඇහුව ලොරි දෙකක් එවන්නද කියලා. මේ දවල් 1.00 ට 2.00 ට එලවලු ලොරි එවලා මෙහේ විකුණන්න පුලුවන්ද? ඒක නිසා ඒක අතහැරල දැම්ම. එහෙම විධිමත් වැඩපිළිවෙලකට ආවට අපට ඒ වගේ සම්බන්ධතාවයන් කර ගන්න බැරි වුනා. සමහර සභාවල එලවලු ලොරි ඇවිල්ල බෙදුවා. ඒව ප්‍රමාණවත් පරිදි බෙදන්න හැකියාව තිබුනා. ඔය වගේ ප්‍රශ්න තිබුනා. ඉතිං මම හිතනවා විශේෂයෙන්ම ඒ කොරෝනා වසංගතය අපට නිම කර ගන්න හැකියාව ලැබුනෙ නැහැ. අපි දකිනවා තවත් වසර ගණනාවක් යයි. ලෝක සෞඛ්‍ය සංවිධානයත් කියනවා මේක තවත් අවුරුදු දෙකක් විතර යනවයි කියලා. නිශ්චිත බෙහෙතක් හොයා ගෙනත් නැහැ. අපට ඊලග සභාවත් අපට තියන්න වෙන්නත් පුලුවන්, නොවෙන්නත් පුලුවන්. ඒ නිසා අපි ඒකට මුහුන දෙමු. මුහුන දීලා ජයග්‍රහනය කරන්න කටයුතු කරමු.ඒ ගැනත් සිහිපත් කරමින් විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමාලත් අවබෝධයෙන් ඊටත් වඩා කණ්ඩායම් හැගීමෙන් කටයුතු කරතැයි බලාපොරොත්තුවෙන් මගේ කතාව අවසන් කරනවා. වෙන විශේෂ කිවයුත්තක් නැහැ. මේ දවස්වල අපේ ප්‍රදේශයේ විශාල සංවර්ධන කාර්යයක් කෙරෙනවා. ඒ පිළිබඳ අපි සිහිපත් කරන්න ඕන. විශේෂයෙන්ම කාපට් මාර්ග ආරම්භ වෙලා තියෙනවා. ඒ වගේම පාලම් ව්‍යාපෘති අපේ නිශාන්ත මන්ත්‍රීතුමා උනන්දු වුනා. ඒවට අපේ මූලික උනන්දුව තිබුනට මැදක් හරියෙදි එතුමන්ලා උනන්දු වුනා. ඒ පිළිබඳ එතුමන්ලටත් ස්තුති වන්ත වෙනවා. ඒ පාලම් ව්‍යාපෘතිවලට අවශ්‍ය දෙවෙනි හරි තුන්වැනි හරි කොන්ත්‍රාත්කරු ඇවිල්ලා දැන් වැඩේ කරගෙන යනවා. ඒව හොඳ වැඩ. ඒ පිළිබඳත් සිහිපත් කරමින් ඒ වගේම අතුරු මාර්ග රාශියක් මේ වනවිට කොන්ක්‍රීට් කරගෙන යනවා. ඒවත් අපි සිහිපත් කරමින් මේ මැතිවරණෙදි අපි කිසිදු බේදයකින් තොරව කිසිදු කරදරයකින් තොරව ප්‍රාදේශීය සභාව තුල වැඩ කටයුතු කරගෙන යනවා. වෙනදා වගේ හැලහැප්පීම් නැහැ. ගැටුම් නැහැ. හොඳ මැතිවරණයක ආරම්භයක් තියෙනවා. අපි මේ මැතිවරණෙන් විශිෂ්ඨ ජයග්‍රහනයක් අපේ ගෝඨාභය රාජපක්‍ෂ ජනාධිපතිතුමාට ලබා දෙන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ පිළිබඳවත් සිහිපත් කරමින්, ඔබ සැමට සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමනි, සභාවෙන් අවසරයි. නාගොඩ කමල් මහත්තයගෙ ගල් කොරියක් තියෙනවා. ඒකෙ ගල් බෝර ගහන වෙලාවෙ ගෙදරකට වැදිලා තියෙනවා. ඒ ගැන කොහොමද අපේ සභාවෙ කටයුතු සම්පාදනය වෙන්නෙ කියලා මේ අවස්ථාවෙ දැන ගන්න කැමතියි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ඒ සම්බන්ධව කටයුතු සිදු වෙනවා. දැනට ගල් කොරිය නතර කරල තියෙන්නෙ.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. කොවිඩ් වසංගතය ඉවර වුනා. මම හිතන විදිහට අපි ලාභ ලැබුවා. ලක්‍ෂ 10 හම්බ වුනා. අපි ලක්ෂ දෙකයි වියදම් කළේ. මේ සභා වාර්තාව අනුව මම නිකන් කිව්වෙ. අපි කොවිඩ් 19 යෙන් සභාපතිතුමා ඇතුලු සභාව ලාභ ලබලා තියෙනවා. නමුත් සභාපතිතුමනි, ඔබතුමා සද්භාවයෙන් කරන්න ඇති. මෙතන හිටපු මන්තීවරු ඇතැම් අය සද්භාවයෙන් අපේ සභාව වෙනුවෙන් ජනතාව වෙනුවෙන් වැඩ කරන්න ඇති. මම හිතන්නෙ මේ සියලු මන්ත්‍රීවරුන්ට තමන්ගෙ අතින් කිසියම් වූ මුදලක් වියදම් වුණා. මොකද තමන්ගෙ හිතවත් කෙනෙකුට හරි බඩු පාර්සලයක් දීලා එහෙම නැත්නම් ඒ වෙනුවෙන් වියදම් කළා. අපි පෞද්ගලිකව දන්නවා. හැම කෙනෙක්ම තමන්ට පුලුවන් විදිහට ගමේ අසරණ වෙච්ච මිනිස්සු වෙනුවෙන් මේ හැම දෙනෙක්ම වියදම් කළා. කිසිම කෙනෙක් ලාභ ලැබුවෙ නැහැ. නමුත් මෙතන තරංග මන්ත්‍රීතුමා හරි සහබන්දු අපේ විපක්‍ෂ නායකතුමා හරි කරුණු කතා කරන කොට ඔබට හිත් රිදීම් වෙන්න ඇති. නමුත් මේකෙ විධිමත් භාවයක් එහෙම නැත්නම් විනිවිධ භාවයක් තිබුනෙ නැහැ. සභාපතිතුමනි, ඒක ඔබ පිළිගන්න ඕන. බොරුවට තර්ක කරල වැඩක් නැහැ. ඔබ සද්භාවයෙන් කරන්න ඇති. නමුත් රුපියල් දාහෙ බඩු පාර්සලය උප සභාපතිතුමනි 750 දෙනකොට මුලු නාගොඩටම ඒකදීල යටලමත්තට ඌරලට නැත්නම් ධර්මසිරි මන්ත්‍රීතුමාට නැත්නම් ඒක හරිද? මේක වැරදියි.

මේකෙ වැරැද්දක් වුනා. නමුත් අපි වැඩ කළා. ඒකෙ අඩුපාඩුවක් වුනා. ඒකට සමාවෙන්න හරි, මේකෙ ක්‍රමවේදෙ ඔබ සද්භාවයෙන් කරන්න ඇති. ලක්රුවන් මන්ත්‍රීතුමා සද්භාවයෙන් කරන්න ඇති. සියලු මන්ත්‍රීවරු සද්භාවයෙන් තමයි කරන්නෙ. මොකද ලාභ ලබන්න ප්‍රාදේශීය සභාවෙ එලවලු ගෙනැල්ල අපේ මන්ත්‍රීවරයෙක් සාක්කුවෙ දා ගන්නවත් ඔබතුමා සාක්කුවෙ දාගන්නැති විත්තිය අපි කවුරුත් මෙතන ඉන්න සියලු දෙනා දන්නවා. ඒ වෙලාව ව්‍යසනයක් වෙච්ච වෙලාව. නමුත් මේකෙ වැරැද්දක් වුනා ගරු සභාපතිතුමනි, දාහෙ බඩු මල්ල රුපියල් 750 දීල රුපියල් 250 සභාව පාඩු ගන්න කොට ඒ සභාවෙ සල්ලි නෙවෙයි. මේ රටේ ජනතාවගෙ සල්ලි. ඒ සල්ලි නාගොඩට විතරක් වැලිවිටියට විතරක් දෙනවනම් ඒක වැරදියි. ඒක අපි ඒ වැරැද්ද පිළිගන්න ඕන. යටලමත්තට යන්න ඇති ඕක ඒක මම දන්නෙ නැහැ. තරංග මන්ත්‍රීතුමා නැති හින්ද මේකට උත්තරේ දුන්නෙ. ලක්රුවන් මන්ත්‍රීතුමා මෙතන නැහැ. මොකද එතුමට වේදනාවක් ඇති එතුම ගොඩක් මහන්සි වුනා. මෙතන රැදී සිටියා. ඔබට සහයෝගය දීලා වැඩ කළා. වැඩ කරලත් අන්තිමට මන්ත්‍රීවරු චෝදනා කරන කොට වේදනාවක් එනවා. නමුත් මෙතන අඩුපාඩුවක් වුනා. ගරු සභාපතිතුමනි. තරංග මන්ත්‍රීතුමා කියන විදිහට සභාවෙ අනුමතත් වෙලා තියෙද්දි, එතුමගෙ ගමට ඒ රුපියල් 250 ක් අඩුවෙන් දීපු බඩු පාර්සලය නොගියනම්. එතනත් ප්‍රශ්නයක් තියෙනවා. මුදල් කමිටුවට එයා තරංග මන්ත්‍රීතුමා එනවා. ඒ වැරැද්ද එතුමා පෙන්වල දෙන එක මම හිතන්නෙ මන්ත්‍රීවරයෙක් හැටියට එයාගෙ යුතුකමක්. අපේ සහබන්දු මහත්තයා කතා කරනවා. එයාගෙ යුතුකමක් ඒක කරන එක. අපි

පෞද්ගලිකව දන්නවා ඔබතුමාවත්, ලක්රුවන් මන්ත්‍රීතුමාවත්, අපේ උප සභාපතිතුමාවත් මේ ඉන්න මන්ත්‍රීවරු කවුරුවත් මේකෙන් හම්බ කර ගත්තෙ නැහැ. නමුත් රජයේ මුදල් වියදම් කරන ක්‍රමවේදයක් තුල යම් විනිවිධ භාවයක් පේන විදිහක් තියනවා. එතකොට ඔබතුමා දැන් මොකක්ද කරන්න ඕන කියලා, මේකෙ නීතිමය තත්වෙ දන්නෙත් නැහැ. මම කියන්නෙ මීට වඩා පෙර සූදානමක් සභාව සතුව තිබිය යුතුයි. මන්ත්‍රීවරු කතා කරන කොට, දැන් ධර්මසිරි මන්ත්‍රීතුමා ඇහුවා සභාපතිතුමා අපිට බඩු විකුණන්න බැරිද කියලා. අපි මේකට හරියට උත්තර දෙන්න ගියොත් ඔබතුමා තරහ වෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා මේකෙ ඔබතුමාලගෙ අඩුපාඩු නෙවෙයි. සභාපතිතුමාගෙ අඩුපාඩු මෙතන ඔක්කොම තියෙන්නෙ. ප්‍රසිද්ධියෙ සභාවෙ කියන්න වෙනවා. මේකට නීතිමය තත්වෙ මොකක්ද කියලා ඔබතුමා පෙර සූදානම්වෙලා ඇවිල්ල කතා කළානම් මීට වැඩිය හොඳයි කියන එක මගේ මතය.

අපි ඒකෙන් අයින්වෙලා සභාපතිතුමනි, මෙතනින් එහාට අපි යන්න බලමු. දැන් ඔබතුමා සභාපති වුනා. ඒ වගේම අවුරුදු දෙකක් දෙකහමාරක් දැන් ඉවර වෙලා තියෙනවා. සභාපතිතුමනි මමයි උප සභාපතිතුමයි පහුගිය දවසකදි යටලමත්තෙ මළ ගෙදරක ඉන්න කොට උප සභාපතිතුමත් මමත් වැස්සට කොටුවෙලා හිටියෙ. අඩි තුනක පාරකින් තමයි ඒ දේහය අරගෙන යන්න තිබුනෙ. ඒ දේහය අරගෙන යන කොට යන්න බැහැ. පොඩි ඉඩමක තමයි ඒ භූමදානය කරන්න තිබුනෙ. ඒ නිසා අපේ ගම්වල වතු සමාගම්වල ඉඩම් තියෙනවා. මේ මරණයක් භූමදානය කරන්න තියෙන සියලු ඉඩම්, මේ වන විට අපේ ඉඩම් හැම තැනම පර්චස් 10 යෙ 15 වේ කට්ටි වෙලා තියෙන්නෙ. ඒක මෙතන දැන් අපේ වෙරංග මනත්‍රීතුමත් කතා කළා. මට මතක් වුනේ ඒකත් එක්කම. අපි නැවතත් මේ කොට්ඨාස 15 වෙම සුසාන භූමි ඔබතුමා මැදිහත් වෙලා සුසාන භූමි අපේ තියෙන ඉඩම්නම් කවුරු භුකති වින්දත් නැවතත් ඒවා ප්‍රාදේශීය ලේකම් හරහා ලබා ගන්න කටයුතු කරමු. මොකද සමහරක් ඒවා අපේ සභාවට පවරලා නැහැ. සුසාන භූමි කියල වෙන් කරල තිබුණට සභාවට දීලා නැහැ. ප්‍රාදේශීය ලේකම්ගෙ ඉඩම් යටතෙ තමයි තියෙන්නෙ. එහෙම නැත්නම්, එහෙම නැති ඉඩම් තියෙන තැන්වල අපි වතු සමාගම්වලින් ලබාගමු. මේකත් එක්කම අපි මේ වැඩේ පටන් ගමු. මාස දෙක තුනක් ඇතුලත මේ කොට්ඨාස 15 තුලම මම විශ්වාස කරනවා වතු සමාගම් සමග ඉඩම් වැලිවිටිය වගේ පැතිවල තමයි නැත්තෙ. ඌරල අක්කර 25 හේ තියෙන එකේ සම්පූර්ණ තේ වවල තියෙන්නෙ. මේක අපි ආපහු අලුත් කරලා, ගැසට් එකේ තියෙන විදිහට නැවතත් නීති ක්‍රියාත්මක කරලා, ගරු සභාපතිතුමනි, කවුරු හෝ දේශපාලන මැදිහත් වීමක් වෙන්න එපා. කවුරුවත් අත දාන්නත් එපා. මේක තියනවනම්, ඒ ඉඩම අපි නැවතත් මේක පිරිසිදු කරල ජනතාවට අරන් දෙන්න ක්‍රමවේදයක් සකස් කරමු. ඔබතුමා ආදාහනාගාරයක් හදන්න උත්සාහ කරනවා. ඊටත් වඩා වටිනවා මේක. මොකද අද වෙන කොට නීතියෙන් නියොගයක් දුන්නොත් අධිකරණ වාර්තාව දුන්නොත් මේක ආදාහනය කරන්න එපා කියලා අපේ ගම්වල මිනිස්සු අපහසු තාවයට පත්වෙනවා. මොකද ඉඩම් නැහැ. පර්චස් 10 යෙ 15 වේ ඉඩම් තියෙන්නෙ. ඒ නිසා ඒ පිළිබද අවදානය විශේෂයෙන් යොමු කරල මෙතන ඉන්න කොට්ඨාස 15 වෙ මන්ත්‍රීවරු 15 දෙනාම එකතු වෙලා හොද වැඩක් කරන්න පුලුවන්. ඒ නිසා මේකෙ සියලු දෙනා මැදිහත්වෙලා, කවුරු මොනතරම් බලවතෙක් ඒ ඉඩම අල්ලගෙන ඉන්නවද කියන එක වැදගත් නැහැ. ඒක අනිවාර්යයෙන් පිරිසිදු කරලා ජනතාවට දෙන්න වැඩ පිළිවෙලක් හදමු. මේක ඉක්මනින්න්ම කරමුයි කියන ඉල්ලීම කරනවා.

ඒ වගේම යටලමත්ත දඩුවන පාලම සභාපතිතුමනි හදලා ඉවරයි. ඒක මම අපේ විජිත් මන්ත්‍රීතුමාටත් කියනවා. මේකට පස් ටිකක් දාල විවෘත කරලා හරි කමක් නැහැ. පාලම හදල ඉවර කරන්න. සභාපතිතුමනි, පස් කියුබ් එකක් රුපියල් 600 යි මේ මිලට ගන්න හම්බ වෙන්නෙ නැහැ. මේ දවස්වල සඳුන් මන්ත්‍රීතුමාලගෙ ගෙපල කපනවා. රුපියල් 30000 යන එකක් නැහැ. මම හිතන්නෙ දෙපැත්ත පාලම ගොඩ කරල තියෙන්නෙ. දෙපැත්තෙ පාරට පස් කියුබ් 25 ක් 30 ක් දැම්මොත් මේක හදල ඉවර කරන්න පුලුවන්. අඩුම වියදමින් මේ දවස්වල පස් දානවා. ඒක ප්‍රයෝජනයට ගන්න. ඒ නිසා මම කියන්නෙ මේ අපේ විජිත් මන්ත්‍රීතුමාටත් උනන්දු වෙලා පාර හදල විවෘත්ත කළත් කමක් නැහැ. මේ වෙලාවෙ. මොකද අපට ඕන නැහැ. මොකද දැන් ජනතාවට හදපු පාර අපරාදෙ ඒ නිසා මේ පිළිබද අවදානය යොමු කරන්න කියනවා.

ඒ වගේම ගරු සභාපතිතුමා, නැවතත් මම කියනවා දැන් මේ සියලු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට තියෙන ලොකුම ප්‍රශ්නෙ තමයි පාර දෙපැත්තෙ කැලේ වැවිලා යන්න බැහැ. හැමෝම මගුල් ගෙදරක් තියෙනවා, දානෙ ගෙදරක් තියෙනවා. කියලා නිතරම කියනවා. අපිනම් දැන් ඒකෙන් බේරිල ඉන්නෙ. නමුත් මේකට අලුත් වැඩ පිළිවෙලක් හදන්න. මේ ටැක්ටර් තියෙනවා මේ ටැක්ටරයකට මැෂින් එකක් සවි කරලා එකපාරක් පාරෙ ගියාම ඔක්කොම ටික කපාගෙන යන්න පුලුවන් මැෂින් එකක් තියෙනවා. රොටරියට සවි කරන්න පුලුවන් මැෂින් එකක් තියෙනවා. මම හිතන්නෙ ලක්ෂ දෙකක් වගේ වෙන්නෙ. අන්න එයින් එකක් ගෙනැල්ල සවි කරලා මේ සභාවෙ සියලු පාරවල්වල දෙපැත්ත විසි කැති ගහනවට වඩා මම හිතන්නෙ එක දවසෙන් කිලෝ මීටර් ගාණනක් ඉවර කරන්න පුලුවන් මට්ටමෙ මැෂිමක් තියෙනවා. මෙයින් එකක් ගෙනැල්ලවත් මේ කටයුත්ත කරන්න. සමහර වෙලාවට මගුල් ගෙයක් දානෙ ගෙයක් තිබුනොත් පාරෙ දෙපැත්තෙ යන්න බැහැ මන්ත්‍රීතුමා පොඩ්ඩක් මේ දෙපැත්ත සුද්ද කරල දෙන්න අපට වඩා ඔබතුමා ලොකු අපහසු තාවයකට පත්වෙනවා. මෙන්න මේ රොටරියකට සවි කරන්න පුලුවන් තණකොල කපන මැෂින් එකක් ගෙනැල්ල ඉක්මනින් වේගයෙන් පාරවල් ටික පිරිසිදු කර ගන්න පුලුවන් ක්‍රමවේදයක් හදා ගන්න පුලුවන්. මේ පිළිබඳ අවදානය යොමු කරන්න යැයි කියමින් ඒවගේම නැවතත් මම කියනවා. යටලමත්තෙ අපේ විජිත් මන්ත්‍රීතුමාට මේක කියන්නෙ. පොඩි ගානක් වියදම් කරල අර පස් ටික දාල දඩුවන පාලම හදල දෙන්න කියලා ඉල්ලනවා. සියලු දෙනාට සුබ දවසක්.

**ගරු මන්ත්‍රී සුභාෂි ඒකනායක මෙනවිය**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවෙ කොවිඩ් 19 වසංගත තත්වය වෙලාවෙ සභාව විසින් සහන සලසපු එක ගැන හැමෝම කතා කළා. ඒ වගේම කතා කළේ චෝදනාවක් විතරයි. චෝදනා කළා මේ කොට්ඨාසයට ලැබුනෙ නැහැ. මේ කොට්ඨාසයට ලැබුනෙ නැහැ කියලා. මම දැනගන්න කැමතියි ජනතා ඡන්දයෙන් තේරී පත්වෙලා මෙතනට ආපු මනත්‍රීවරයෙක් වශයෙන් ජනතාවට සේවය කරන්නත්, උපතේ සිට මරණය දක්වා ජනතා සේවය ගැන කතා කරන්නත්, මගේ කොට්ඨාසෙ මෙන්න මේ වෙලාවෙ මේ අවශ්‍යතාවය තියෙනවා, මේ අවශ්‍යතාවය තියෙනවා කියලා මොන මන්ත්‍රීවරයද කතා කරලා මෙතනට සහභාගි වෙලා ඒ ගැන කතා කළේ. කිසිම මන්ත්‍රීවරයෙක් තමන්ගෙ කොට්ඨාසෙ මේ අවශ්‍යතාවය තියෙනවා කියලා කතා කළේ නැහැ. දැන් චෝදනා කරනවා මගේ කොට්ඨාසෙට මේ දේ ලැබුනෙ නැහැ. බඩු මලු ගියේ නැහැ කියලා. අපේ විපක්ෂ නායකතුමා සදහන් කළා අත දික් කරලා සදහන් කරල පෙන්නුවා මෙන්න මේ මන්ත්‍රීතුමා, මෙයාලා සභාපතිතුමාට කඩේ යනවා කියලා. සභාපතිතුමාට කඩේ යාම කෙසේ වෙතත් එලවලු ගෙනාවා, එලවලු වැස්සට තෙමුනා, නරක් වුනා. ඒ සියලු විස්තර එතුමා දන්නවා. ඒ දැන ගෙනත් සහන බඩු මල්ල දෙන එක පිළිබදව මෙතනට ඇවිල්ල හොයල බලලා මගේ කොට්ඨාසෙ මෙන්න මේ කෙනාට මේ අවශ්‍යතාවය තියෙනවා කියල කතා කරන්න බැරි වුන මන්ත්‍රීවරු මෙතන ඉන්නෙ. එහෙම තමන්ගෙන් වෙන්න ඕන යුතුකම් ගැන කතා කරන්නෙ නැතුව සභාව විසින් මෙන්න මේ දේ කලේ නැහැ. මෙන්න මේ පැත්ත ආවරණය වුනේ නැහැ කියන එක වැරදියි. ඒ වෙලාවෙදි මන්ත්‍රීවරු සුළු පිරිසක් ඒ වගේම සදහන් කරන්න ඕන සභාවේ සේවක පිරිස ඉතා උනන්දුවෙන් ඒ දක්වපු කැපවීම සහයෝගය කැප කිරීම නිසා ඒ වෙලාවෙදි අපට කොට්ඨාස ටික ආවරණය වෙන පරිදි මගේ කොට්ඨාසෙට බඩු මලු ගියා. ඒ සහන සැලසුවා. එලවලු ගියා. ඒ ටික මම සදහන් කරන්න ඕන. මෙතන සියලු මන්ත්‍රීවරු නැති වුනත් කැප වීමෙන් වැඩ කළා. තමන්ගෙ කොට්ඨාසෙට තමන්ට මෙන්න මේ අවශ්‍යතාවය තියෙනවා කියලා මගේ කොට්ඨාසෙට මෙන්න මේ දේ ඕන කියලා සදහන් කරල වතුර ටික ඒ වෙලාවෙ ගෙන්න ගත්තා. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා සදහන් කළා. පියල් මන්ත්‍රීතුමා ඒ දවස්වල වතුර බවුසරෙන් බැස්සෙ නැහැ. ඇත්ත. එතකොට අපේ ප්‍රියන්තා මන්තීතුමිය එතුමිය එතුමියගෙ කැපවීමෙන් මෙතන සේවකයො වැඩ කරද්දි කෑම ටික ඕනද හොයල බලල කෑම ටික ගෙනත් දුන්නා. ඒ කවුරුවත් කතා කරල කියල නෙවෙයි. එතුමිය ඇවිල්ල සහභාගි වෙලා ඒ දැකපු දේ කළේ. මන්ත්‍රීවරයෙක් වශයෙන් තමන්ට තමන්ගෙ කොට්ඨාසයට වෙන්න ඕන මොකක්ද කියලා ඒ වෙලාවෙ මෙතනට ඇවිල්

හොයල බලන්න පුලුවන් කමක් තිබුනනම් මම හිතනවා ඔය අඩුපාඩු සියල්ල දැනගෙන සභාපතිතුමාට හරි, සභාවට හරි, ඒ දේ ඒවෙලාවෙ ඉටු කරන්න පුලුවන් කමක් තිබුනා. රුපියල් ලක්ෂ 10 ක මුදලක් තියෙනවා කියලා ඒ දේ දැන ගෙන හිටියා. ඒ වුනාට ඒකට කරන්න ඕන මොකක්ද? නොමිලෙ දෙනවද? නැත්නම් සහන සලසනවද? ඒ කිසිම දෙයක් කවුරුවත් සාකච්ඡාවට ගත්තෙ නැහැ. අන්තර් ජාලය හරහා දේශපාලනය කරන්නනම්, ඒ වෙලාවෙ ඕන කෙනෙක් ලෑස්තිවෙලා හිටියා. අන්තර් ජාලය හරහා සභාවට චෝදනා කළා. මන්ත්‍රීවරුන්ට චෝදනා කළා. එහෙම දේශපාලනයක් කරනව නම් අපටත් පුලුවන්. කොට්ඨාසයේ අවශ්‍යතා මිනිස්සුන්ට ඒ වෙලාවෙ බෙහෙත් නැතුව හිටියා. කෑම නැතුව හිටියා. අපේ කොට්ඨාසෙ මම අන්තර් ජාලයෙන් නෙවෙයි ප්‍රායෝගිකව තමන්ගෙ කොට්ඨාසෙ සිදු වෙන්න ඕන මොකක්ද කියලා ඒ වෙලාවෙ ඇවිදල බැලුවනම්, මෙන්න මේ පිරිසට මෙන්න මේ දේ අවශ්‍යයි කියලා දැනගෙන කටයුතු කරන්න තිබුනා. මම හිතනවා ගරු සභාපතිතුමනි, චෝදනා කරනවට වඩා තමන්ගෙන් ඉටු විය යුතු යුතුකම් මොනවද? ඒ වෙලාවෙ වෙන්න ඕන මොකක්ද? කියලා හොයලා බලලා කටයුතු කළානම්, මීට වඩා තමන්ගෙ කොට්ඨාසෙට ඒ වෙලාවෙ වෙන්න ඕන දේ කර ගන්න තිබුනා කියලා මම කියනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, ගස් ගැන ප්‍රශ්නයක් තියෙනවා. මගේ කොට්ඨාසයේත් ලිපි දෙකක් ගිහින් තියෙනවා මේ වෙන කොට ඒ වුනාට ඒකට කිසිම විසඳුමක් මේ වන විට ලැබිල නැහැ. ඒ ගහ අවදානම්. ඊයෙ මම ගිහිපු වෙලාවෙ තමයි ඒ මිනිස්සු මට කිව්වෙ ඒ නිසා ඒ පිළිබඳවත් හොයල බලල ඒකට නිවැරදි තීරණයක් අරගෙන ඒ දේ ගැන හොයල බලල කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. සියලු දෙනාට සුබ අනාගතයක් ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ගරු බන්දුල මන්ත්‍රීතුමා ගරුත්වය ආරක්ෂා කර ගන්න. මේක ගරු සභාවක්. මේ කොවිඩ් වසංගතය නිසා අපි අද මේ මරණාධාර සමිතියක වගේ වාඩිවෙලා ඉන්නෙ. ගෞරවණීය සභාවක. ගෞරවණීය වැඩ කරනකොට තමන්ගෙ ඇඳුමේ සිට මේ සභාවට එන්න ඕන ආකාරය අපේ රීතිවල තියෙනවා. මන්ත්‍රීවරයෙක්ගෙ ඇඳුම පවා ඒ ආකාරයට තිබිය යුතුයි. නැත්නම් සභාවට ඇතුලු කර ගැනීම වුනත් නතර කර ගන්න පුලුවන්. ඔබතුමාල දන්නවා. ඒ නිසා ගරු මන්ත්‍රීවරු මීට පස්සෙවත් ඒ කටයුත්තෙදි ඒ අනුව ක්‍රියා කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීවරුනි, අද සභාවේ කටයුතු වලදි යම් ප්‍රශ්නකාරී තත්වයක් මතුවුනා. කොවිඩ් වසංගතය නිසා උපසභාපතිතුමත්, ලක්රුවන් මන්ත්‍රීතුමත් පැහැදිලි කළා. අනිත් සියලුම දෙනත් පැහැදිලි කළා. සත්‍ය, මගෙනුත් අඩුපාඩුවක් වුනා. එදා කොවිඩ් වසංගතය අපි කවුරුත් නොහිතපු දෙයක්. අපි නියගයෙන් පීඩාවට පත්වෙලා තිබුන අවස්ථාවක, මේ කොවිඩ් වසංගතය ආවෙ. ඒ අනුව අපිට අපේ මූල්‍ය තත්වය දැන ගෙන, ආණ්ඩුකාරතුමා ලක්ෂ 10 ක් එව්වා. පස්සෙ තමයි දන්නෙ ඒවා අපේ මුද්දර ගාස්තු කියලා ඒකෙදි මමත් යම් අයගෙ වචන පස්සෙ ගිහිල්ල මමත් ටිකක් රැවටීමකට භාජනය වුනයි කියලා මට හිතෙනවා. මොකද යම් යම් අයගෙ වචන පස්සෙ ගිහිල්ලා මේකෙන් නොමිලේ බඩු දෙන්න කියන මතයට මට එන්න වුනා. ඒ අනුව මම සියලුම මන්ත්‍රීවරුන් කැඳෙව්වා. මම කළ එක වැරැද්දක් ඒක. ආණ්ඩු පක්ෂෙන් කටයුතු කරන නිසා ආණ්ඩු පක්ෂෙ මන්ත්‍රීවරු විතරක් කැදෙව්ව නම් හරි. මම සියලුම මන්ත්‍රීවරුන් කැඳවලා, මේ කෝවිඩ් වසංගතය කාටත් පොදු නිසා ඒ කර්තව්‍යයෙදි ඒ සියලුම දෙනාගෙ යෝජනා අරගෙන තමයි කටයුතු කළේ. මම ඇත්තටම ඒ වෙලාවෙදි නොමිලේ බඩු බෙදා දීමේ කටයුත්තට පෞද්ගලිකව කැමැත්තක් දැක්වුවෙ නැහැ. මොකද මේ වසංගතය හමුවෙ අපි කොච්චර කල් නොමිලේ දෙන්නද? ගංවතුරක් වගේ නම් දවස් දෙකයි තුනයි. ගංවතුර බැහැල යනවා. එතකොට ඉවරයි. මේක කවද වෙනකම් ඇදිල යයිද? ඊට පස්සෙ අපි මොනවද දෙන්නෙ. කියන මතය හින්දා සාධාරණ සහනදායී ක්‍රමවේදයක් තමයි මගේ හිතේ තිබුනෙ. නමුත් රුපියල් දහසක බඩුමල්ලක් නොමිලේ දෙන්න යෝජනා වුනා. එතකොට ලක්ෂ

10 ට බඩු මලු 1000 යි. එහෙම හැදුවොත් එක ගමකට කොහොමත් බඩු මලු 18ක් 20 වක් වගේ තමයි යන්නෙ. මේ 18 -20 අපි කොහොමද තෝර ගන්නෙ. ඊට පස්සෙ තමයි ඊට පසුදා කමිටු දාලා ඒ තෝරාගැනීමේ අවශ්‍යතාවය කිව්වෙ. ඊට පස්සෙ කොමසාරිස්තුමා සමඟත් මම දුරකථනයෙන් සම්බන්ධ වෙලා උපදෙස් ගත්තා එතුමා මට උපදෙස් දුන්නෙ, සභාපතිතුමා, එහෙම නිකන් දෙන්න යන්න එපා. මෙන්න මේ විදිහට කරන්න කියලා. ඒ එක්කම මම අදාල මන්ත්‍රීවරුන්ට කිව්වා. බඩු මලු නොමිලෙ දෙනවයි කියන කතාව කියන්න එපා කියලා. නමුත් යම් අය කියලා නැහැ. කොහොම හරි ප්‍රකාශවෙලා. සභාවෙන් මේක නොමිලේ දෙනවයි කියපු නිසා තමයි මේ මහා විනාශයට මුල ඇති වුනේ. ඊට පස්සෙ ඇත්තටම නොමිලේ නොදීපු නිසා තමයි ප්‍රශ්න ආවෙ. ඒ පාර අපිට ක්ෂණිකව ගන්න තිබුන තීරණය තමයි. මොනව හරි, එලවලු වැනි යමක් ගේන එක. මොකද අවශ්‍යතාවය තිබුනෙ එලවලු වගේ දේවල්. ඒ නිසා එලවලු ගේන්න අපිට ලැබුන ලක්ෂ 10 යෙන් අපි අත්තිකාරමක් ගන්න ගිහිල්ලා ඒක ගන්න බැරි වුනා. ඊට පස්සෙ මම අතමාරුවක් කරගෙන, ඒ මුදල් අරගෙන උප සභාපතිතුමාලා, අපි කට්ටියම හම්බන්තොට, රන්නෙ ගිහිල්ලා, එලවලු ගෙනැල්ලා, සභාවෙම පාර්සල් කළා. මේ පිළිබඳව අපි සියලු මන්ත්‍රීතුමන්ලාට දැනුම් දුන්නා. නමුත් සිද්ධ වුනේ මුහුණු පොතෙන් අපිට විරෝධය දක්වපු එක. එදා ගිය වාහන කැඩිලා, අපහසු තාවයට පත්වෙලා, වසන්ත ගෙනියපු කෑම එක අපි කෑවෙ. ඒව මතක් වෙනකොට කණගාටුවක් දැනෙනවා. එහෙමයි අපි කළේ. එහෙම බඩු ගෙනැල්ලා මෙතන නිදිවරාගෙන, බැනුම් අහල තෙමීගෙන කම්කරුවොත් එක්ක එකතුවෙලා එහෙම කරල තමයි අපි බඩු මලු හැදුවෙ. අර ෆේස් බුක් ව්‍යාපාරයෙන් මන්ත්‍රීවරුන්ගෙ මනස විකෘති කළා. ඉතිං අපිට මොකද කියලා අපි අපේ ගමන ගියා. මම වංචාවක් සිදු නොකරන නිසා මම කාටවත් බය වුනේ නැහැ. ඊට පස්සෙ එළවළු වැස්සට හසුවෙලා නරක් වුනා. මන්ත්‍රීවරු බඩු ගෙනිහිල්ලා නැවත ආපහු ගෙනාවා. එළවළු නරක් වුනා. පාඩු විඳගන්න වුනා. නමුත් ඒව අපි කළා. ඊට පස්සෙ අපි සතොසෙන් බඩු පාර්සල් ඉල්ලුවා. අන්තිමට බඩු පාර්සල් 50 යි 100 යි අපට ලැබුනෙ. ඉතිං කොහොමද අපි මේ බඩු පාර්සල් 50 ක් 100 ක් අරගෙන බෙදන්නෙ. එක පාර්සලයක්වත් අපි ගෙදරට ගෙනිච්චෙ නැහැ. මේ මන්ත්‍රීවරුත් තමන්ගෙ ගෙදරට ගෙනිච්චෙත් නැහැ. හැම තැනටම බෙදන්න බැරි වුනා. හැම කොට්ඨාසයක්ම නියෝජනය කළා නම්, ඒක කරගන්න තිබුනා. නමුත් අඩුපාඩු කියන්නයි, කකුලෙන් අදින්නයි විතරයි අපේ අය ඉන්නෙ. ඒකට කරන්න දෙයක් නැහැ. ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්ව වගේ මේ තියෙන සභා දහනවයෙන් අපි තරම් විනිවිධ භාවයෙන් කවුරුවත් කටයුතු කරල නැහැ. අපි තමයි අඩු වියදමින් වැඩි ප්‍රතිලාභ මිනිස්සුන්ට අරගෙන දුන්නෙ. මට බලතල දීල තිබුනා සභාපතිගෙ බලතල ක්‍රියාත්මක කරන්න. වංචාවක් දූෂණයක් නොවෙන නිසා මාත් බය නැතුව ඒව කළා. ඒ නිසා මන්ත්‍රීතුමනි, මන්ත්‍රීතුමියනි, අපි සද්භාවයෙන් තමයි ඇත්තටම කටයුතු කළේ. ඒක දරාගන්න බැරි අය අපිට ගැහැවුවා. උප සභාපතිතුමනි, දැනුත් අපේ තරංග මන්ත්‍රීතුමා කිව්වෙ, අභ්‍යන්තරයේ වංචාවක් තියෙනවයි කියල හිතාගෙන. නැතුව මේ ක්‍රමවේදෙ වරදක් නෙවෙයි. එතුමාගෙ ප්‍රකාශය වෙන්නෙ මේකෙ දුන්නෙ කොහේටද? කාටද? ඒ කියන්නෙ බෙදල නැහැ කියන එක. නමුත් සත්‍ය විස්තරය එතුමා දන්නවා. මේ අවස්ථාවෙදි, සමහර සභාවල ලක්ෂ 30 – 40 වියදම් කරලා, තවම පඩි ගෙවා ගන්නත් බැරුව ඉන්නවා. නමුත් අපි හැමදේම නියමාකාරයෙන් සිදු කලත්, අඩුපාඩු වෙන්න ඇති. අඩුපාඩු නොවුනයි කියලා මම කියන්නෙ නැහැ. වැඩිපුර රුපියල් 69 කුත් භාර දීලා තියෙනවා. ඉතිං ලක්ෂ 10 යෙන් පහක් අරගෙන තමයි ඔය කටයුතු කලේ. අපි ඔක්කොම කරල නිලධාරින්ට බිල විතරයි දුන්නෙ. නිලධාරියෙක් ගෙන්න ගන්න බැහැ. අපිත් ජීවිතය පරදුවට තබලා වැඩ කළේ. මොකද කෝවිඩ් වසංගතය අපට හැදෙන්නෙ නැද්ද? ඒ අවධානම අරගෙන තමයි අපි වැඩ කළේ. අපිටත් ගෙදරට වෙලා ඉන්න තිබුණා. එහෙම කරද්දි මෙහෙම චෝදනා එනවනම්, හරි කණගාටුයි. මොකද හිටපු සභාපතිවරුත් හිටියා. සහබන්දු මහත්තයත් දන්නවා. අජිත් මහත්තයත් දන්නවා. යම්කිසි දෙයක් කලයි කියලා, අපි සතුටු වෙනවා. අලුත්වත්තට වතුර කොච්චර අරගෙන ගියාද? ඒ කාල සීමාවෙ හැම ප්‍රදේශයකටම වතුර බෙදලා දුන්නා. සුදු අලියෙක් කිව්ව බවුසරේ අපට වාසනාවක් වුනා. එකෙන් වතුර බෙදලා මිනිසුන්ට ලොකු සේවයක් කළා. අපේ මේ නාගොඩ සභාවෙන් විතර සේවයක් කොහෙන්වත් වුනේ නැහැ. ඒ වගේම එළවළු බීජ ගෙනැල්ලා බෙදුවා. දැන් ඒ

ඇට පැලවෙන්නෙ නැහැ කියලා සමහර මන්ත්‍රීවරු කියනවා. ජනතාවගෙන් නම් මට එහෙම අහන්න ලැබුනෙ නැහැ. මට කරන්න දෙයක් නැහැ. අපට කරන්න පුලුවන් දේ අපි කළා. මමත් ඒ දවස් ටිකේ සභාපති හැටියට හැම දවසකම ගෙදර යන කොට රෑ 2.00 – 3.00 වුණා. මොකද අපට දරු මල්ලො නැතුව නෙවෙයි. ඉතින් අපට මේ චෝදනා එන කොට ඇත්තටම කණගාටුයි. නමුත් කරන්න දෙයක් නැහැ.

ගව හිමියො ගැන කතා කළා. අපේ හැම මන්ත්‍රීවරයෙකුටම කියනවා. පුලුවන්නම්, තමන්ගෙ බල ප්‍රදේශයේ ඉන්න ගව හිමියන්ගෙ නාම ලේඛනය ලබා දෙන්න. මොකද මේ ගව හානිය නිසා ලොකු හානියක් සිද්ධ වෙනවා. ඒ සම්බන්ධව ප්‍රචාරණ කටයුතු කරල තියෙන්නෙ. ගව හිමියන් කැදව ගන්න ගව හිමියන්ගේ ලැයිස්තුවක් ඕන. ඒක කරුණා කරල පුලුවන්නම් ගෙනත් දෙන්න.

ඒ වගේම තමයි, වෙරංග මන්ත්‍රීතුමා කතා කළ උක්ඹිවිට පෙරපාසල පිළිබඳව මම කතා කළා. නමුත් ඒ මුදල් ආපසු අවිච්ඡේද විදිහට තමයි එයාල යවල තියෙන්නෙ. මොකද වැඩ පටන් ගෙන ඉවර කරගන්න බැරිවුන නිසා අවිච්ඡේද කරලා. ඒක වෙනස් කරන්න බැහැ. මම කිව්වා උක්ඹිවිට පෙරපාසලම තමයි එතනම උඩ කියලා. ඒ යෝජනාව අනුමත වුනේ නැහැ. නමුත් ආපහු මම පෙරේදත් ගිහිල්ලා අධ්‍යක්‍ෂ ජෙනරාල්තුමාට කතා කළා. සභාපතිතුමා ආපහු ඇපිල් එකක් කරන්න. කරන්න පුලුවන්ද කියල බලන්නම් කිව්වා. උඩ වහල හදා ගන්න දෙන්නෙ නැත්නම් කරන්න වෙන්නෙ පහළ පෙර පාසල් ගොඩනැගිල්ලෙ කළින් කරපු යෝජනාව තමයි. කරන්න තියෙන්නෙ ඒ ලක්‍ෂ තුණෙන් දෙපැත්තෙ බැම්ම බැදල දැල ගහන එක . ප්‍රතිපාදන ලැබෙන්නෙ නැත්නම්, ඒක අපිට අතහරින්නම වෙනවා. හැබැයි එකම යොජනාව උක්ඹිවිට පෙරපාසල සංවර්ධනය නිසා පොඩි චාන්ස් එකක් තියෙනවා.

ඒ එක්කම වෙරංග මන්ත්‍රීතුමා උඩුගම පොල පිළිබඳත් කතා කළා. උඩුගම පොළ භූමියේ ඉදි කරන ලද කඩ කාමරවල වහල පිළිබද මට කියන්න ඕන. වෙරංග මන්ත්‍රීතුමා, ඔබතුමා තමයි ඒ කටයුතු කළේ. ඔබතුමා ඉදිරි කටයුතු ගැනත් පොඩ්ඩක් අධීක්‍ෂණයෙන් ඉන්න. ඒ වගේම ගරු මන්ත්‍රීතුමා පොළ අසල තියෙන සුසාන භූමියේ මරණයක් වලලලා තිබුනා. ඒ සම්බන්ධව අපි දැනුවත් නැහැ. ඒක තහනම් වැඩක්. මම ඒ සම්බන්ධව කතා කළා. පර්මිට් අරගෙනද ඇහුවා. අරගෙන නැහැ. එය සම්පූර්ණ තහනම් වැඩක්. ඒක සභාවෙ සුසාන භූමියක්. සභාවෙන් අවසර ගන්න ඕන. ඒකෙ ලොකු වැරැද්දක් කරලා තියෙනවා. ඔබතුමන්ලා ඒක දැනගන්න ඕන. සභාවෙ සුසාන භූමියක මිහිදන් කරනවානම්, අනිවාර්යයෙන් සභාවට කියන්න ඕන. සභාවෙන් අවසර ගන්න ඕන. තමන්ට ඕන ඕන තැන වලදමන්න බැහැ. ඒකෙ ක්‍රමයක් තියෙනවා. ලේකම්තුමියට මම කියනවා අදාළ මරණකරුගේ ඥාතීන් දැනුවත් කොට ලිපියක් ලබා ගන්න කියලා.

ඊලගට සභාවේ සුසාන භූමි, උනන්විටියෙ එකක් තියෙනවා. ඒකත් වගා කරලා. නාගොඩ ප්‍රදේශයේත් සුසාන භූමියක් තියෙනවා. ඒකත් ඉඩම් වෙන් කරල අල්ලගෙන. මාපලගම, ඌරල ඔය හැමතැනම තියෙනවා. සභා බල ප්‍රදේශයේ වෙන් වෙච්ච ලියාපදිංචි සුසාන භූමි හදුනාගැනීම සඳහා ඉදිරියේදී වැඩපිලිවෙලක් සකස් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා, වැලිවිටිය, නාගොඩ පාර පිළිබඳව කතා කළා. පාර පුළුල් කිරීමේ කටයුතු පිළිබඳව දිසාපතිතුමිය දැනුවත් කරමු. නමුත් අඩි 10 ට කාපට් කිරීමේ යෝජනාව තමයි තියෙන්නෙ. තවද, යටලමත්තෙ ඉදල කිලෝ මීටර් පහමාරක් කාපට් කරන්න පටන් ගත්තා. ඊලගට අලුත්වත්තෙ ඉදල වරකපැල හේන බංගම පාර දක්වා කිලෝ මීටර් පහමාරක් කාපට් කරනවා. ඒක දැන් පටන් ගත්තා. ඊලගට අපේ පඤ්ඤාලෝක මාවත කිලෝමීටර් 2 ½ ක් , නාගොඩ ඉහල මුලන අන්නාසිගල හේන පාර කිලෝමීටර් තුනයි. තල්ගස්වල වතුපාරක් තියෙනවා. කෝවිල පාර ඒ යෝජනා දැන් කොන්ත්‍රාත්කරුවො අත්සන් කරල තියෙන්නෙ. බෙම්බඩ පාරත් ටෙන්ඩර්වලින් අරගෙන තියෙන්නෙ. මේ පාරවල් අරගෙන තියෙන්නෙ කුමාරගේ කන්ට්‍රක්ෂන් සහ තවත් ආයතනයක්. ගරු මන්ත්‍රීතුමන්ලා මේ කාපට් කරන පාරවල්වලට සපිරි ගමක් යටතේ අපේ යෝජනා දාල තියෙනවා. ඒව තියෙනවානම්, ඒව

වෙනස් කර ගැනීමේ හැකියාව තියෙනවා. ලක්රුවන් මන්ත්‍රීතුමා ඒ සම්බන්ධව ජනතාව දැනුවත් කරන්න. පාර කාපට් කරනවා. පාර පළල් කිරීම සඳහා අවශ්‍ය ඉඩම් ලබාදෙන්න කියලා. ඒ ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවන්න මුදල් නැහැ. දැන් අපේ කුරුපනාව පාර හදනවා. ඉඩම්වලට වන්දි ගෙවන්නෙ නැහැ. තාප්ප කැඩුනොත් ඒවා හදල දෙන එක විතරයි කරන්නෙ.

විශේෂයෙන්ම අනතුරුදායක ගස් ප්‍රශ්නය නිසා මම දැඩි අපහසුතාවයකට පත් වෙලා ඉන්නෙ. සමන් මන්ත්‍රීතුමාගෙ ප්‍රශ්නෙට නම් දැන් වැඩකටයුතු සිදුවෙනවා. ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ප්‍රධානීන් වෙත අනතුරු දායක ගස් ඉවත් කිරීමේ පොදු දැනුවත් කිරීමට අදාලව දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ, එකී ලිපියෙන් වැලිගම ප්‍රාදේශීය සභාව වගඋත්තර කරුවෙකු කරමින්, මාතර දිසා අධිකරණයේ විභාග වූ නඩුවට අදාල තීන්දුවේ පිටපතක් අපට එවලා තියෙනවා. එකී තීන්දුවට අනුව, සභාපතිට වන්දි ගෙවන්න වෙලා තියෙනවා. මේවත් එක්ක තමයි අපිට යන්න වෙලා තියෙන්නෙ. දැන් මම කල්පනා කළා ගෙවල් සැලසුම් අනුමත කරන්න සභාවට යොමු කරන විට, මීටර් 50 ක් විතර ඈතින් තියෙන ගසුත් කපාගෙන එන්න කියලා කියන්න. මොකද ගේ හදනවා. ඊට පස්සෙ අනතුරුයි කියනවා. මේ ප්‍රශ්නෙත් ඒ වගෙයි. උඩුගම ගෙපල කපල තියෙනවා. ගස් දෙකක් තියෙනවා. දැන් ගේ හදනකොට අනතරුදායකයි. ඒවා පෞද්ගලික අමනාපකම් නමුත් ඒවට කරන්න දෙයක් නැහැ. මම ගියා බලන්න ඉතිං ඒ අය ගහ කපන්න බැහැ කියනවා. අපි කපන්න ගියොත් වන්දි ගන්න ඕන. වන්දි ගන්න නඩු යන්න ඕන. අදාල දෙපැත්තම අය ගෙන්වලා, ගහ කප්පවන්න අපි හුගාක් උත්සාහ ගන්නවා. කොහොම හරි එයාලටම කියල කප්පවන්න, නියෝග දීලා, ලියුම් ගහලා ඔක්කොම කරලා තියෙන්නෙ. අන්තිමට එයාලා පොලීසි යනවයි කිව්වා. මම කිව්වා පොලීසි යන්න කියලා. දැන් එයාල පොලීසියෙදි පොරොන්දු වෙලා තියෙනවා. ගහ කපා ගන්නම් කියලා. ගහ කපන දවසෙදි අපේ නිලධාරියෙක් එවන්නම් කියලා මම කිව්වා. ඊලගට දූරියන් ගහටත් ඒ වගේ තමයි. දූරියන් ගහ එල් ආර් සී එකෙන් දැන් ගහ අයිතිකරුට යවපු තක්සේරු වාර්තාවට අනුව, තක්සේරු කරන්න එක්දහස් අටසිය ගණනක් යනවා. අර අහිංසක ආච්චිට තමයි ඒ එක්දහස් අටසිය ගණන ගෙවන්න වෙලා තියෙන්නෙ. ඒ වගේම සුභාෂි මන්ත්‍රීතුමිය කියපු පොල් ගහ අනතුරුදායකයි. හැබැයි මේ ගස නිසා අනතුරුදායක තත්වයට පත්වුන මනුස්සයගෙ ගේ අයිනෙත් පොල් ගසක් තියෙනවා. එයාටත් අනතුරුදායකයි. නමුත් ඒක ප්‍රශ්නයක් නැහැ. දැන් අනතුරුදායක ගස අයිතිකරු කියනවා. එහෙනම් සභාපතිතුමා, මේ ගහ අනතුරුදායක නම්, එයාගෙ ගේ අයිනෙ තියෙන ගහ කොයිතරම් අනතුරු ඇද්ද කියලා. නමුත් ඒක ප්‍රශ්නයක් නැහැ. ඔන්න ඔය වගේ මහා අමුතුම පෞද්ගලික හිත් අමනාපකම්වලට මේ කටයුතු කරන්නෙ. සුභාෂි මන්ත්‍රීතුමිය, දුරකතන අංකය අරගෙන එයාට කියන්න කරුණාකරලා ගහ කපන්න කියලා. අපි ලියුම් දැම්මා. ගස් කපන කොට ක්ෂණිකව කපන්න බැහැ. විධිමත් ක්‍රමවේදයකට යන කොට, පරක්කු වෙනවා. මේ නිලධාරි ගිහිල්ලා බලන්න ඕන. නිලධාරින්ට නිතරම යන්නත් බැහැ.

ඒ වගේම සිරිසද ගල් කොරිය පිළිබඳව දුරකතනෙන් දැන් කීප වතාවක් කතා කළා. ඒ පිළිබඳවත්, ඒ වගේම පස් කපන එකයි, පස් ප්‍රවාහනයේදී පාර පුරා පස් වැටෙන එක සම්බන්ධවත්, දිසාපතිතුමිය දැනුවත් කරන්න කටයුතු කරනවා. ඒ වගේම එම ස්ථානයේ ගස් ප්‍රශ්නයකුත් තියෙනවා. මම කිව්වා හෙට නැත්නම් අනිද්දා සභාවෙන් ගහ කප්පවනවයි කියලා. පොලීසියත් එක්ක ගිහිල්ල මම ඒක කරවනවා. කවුරු වුනත් කමක් නැහැ. නඩුවක් දාලා අය කර ගන්නවා. වෙන කරන්න දෙයක් නැහැ. මොකද හැම තිස්සෙම මම බැලුවෙ දෙපැත්තටම සාධාරනය ඉටු කරන්න. අන්තිමට කුනුගොඩ එන්නෙ මට. ඒ වගේ තමයි නාගොඩ අපේ ගේ පිටිපස්සෙ ගල් කොරියෙන් අපේ ගෙදරටත් හානියි. පෞද්ගලිකව අපි කතා කළේ නැහැ. ඊට පස්සෙ ගල් ප්‍රවාහනය කරලා කොන්ක්‍රීට් පාර විනාශ වුනා. මිනිස්සු මට බනිනවා. පෙත්සම් ආවා. මම දෙගොල්ලන්ම සමාදාන කරලා, ගලුත් ඕන නේද කියලා ඒ කටයුත්ත කරද්දි, එයාල අඩි පහට විදින්න ඕන බෝර අඩි දහය දොලහ කරනවා. නමුත් අපට පෞද්ගලිකව වෙනත් ප්‍රශ්න ඇතිවෙන නිසා දරාගෙන හිටියා. පහුගිය කාලෙ මිනිස්සු මෙතනට ඇවිල් පෙත්සම් දුන්නා. ප්‍රාදේශීය ලේකම් භූ විද්‍යා එක දැනුවත් කල විට

භූ විද්‍යා කාර්යාලයෙන් ඒ සම්බන්ධ පරීක්ෂණයකට ආවට පස්සෙ මමත් ගියා. ගල් කොරියෙ අයිතිකරු කියනවා. සභාපතිතුමා ඉල්ලපුව දුන්නෙ නැති හින්දයි සභාපතිතුමා මෙහෙම කරන්නෙ කියලා. මං බැලුවා මොකක්ද මේ කියලා. බැලින්නම්, මම දවසක් මෙයාට කිව්වා. සභාවෙ පාරෙ ගල් ප්‍රවාහනය කරන නිසා පාර ඩැමේජ් වෙන නිසා අපිට පුලුවන් සභාවෙ යෝජනා කරලා කිලෝමීටර් 1 කට, ලක්ෂ 20 ක ඩිපොසිට් තියා ගන්න. ලක්ෂ 20 ක ඩිපොසිට් එකක් තියා ගන්න ඕන කියලා කිව්ව නිසා තමයි මේ මනුස්සය මම සල්ලි ඉල්ලුවයි කියලා කියන්නෙ. මට හරි වේදනාවක් ආවා කොහොම හරි එදත් ඒක සමථයකට පත් වුනා. නැවත පරීක්ෂණයක් තියන තුරු අඩි පහට බෝර ගහන්න අවසර දුන්නා. ග්‍රාම නිලධාරී සමග තුන්දෙනෙකුගෙ කමිටුවකුත් පිහිටුවන්න කිව්වා. දවස් තුනක් ගියේ නැහැ. බෝර ගහල අපේ ගෙදරට පිටිපස්සෙ ගෙදරක වහලට ගලක් වැටිලා. වෙලාව හවස පහ පහුවෙලා බෝර ගහන කොට ග්‍රාම නිලධාරි එතනට ආවා. එයා ඉන්න කොටත් 5.26 ට බෝරයක් පත්තු කළා. මට දැන් එක එක්කෙනා කතා කරනවා. මම කිව්ව බැහැ. කරන්න දෙයක් නැහැ. නීතිය ක්‍රියාත්මක වෙයි. මොකද සාධාරණව කරන්න ගියාම. ඒකට විරුද්ධව වැඩකටයුතු කළා කියලා මට විරුද්දව ලක්ෂ 50 එන්තරවාසියක් එවල තියෙනවා.

ඊලගට මේ පියල් මන්ත්‍රීතුමාලගෙ වැඩේට, සිසිර සර්විස් එක ළඟ කාණුව සුද්ධ කරපු එකට මට නඩු දාලා. ඊට පස්සෙ එයා සභාවට ආවා. මම කිව්වා කරන්න දෙයක් නැහැ. ඔයාල නඩු දාලනෙ තියෙන්නෙ. ඒක ඔයාල ඒ විදිහට කරන්න. මම දන්නෙ නැහැ. ඔයාල නඩු යන්න මට වෙන කරන්න දෙයක් නැහැ කියලා. හෙන ගහන්න කියල බෝඩ් ගහලත් තිබුනලු. ඔන්න ඔය වගේ ප්‍රශ්නත් එක්ක තමයි අපි දැන් ගැටිල ඉන්නෙ. ජීවිතේට උසාවියකට නඩුවකට ගිහිල්ලත් නැහැ. නඩුවක් වැටිලත් නැහැ. නමුත් දැන් නඩු වැටෙනවා. දෙපැත්තටම සාධාරණය ඉටු කරන්න ගිහිල්ල තමයි අපිට මේ හැමදේම වෙන්නෙ. නමුත් කරන්න දෙයක් නැහැ.

වනමල් මන්ත්‍රීතුමා කියපු මුලන වාඩියකන්ද පාරෙ බොක්කුව පිළිබදව සොයල බලල යථා තත්වයට පත්කරන්න කටයුතු කරන්නම්. ඇත්තටම වප් මගුල් උත්සවය පිළිබඳ කතා කරන්න අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා හිටිය නම් හොදයි. එදා මමත්, ධර්මසිරි මන්ත්‍රීතුමත් වප් මගුල් උත්සවයට ගියා. මේක එයාල කරන විදිහට තමයි එතන කතා කළේ. නමුත් එයාල උනන්දු වෙලා වැඩේ කළා වෙන්න පුලුවන්. ආණ්ඩුකාරතුමත් ගියා. මේ රජයේ මුදල් වැය කරලා තමයි ඔය කටයුතු කරන්නෙ. නමුත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා කතා කරන්නෙ එයාල දෙන විදිහට, ගෙදරින් ගෙනත් දෙන විදිහට. එතුමා හිටිය නම් හොදයි ඒක කියන්න

ඒ වගේම සභා බල ප්‍රදේශයේ පාරවල් කාපට් කිරීම සදහා දැන් ටෙන්ඩර් කෝල් කරමින් ටෙන්ඩර්කරුවො ගන්නවා. අපි ඉල්ලුම් කරපු සියළු පාරවල්වල වැඩ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතිනවා. අපි ඉල්ලුම් කරපු ප්‍රමාණයටත් වඩා වැඩි ප්‍රමාණයක් ඉටුවෙයි කියලා අපේ දැඩි විශ්වාසයක් තියෙනවා. ඊලගට පාලම් එක්දහස් ගණනක් එනවා. ණය ආධාර ක්‍රමයක් යටතේ අපේ බල ප්‍රදේශයටත් අවශ්‍ය යම් පාලම් ප්‍රමාණයක් ලබාගන්න ඉදිරියෙදි අපට පුලුවන් වේවි. ඒ නිසා ඇත්තටම අපට සතුටු වෙන්න පුලුවන්. වැඩ කොටසක් සිදු වෙයි මේ වසංගතයෙන් ඇත්තටම මිදෙන්න ඕන. ගරු මන්ත්‍රීතුමන්ල ඇත්තටම අපි අපිම මේක ස්වයංව විවේචනය කර ගන්න ඕන. දැන් අපිම බලන්න අපිම නීති පිළිපදින්නෙ නැහැ. ඇතුලට එන කොට මුඛ ආවරණ දාගන්න, අත් සෝදගන්න කියලා බොඩ් නම් ගහලා තියෙනවා. මේ වසංගතය තවම ඉවර නැහැ. ඉන්දියාවෙ තියෙනකම් අපට විශ්වාසයක් නැහැ. මොකද අපිත් හිතනවා කන්දකාඩු පුනරුත්තාපන මධ්‍යස්ථානයට කොරෝනා රෝගියෙක් ගිහින් දැම්මද කියල දන්නෙ නැහැ. මොකද මුලු ලංකාවෙම කට්ටිය යන්නෙ එතනට. හොද දෙමව්පියන්ගෙ දරුවනුත් යනවා. ගමේ දෙමව්පියන්ගෙ දරුවනුත් පුණරුත්තාපනය කරන්නෙ එම මධ්‍යස්ථානයේ. ඔය දරුවො බලන්න දෙමව්පියන් යනවා. ලංකාවෙ වටේම කට්ටිය ඉන්නවා. හරි ප්‍රවේසමෙන් අපි කටයුතු කරන්න ඕන. ඒ නිසා අපේ මන්ත්‍රීවරුත් දැනුවත් කරන්න. දැනුවත් වෙන්න. අතිගරු ගෝඨාභය මැතිදුන්ගෙ නිසි නායකත්වය උඩ තමයි මේක මර්ධනය කර ගන්න පුලුවන් වුනේ. නමුත් දැන් චුට්ටක් ව්‍යාප්ත වෙලා තියෙනවා. නමුත් ඒකත් ක්ෂණිකව මර්ධනය

වෙනවා. මර්ධනය කරනවා. අපි උනන්දු වෙලා, නිරෝධායන නීති රීතිවලට යටත් වෙලා කටයුතු කරමු. නිරෝධායන නීති තවම ගැසට් කරල නැහැ. සෞඛ්‍ය අංශය විසින් ලබාදෙන උපදෙස් අනුව අපි අදාල දැනුවත් කිරීම් කරන්නම්.

ඒ වගේම අපේ ලේකම්තුමිය, අපි ආයුර්වේදයට, පුස්තකාලවලට සින්ක් ඕඩර් කළා. කරුණාකරලා ඒවා ඉක්මණින් සවි කරන්න කියන්න. ගරු වෙරංග මන්ත්‍රීතුමා, මාර්ග නීති කැඩීම පිළිබඳ කටයුතු කරන්න තියෙන්නෙ පොලීසියේ රථවාහන අංශයට. රථවාහන අංශයෙන් පොලිස් අධිකාරි, පොලිස් ස්ථානාධිපති, කියලා බෝඩ් ගහනවා. අපට තියෙන්නෙ බර සීමාවන් පැනවීම වගේ ඒවා. මේකත් අපට අතහරින්න බැහැ. අපටත් කරන්න පුලුවන්. නමුත් පොලිස් ස්ථානාධිපතිගෙන් තමයි ඒක වෙන්න ඕන. අපිට පොලිසිය දැනුවත් කරන්න පුලුවන්. අපි දැනුවත් කරන්න ඕනත් නැහැ. එයාල ඒ කටයුතු කරන්න ඕන. ලේකම්තුමිය, ඒකත් ලිපියක් මගින් දැනුම් දෙන්න මෙහෙම සභාවෙ කතා කළා, ඒ සම්බන්ධව පියවරක් ගන්න කියලා. එහෙම නම් අද කාලය බොහොම ඉක්ම ගියා. ඒ එක්කම වනිගරත්න මන්ත්‍රීතුමත්, විලේගේ මන්ත්‍රීතුමත් අද නිවාඩු ලබා ගන්නා බව දන්වා තියෙනවා. විශේෂයෙන්ම කතා කරන්න ඕන අද අරුණ ශාන්ති මන්ත්‍රීතුමියගෙ අඩුපාඩුව. ගිය වතාවෙ ඉල්ලා අස් වුනා අද එතුමියට සභාවට ආවනම්, එන්න තිබුනා. තවම ඒ වෙනුවට කෙනෙක් නම් කරල නැහැ. ඒ වගේම ඉදිරියෙදි අලුත් ආණ්ඩුවක් යටතේ, අලුත් අග්‍රාමාත්‍යවරයෙක් යටතේ, ගෞරවණීය තුනෙන් දෙකේ බලය සහිත අලුත් පාර්ලිමේන්තුවක් යටතේ, හිනිදුම ආසනේ සම්පත් අතුකෝරල මැතිතුමා, ඉසුරු දොඩංගොඩ මැතිතුමා ඇතුලුව ගාලු දිස්ත්‍රික්කෙන් මන්ත්‍රීවරු 07 ක් සමග නව රජයක් යටතේ ඉදිරි සභාව පැවැත්වීමට බලාපොරොත්තු වෙමින්, අද පැමිණි ගරු මන්ත්‍රීතුමන්ලට, මන්ත්‍රීතුමියන්ලට ස්තූති කරමින් සභාව මින් නිමාවට පත් කරනවා. සියලු දෙනාට සුබ අනාගතයක් .

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                    දිනය:- .............................